

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2022 මැයි 04 වන බදාදා
දෙවන කාණ්ඩය විසිදෙවන කලාපය
මිල රු. 70 යි

## ටයි කෝට් ඇඳපු කොලඹ හතේ මහත්වරුන් සරමට බැස්සූ සුදු නෝනා

## කසිප්පු ටිකක් බී බජව්වට සෙට් වෙන සක්‍ර දෙවියන්ගේ යාළුවා

## ගණන් උස්සපු සබන් විකුණමුද ගෙදරම හදන්?

## ඉන්දියාවේ ගෑණු මෝදිවත් ගෙදර යවයිද?

## ග්‍රහයට ඕන වෙලාවට ළමයි හදන්නනම් ඇයි මාව බැන්දේ?

සැමියෙකු ප්‍රශ්න කරයි

## ලප වැඩි වුණොත් මූණේ ඇපත් නෑ නෝනේ

## ගමේ තාලෙට උයන්න කැමති අයට

ආචාර්ය පබිලිස් සිල්වාගේ කෑම වට්ටෝරු පොතක් නොමිලේ...

**ධරණී** ශ්‍රී ලංකාවේ **අංක එකේ** කාන්තා පුවත්පත

ගායන ශිල්පිනී
විශාරද **සෂිකා නිසංසලා**

■ ඡායාරූපය - ප්‍රදීප් දඹරගේ



# ඉන්දියානු විලාසිතාවට හැඩවූ මනාලියක්





ඉන්දියානු විලාසිතාවලට කැමති යුවතියන් වෙනුවෙන් අද 'ධරණී මනාලිය' ඉදිරිපත් කරන්නේ මහබාගේ සැලෝන් සප්නා රූපලාවණ්‍ය ආයතනයේ සප්නා කාදර් විසිනි. අපි බලමු රශ්මි හා සංබගේ විවාහයේ අසිරිය කොහොමද කියලා.

**"කුඩා සිරුරක් හිමි මනමාලිය ඉන්දියන් ආකාරයට හැඩගැන්වූයේ ඇයගේ සුන්දරත්වය ඉස්මතු කරන්නමයි. විශේෂයෙන් ඉන්දියානු මනාලියක් පෝරුවට වගේම පල්ලියටත් ගැලපෙනවා.**

සාරිය නිර්මාණය කරලා තියෙන්නේ සොෆ්ට් මැටීරියල් එකකින්. සාරියේ තියෙන ඩිසයින් එක අත්වලට යොදලා ජැකට් එක ප්ලේන් ආකාරයට තිබ්බා. එහෙම කළේ ජැකට් එක ඉස්මතු වෙන්න. ජැකට් එකේ කර ඇතුළට වෙන්න කපලා හාට් එකක් ආකාරයට සකස් කරලා තියෙනවා. ජැකට් එක අත් දිගට දැම්මේ මනාලිය පුංචි සිරුරක් තියෙන කෙනෙක් නිසා.

බිමට නොගෑවෙන ආකාරයට උකුල දක්වා තමයි වේල් එක දැම්මේ.

කොණ්ඩා මෝස්තරයත් හරිම චාම් එකක්. නමුත් කොණ්ඩයට ගෝල්ඩ් හා බාර්ගන්දි මිශ්‍ර කරලා කලර් කළේ කැපී පෙනෙන බවක් ඇති කරන්නමයි.

මාලේ තරමක් පරණ විලාසිතාවක් අනුව අලුත් ආකාරයට නිර්මාණය කළා. මාලය සඳහා භාවිතා කළේ හීන් පබළු වර්ගයක්.

මල් කළඹ සඳහාත් ස්වභාවික මල් සහ පබළු භාවිතා කරලා තියෙනවා.

මනමාලිය පුංචි නිසා පෝසි බොකේ එකක් නිර්මාණය කළා.

මේකප් එක ගැන කතා කරනකොට ඇයට බොහොම සරල මේකප් එකක් භාවිතා කළේ. අයි මේකප් එකට සිල්වර් භාවිතා කළේ පෙනුම තවත් වැඩි කරන්න හිතාගෙන. ඇගේ ඇස් දෙක ලොකු නිසා හොඳ ඉඩකඩක් තිබුණා ඇස් දෙක මේකප් කරන්න.

අවසානයේ ආකර්ෂණීය මනාලියක් නිර්මාණය කරන්න හැකියාව ලැබුණා."



**සාරිය නිර්මාණය කරලා තියෙන්නේ සොෆ්ට් මැටීරියල් එකකින්**

**වේල් එක තට්ටු තුනක් ආකාරයට නිර්මාණය කරලා තියෙනවා**

**ජැකට් එක අත් දිගට දැම්මේ මනාලිය පුංචි සිරුරක් තියෙන කෙනෙක් නිසා**

**කොණ්ඩයට ගෝල්ඩ් හා බාර්ගන්දි මිශ්‍ර කරලා කලර් කළේ කැපී පෙනෙන බවක් ඇති කරන්න**

**මල් කළඹ සඳහාත් ස්වභාවික මල් සහ පබළු භාවිතා කරලා තියෙනවා**



මනාලිය හැඩගැන්වීම - රූපලාවණ්‍ය ශිල්පිනී
**සප්නා කාදර්**
සැලෝන් සප්නා
මහබාගේ



ඡායාරූප -
**නලීම් කමලඩීන්**

සම්බන්ධීකරණය -
**ක්‍රිෂාන්ත පුෂ්පකුමාර**
0763113839




# අරගල භූමියේ සිටින නංගිලා වෙතටයි

**රත්තරන් නංගියේ,**

යුක්තිය, සාධාරණය ඉෂ්ට කරන්න කියලා පාරට බැහැපු උඹලා රෙදි ඇඳගෙන නිරුවත් වෙනවා බලාගෙන ඉන්න බැරි තැන මේ කතාව කියන්න ඕන කියලා හිතුණා. ඒ කාලෙ, ඒ කියන්නේ එක්දස් නවසිය විසි ගණන්වල කොළඹ මියුසියස් විද්‍යාලයේ ඉගෙනගත්තු කෙල්ලො අතරේ හරි හිතුවක්කාර, මුරණ්ඩු කෙල්ලෙක් හිටියා. නාහෙට නාහන ගති තිබුණාට මොකද ඒ කෙල්ල තමයි ඒ කාලෙ ඉස්කෝලෙ ඉඳපු දක්ෂම ශිෂ්‍යාව. කොච්චර දක්ෂද කියනවානම් ටීචර් පන්තියට නොඑන දවසට පන්තියේ අනිත් ළමයින්ට උගන්වන වැඩේ පැවරිලා තිබිලා තියෙන්නෙත් මේ ළමයට. ඒ වෙන කවුරුත් නෙවෙයි ලංකාවේ වාමාංශික දේශපාලන ව්‍යාපාරය ශක්තිමත් කරන්න අරගල කරපු රතු සෙන්පතිනිය විදියට හැමෝම අඳුන්වපු විවියන් ගුණවර්ධන.

මං අහලා තියෙන විදියට මියුසියස් බාලිකාවේ එදා මෙදාතුර ඉතිහාසයේ විශේෂයෙන්ම ප්‍රාථමික අංශයේ ශිෂ්‍යාවකට ලැබුණු ලොකුම දඬුවම ලැබිලා තියෙන්නේ විවියන්ට. ඒ තමයි උදේ ඉස්කෝලෙ පටන්ගත්ත වෙලේ ඉඳලා ඉස්කෝලෙ අරින වෙලාව වෙනකල් වේදිකාව මැද දණගහගෙන ඉන්න එක.

ඔය කියපු දවස ඇවිල්ලා මියගිය අධිරාජ්‍යවාදීන් අනුස්මරණය කරන්න යොදාගත්තු දවසක්. එදාට මුළු රටම විනාඩි පහකට නිහඬ වෙලා කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ඒ ගෞරවය දක්වන්නම ඕන. ඉතින් මේ නිශ්ශබ්දතාවය ආරම්භ කළ යුතු බව අඟවන සයිරන් නළා හඬ ඇහෙද්දි විවියන් ඉඳලා තියෙන්නේ ඉස්කෝලෙ. හැබැයි මේ කෙල්ලට හිතට එකඟව පර දේශක්කාරයන්ට නම්බු දෙන වැඩේ කරන්න බැරිවෙලා. මොකද පිලිප් ගුණවර්ධන සහ රොබට් ගුණවර්ධන කියන මාමලා දෙන්නගෙන් ඒ වෙනකොටත් මේ දැරිවි අධිරාජ්‍යවාදීන්ට එරෙහිව රට රටවල මිනිස්සු පෙලගැහෙන විදිය, අරගල කරන විදිය ගැන විස්තර ඇති පදමට අහලා තිබුණු නිසා.

ඒ නිසා එදා අර විනාඩි පහේ නිහඬතාවය මැද්දෙ එකපාරටම හරි අමුතු වැඩක් වුණා. ඒ තමයි විවියන්ගේ කවකටු පෙට්ටිය ගිහිල්ලා පන්තියේ කළුලෑල්ල ඉස්මත්තේ නතර වුණු එක. නිකන්ම නෙවෙයි මහ විශාල හඬකුත් එක්ක. ඉතින් සුද්දෙන්ට ගරු නම්බු දෙන නිහඬතාවය එදා ඒ විදියට විවියන් මියුසියන් එකේදි බිඳලා දැම්මා. ඒ වැරැද්දට දඬුවම විදියට තමයි ඇයට පැය ගාණක් දණ ගහගෙන ඉන්න වුණේ.

අද උඹලගෙ අරගල භූමියට එන ගායිකාවෝ, නළු නිළියෝ හඳුන්වන්න ප්‍රවීණ, ආදරණීය, සදාදරණීය කියන වචන පාවිච්චි කළාට අදටත් විවියන්ගේ නමට ඉස්සරහින් ගොඩක් වෙලාවට වැටෙන්නේ පෙරළිකාර, කැරලිකාර, විප්ලවකාර වගේ වචන. ලංකා සම සමාජ පක්ෂයේ ආරම්භක සාමාජිකාවක් වෙච්ච විවියන්ගෙ අරගලවලට අරමුණක් තිබුණා. ඒ තමයි

**බිම පෙරළලා කකුලෙනුත් පෑගුවම මොන ගෑනිටද ඉවසන්න පුළුවන්? හැබැයි විවියන් එක ප්‍රශ්නයයි ඇහුවේ. ඒ තමයි "උඹටත් අම්මා කෙනෙක් ඉන්නවද?" කියලා**

**මම කියන්නෙ උඹලා මේ අරගලය කරන්නම ඕන. හැබැයි හරි විදියට. උඹලගේ වචන පාලකයින්ට රිදෙන පිහිතුඩු වගේ ඒවා වුණාට කමක් නෑ. හැබැයි ඒවා කුණුහරුප වුණාම ටිකක් අවුල්**

**සැබෑ කාන්තා විමුක්තිය කියන එක ඇතුළෙ තවත් කෙනෙක්ව තලා පෙලන එක හෝ රිදවන එකක් නෑ. එහෙම කරනවා නම් එතැන තියෙන්නේ පිරිමහගන්න බැරිවුණු ඇරියස් එකක්**

වමේ දේශපාලන ව්‍යාපාරය ශක්තිමත් කරන එක. හැබැයි නංගියේ මතක තියාගනින්, ඒ එක අරගලයකවත් මේ වගේ කුණුහරුප ලියපු බෝඩ් තිබුණු බවක් අපි අහලා නෑ.

ඒ වගේ එක මාර්තු 8 වෙනිදා දවසක, ඒ කියන්නේ ජාත්‍යන්තර කාන්තා දින දවසක ඇමරිකානු තානාපති කාර්යාලයට විරෝධතා ලිපියක් භාරදීලා සාමකාමීව එන අතරතුර කොල්ලුපිටියේදී පොලිසිය මාධ්‍යවේදියෙක්ව හිතුමනාපේ අත්අඩංගුවට ගත්තා. ජේ.ආර්.ජයවර්ධන මහත්තයා තමයි ඒ කාලේ රටේ ජනාධිපති. ඉතින් කිසි වැරැද්දක් නැතුව අත්අඩංගුවට ගනිපු අර කොල්ලව බේරගන්න පොලිසියට ගියාම පොලිස් නිලධාරියෙක් විවියන්ව බිම පෙරලලා ඇයව පාගලා අත්අඩංගුවට ගත්තා. එහෙනම් විවියන්ටත් එදා හොඳටම ඉඩකඩ තිබුණා පොලිසියට සුද්ද සිංහලෙන් කතා කරන්න. බිම පෙරළලා කකුලෙනුත් පෑගුවම මොන ගෑනිටද ඉවසන්න පුළුවන්? හැබැයි විවියන් එක ප්‍රශ්නයයි ඇහුවේ. ඒ තමයි **"උඹටත් අම්මා කෙනෙක් ඉන්නවද?"** කියලා. ඊටපස්සෙ ඇය ඒ අවනඩුවට විරුද්ධව සාධාරණයක් ඉල්ලලා ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ඒ කාලේ හැටියට රු.2500ක වන්දියකුත් ගත්තා. විවියන්ව පාගපු පොලිස් නිලධාරියට ඊට පස්සෙන්දා ජේ.ආර්.උස්සවීමක් දීපු එක වෙනම කතාවක්.

මම කියන්නෙ උඹලා මේ අරගලය කරන්නම ඕන. හැබැයි හරි විදියට. උඹලගේ වචන පාලකයින්ට රිදෙන පිහිතුඩු වගේ ඒවා වුණාට කමක් නෑ. හැබැයි ඒවා කුණුහරුප වුණාම ටිකක් අවුල්. ඥාණා අක්කගේ මිථ්‍යාවට අපිත් විරුද්ධයි. හැබැයි ඒ ගෑනිගෙ ජීවනෝපායට විරුද්ධ වෙන්න අපිට අයිතියක් නෑ.

ලිංගික වෘත්තියේ යෙදෙන ගණිකාවකට වුණත් 'ලිංගික ශ්‍රමිකයා' කියලා ගරු නම්බු දීලයි අපි කතා කරන්න පුරුදු වෙලා තියෙන්නෙ. එහෙව් එකේ උඹලගෙ සටන් පාඨවල ඥාණක්කගේ අසවල් ප්‍රදේශය ගැන ලියලා තියන හැටි දැක්කම නම් හරි අප්‍රසන්නයි.

අනිත් එක උඹලා එක්ක ඔය අරගලේට පෙලගැහිච්ච ගොඩක් ගෑනු පහුගිය ටිකේම කාන්තා විමුක්තිය ගැන කතා කරපු අය. හැබැයි මතක තියාගනින්. සැබෑ කාන්තා විමුක්තිය කියන එක ඇතුළෙ තවත් කෙනෙක්ව තලා පෙලන එක හෝ රිදවන එකක් නෑ. එහෙම කරනවා නම් එතැන තියෙන්නේ පිරිමහගන්න බැරිවුණු ඇරියස් එකක්.

ඒ නිසා රත්තරන් නංගියේ, ගෙදර ඇඳේදි බේරගන්න බැරිවෙච්ච ඇරියස් අරගල භූමියට අරගෙන එන්න එපා. එතකොට උඹලා කොච්චර හැඩට ඇඳලා හිටියත් අපිට පේන්නේ උඹලා හෙලුවෙන් වගේ.

**සුරා**








# මේ ජරමර අස්සෙ දරුවන්ට මන්දපෝෂණය හැදුනොත් මොන දෙයියන්ට කියන්නද?



චතුමිණී පුතුගේ කෑම පෙට්ටිය දෙස බලාගෙන කල්පනා කළේ ඔහු ඉල්ලන විදියට කටට රසට කෑමක් හදදෙන්නට කවද හැකිවේදැයි සිතමිනි. පුංචි එකාගේ මූණ එළිය වැටෙන්නේ බැදපු සොසේජස් කරලක්, එහෙමත් නැත්නම් මාළු පෙත්තක්වත් තිබුණු විටය.

**“මොකද ළමයෝ කෑම පෙට්ටිය දිහා බලන් භාවනා කරන්නේ? නිවිතියි පරිප්පුයි කියන්නේ නරක දෙයක්යෑ. අද ඔය බිත්තරේකුත් තියෙන්නේ.”**

**මන්දපෝෂණය ඇති වුණොත් දරුවා නිසි පරිදි උස යන්නේ නැහැ. බරත් අඩු වෙනවා. ඉගෙනුම් මට්ටමටත් එය බලපානවා**

චතුමිණීගේ කල්පනාව දුටු නැන්දම්මා කීවේ තොල පිට පෙරලමිනි. පෞද්ගලික ආයතනයක සුළු රැකියාවක් කරන සැමියාගේ ආදායම අද ජීවන බර හා ගලපාගන්නට කිසිසේත්ම බැරි බව චතුමිණීට රහසක් නොවේ. වත්තේ කොළ පළා වර්ගත්, පොල් ගස් දෙක තුනක පොලුත් ඇති නමුත් අනෙක් සියල්ල සපුරාගත යුතුව තිබුණේ සැමියාගේ වැටුපෙනි.

එය කාලයකට කලින් ගෙදර ඕනෑ එපාකම් පිරිමසා ගන්නට හැකි මුදලක් වුවද අද ඒ මුදලින් හැරෙන්නටවත් බැරිය. මේ වනවිට පරිප්පු කිලෝ එකම රුපියල් පන්සියයේ කඩුල්ල පැන ගොස් ඉවරය.

**“හැදෙන ළමයෙකුට හොඳට කන්න දෙන්න ඕනනේ අම්මේ. අනික දරුවා සොසේජස්, මස් පෙත්තක්, මාළු පෙත්තක් බැදලා දෙනවට කැමතියි.”**

චතුමිණී කීවේ නැන්දම්මාගේ හිත නොරිදෙන්නටය.

**“ඒක මං දන්නවා දරුවෝ. ඉස්සර අපේ අම්මලා වත්තේ පිටියේ තියෙන කොළ ජාති හතර පහක් එකතු කරලා කොටලා උදේට හොඳ කැඳ එකක් හදනවා. ඒක බීලා තමයි අපි ඉස්කෝලේ ගියේ. ඒ ගියහම නම් ඉස්කෝලෙන් ඇදිහස බිස්කට් අටකුත් දුන්නා. සමහර දවස්වලට අම්මලා ඉස්කෝලෙටම ඇවිත් කැඳ හරි බත් හරි හදලා ළමයින්ට දුන්නා.”**

එදද ඒ සියල්ල කරන්නට ඇත්තේ හැදෙන වැඩෙන දරුවෙකුගේ පෝෂණ මට්ටම හොඳින් පවත්වා ගැනීම වැදගත් වන නිසාය. ඒ නිසි පෝෂණය නොලැබුණහොත් දරුවාගේ ශාරීරික වර්ධනය පමණක් නොව බුද්ධි වර්ධනයටද එය බලපාන බැවිනි. විශේෂයෙන්ම වයස අවුරුදු පහට අඩු දරුවන්ගේ ආහාර වේල ගැන සැලකිලිමත් වීමට මේ අත්‍යවශ්‍යම කාලයකි.

ශ්‍රී ලංකා පෝෂණවේදී සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය රේණුකා ජයතිස්ස ඒ ගැන දැක්වූයේ මෙවන් අදහසකි.

**“පෙරපාසල් හා පාසල් වයසේ දරුවෝ කියන්නේ පෝෂණය නිසි පරිදි ලැබිය යුතු කොටසක්. රටේ පවතින වත්මන් ආර්ථික ගැටලු හමුවේ ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ දුෂ්කරතාවන් බොහෝදෙනකුට ඇති බව ඇත්තක්. එම දුෂ්කරතාවන් නිසාම දරුවන් මන්දපෝෂණයට ගොදුරු වීමේ අවධානමක් පවතිනවා. විශේෂයෙන්ම එවන් දරුවන් උස යාමේ අඩුවක්, වයසට අනුව නියමිත බර ප්‍රමාණය නොමැති වීම මෙන්ම ලෙඩරෝගවලට පහසුවෙන් ලක්වීම, නිසි අධ්‍යාපන දක්ෂතා දක්වන්නට නොහැකි වීම ආදී ගැටලුවලට ලක්විමේ වැඩි ඉඩකඩක් පවතිනවා.**

**මන්දපෝෂණය කියන වචනය නිවැරදිව විග්‍රහ කළොත් ඉන් අදහස් වන්නේ සෞඛ්‍යමත් දේහ ක්‍රියාකාරිත්වයක් පවත්වා ගැනීමට ප්‍රමාණාත්මක පෝෂ්‍ය පදාර්ථ නොලැබී යාමේ තත්ත්වයකුයි. එයට ආර්ථික දුෂ්කරතා හෝ වෙනත් කාරණා බලපෑ හැකියි. මේ නිසා සෑම මවක් පියෙක්ම මෙම කාරණා ගැන සැලකිලිමත් වීම අවශ්‍යයි.”**

මෙහිදී නිසි පෝෂණය සහිත ආහාරවේලක් යනුවෙන් අදහස් කරන්නේ පිඟාන පිරෙන්නට ලොකු බත් එකක් නොවේ. බත් හැන්දකුත් ඒ හා සමානව එළවළු වර්ග දෙකක්, කොළ මැල්ලුමක්, හාල්මැස්සන්/කුණිස්සන් දැමූ ව්‍යංජනයක් හෝ මාළු කෑල්ලක් දරුවෙකුගේ පෝෂණ අවශ්‍යතා සපිරෙන්නට කාරණයකි.

**කොළ පළා වර්ගයි, කොළකැඳයි දරුවන්ට ගුණයි**

එහෙත් අද බොහෝ දෙමාපියන්ට මෙම ආහාර වේල සපුරාගැනීම ගැටලුවකි. විශේෂයෙන් දීර්ඝ කාලයක් තිස්සේ, අදාළ ප්‍රමාණයට පෝෂ්‍ය පදාර්ථ හා සංඝටක සහිත ආහාර වේලක් නොලැබීමේ ප්‍රතිඵලය මන්දපෝෂණය නිසාම අපිට එය සුළුවෙන් තැකිය නොහැක්කකි.

**“දෛනිකව දරුවෙකුගේ ආහාරවේලට එක්විය යුතු කැලරි ප්‍රමාණයක් තියෙනවා. අම්මලා තාත්තලා හැටියට දරුවෙකුගේ සිනා මුහුණ තමයි ඔවුන්ගේ බලාපොරොත්තුව වෙන්නේ. ලෙඩක් දුකක් නැතුව, ඉගෙනුම් දක්ෂතා සහිතව පෞරුෂවත් දරුවෙක් නිර්මාණය වෙන්න එයාට ලැබෙන නිසි පෝෂණය ඉතාම වැදගත් බව පුන පුනා කිව යුතු නැහැ.**

**කොහොමද එතකොට අපි වර්තමාන තත්ත්වය හමුවේ මේ අවශ්‍යතා සපුරා ගැනීම කරන්නේ? මොකද මොන බැරෑරුම්කම තුළ වුවත් අපට මේ වගකීම පැහැර හරින්න බැහැ. මේ තත්ත්වය කොහොම යථාවත් වේවිද කියලා අපිට කියන්නත් බැහැ. ඒ නිසා ආහාර ගැටලුවට අපේ ගෙවත්තෙන් විසඳුම් සොයන්න පටන්ගන්න අපට පුළුවන්. කෘත්‍රිම ආහාරපාන වර්ග හැකිතාක් අවම කරලා, දේශීය ආහාර වර්ගවලට යොමුවීම කළ හැකියි.**

**පුළුවන් තරම් ගෙවත්තේ ඉඩ තියෙන අය එළවලු ටික, කොළ පළා ටික වත්තෙම වගා කරගැනීම වැදගත්. දැනට ඒ ටික කරගත්තොත් අපි ප්‍රමාද නැහැ. ඒ වගේම තව කෙනෙකුට පුළු පුළුවන් ලෙස උදව් කිරීම අපි අමතක නොකළ යුතු ගුණාංගයක්.”**

ඒ වාගේම ඇය පෙන්වා දුන් තවත් කාරණයකි. ඒ ගර්භණී මව්වරුන්ද සෑමවිටම නිසි පෝෂණයෙන් යුත් ආහාරවේලක් ලබාගත යුතු බවයි. ඊට හේතුව නම් දරුවෙකු ලැබෙන්නට සිටියදී මව පෝෂණ ගැටලුවලට මුහුණ දිමෙන් සිදුවන්නේද අඩු බර හා කෘශ බවින් යුත් දරුවෙක් බිහිකරන්නට සිදුවීමයි. අදාළ දරුවා උපත් ආබාධ සහිත වීමටද ඉඩ ඇති බැවින්, ගර්භණී මවක් සපුරාගත යුතු දෛනික පෝෂණ අවශ්‍යතා ගැනද අවධානය යොමු කිරීම වැදගත්ය.

ඉකුත් වසරවල පෝෂණ දර්ශකයෙන් ශ්‍රී ලංකාව හොඳ ස්ථානයක සිටියත්, දැනට පවතින තත්ත්වය තුළ එම ප්‍රතිඵලය වෙනස්වීමට ඉඩ තිබේ.

**“අපි දන්නවා මේ මොහොතේ හැමදෙනාටම අමාරුයි. ඒත් එහෙමයි කියලා අපිට මේ ප්‍රශ්නවලින් ගැලවිලා යන්න බැහැ. අපි කතාවටත් කියනවා හොඳම දේ දරුවන්ට කියලා. ඉතින් මිල වැඩි දේවල් දරුවන්ට දෙන්න මේ කාලය නොවෙන්න පුළුවන්.**

**ඒත්, හැකි පමණින් දරුවාගේ පෝෂණ මට්ටම ගැන හිතලා ආහාරවේල පිළියෙල කරන්න. දරුවෝ, ගැබිනි මව්වරු වගේම ගෙදර වැඩිහිටියෙක් ඉන්නවානම් මේ කාරණා එයාලටත් අදාළයි. මොකද අවිධිමත් හා ප්‍රමාණාත්මක නොවන ආහාර රටාව ඔවුන්ටද පෝෂණ ගැටලු ගෙන දෙනවා.”**

ඇය පෙන්වා දුන්නේ වත්තේ පිටියේ වැවෙන ගස්ලබු, කෙසෙල්, පේර, වෙරළු වැනි පලතුරු ගස් යට පරවෙනවා වෙනුවට හැකි පමණින් ආහාරයට එක්කර ගැනීමෙන් විටමින් අවශ්‍යතා කිහිපයක් සපුරාගත හැකි බවයි. එපමණක්ද නොවේ. ඔබේ ගෙවත්තේ ගොටුකොළ පඳුරක් සිටුවන්නට ඉඩක් වේ නම් ඒ ඉඩ හිස්ව නොතබන්න. අමාරු කාලයන් ජයගත හැක්කේ අමාරුවෙනි. ඒ කාලය තුළ හැදී වැඩී සමාජගත වන ඔබේ දරුවා සැබෑ ශක්තිවන්තයෙක් කළ හැක්කේද එවිටය.



ශ්‍රී ලංකා පෝෂණවේදී සංගමයේ සභාපති
විශේෂඥ වෛද්‍ය රේණුකා ජයතිස්ස

දීපා වසන්ති එදිරිසිංහ

ඇනුමන් බැරි නැතුවත් බැරි
පිංකි!
සංඛ සඳරුවන්

# හත්තිලව්වයි! අපේ කොම්පැණියේ නම එයිට් බ්‍රදර්ස්



කොණ්ඩ කිරිල්ලී තම ආසනයේ වාඩිවී සිටියේ අපහසුවෙන්. ඇය ගැබිනි කතක්. එහෙත් ඇගේ රබර් කන් දෙක දිගු වුණේත්, ටෙලස්කෝප් දෙනෙත් කැරකුණේත් කුමක් හෝ ඕපාදූපයක් සොයාගෙන අන් අයත් සමඟ රස කර කර කියන්නයි.

**"මේකි මෙච්චර අමාරුවෙන් ඉඳලත් ඕපදූප හොයන හැටි"**

සිතමින් පිංකි ඇය අසලට ගියා.

**"ඔයාට අමාරුද කෙල්ලේ?"**

පිංකි කොණ්ඩියේ හිස පිරිමැද්දා.

**"ඔව් අනේ! බඩේ ඉන්න චූටි තඩි ටැටූ පැටියා පයින් ගහනවා. හරිම විසේ! අප්පා වගේ නැතෑ"**

කොණ්ඩි අපහසු එහෙත් දඟකාර සිනහවක් පෑවා.

**"ඒක නෙවෙයි අනේ! ඔයා දන්නවද වැඩක්?"**

පිංකි පැවසුවේ දෙනේත දෙඹු කරමින්.

**"මොකක්ද ඒයි!"**

**"මගේ කසින්ගේ වයිෆ්ට බැබෙක් ලැබෙන්න හිටියනේ"**

පිංකි අමුතු සිනහවක් පෑවා.

**"ඉතින්? බබා ලැබුණද?"**

**"හොඳ බබා! එක බබෙක් නම් මදෑ! දෙන්නෙක්ම ලැබුණා. ට්වින්ස්ලා!"**

**"අනේ වාසනාවන්!"**

කොණ්ඩ කිරිල්ලිගේ මුහුණෙ ඇතිවුණේ සුන්දර සිනහවක්.

**"ඒක නෙවෙයි වැඩේ. ඒ කෙල්ල වැඩ කරන්නේ 'ට්වින්ස්' කොම්පැණියේ! ලැබුණෙත් ට්වින්ස්ලා."**

මොහොතකින් සිදුවූයේ නොසිතූ දෙයක්. කොණ්ඩි බියෙන් සලිත වී සිහිනැතිව පුටුව මත ඇද වැටුණා! පිංකි ඇගේ මුහුණට වතුර ඉස, අමාරුවෙන් කොණ්ඩිගේ සිහිය ගත්තා.

**"මොකද කෙල්ලේ වුණේ? යමුද ඩොක්ටර් කෙනෙක් ළඟට?"**

**"එපා! ඔ... ඔයාගේ කසින්ගේ වයිෆ් වැඩ කළේ ට්වින්ස් කොම්පැණියේ කිව්වා නේද?"**

කොණ්ඩ කිරිල්ලී විමසුවේ බියෙන් ඇඟ සලිත කරමින්.

**"ඔව්."**

**"ලැබුණේ ට්වින්ස්ලා නේද?"**

**"හරියටම හරි."**

**"අපේ කොම්පැණියේ නමේ විදියට මටත් බබාලා ලැබුණොත්....? දෙවි හාමුදුරුවනේ!"**

**"ඒ මොකද බං?"**


පිංකි විමසුවේ අන්දමන්ද වෙමින්.

**"ඇයි යෝදියේ! අපේ කෝම්පැණියේ නම එයිට් බ්‍රදර්ස් නේ!"**

කොණ්ඩි නැවතත් සිහි නැතුව පුටුව මත ඇද වැටුණා.




# ටයි කෝට් ඇඳපු කොළඹ හතේ මහත්වරුන් සරමට බැස්සූ සුදුනෝනා



බාබරා සන්සෝනි

**මැෂින් අයින් කරලා අතින් වැඩ කරන්න ගත්තේ, මැදපෙරදිග රැකියාවලට යන කාන්තාවන්ට දේශීය රැකියා අවස්ථා ඇති කරන්නයි**



**මහා පරිමාණ ව්‍යාපාරිකාවක් වෙන්න ඇයට අවශ්‍ය වුණේ නෑ**



**"බාබරා, අපේ ළමයි හැමදාම රෙදි වියනවා. ඒත් ඒ වියන රෙදිවල කිසිම කලඑළියක් නෑ. මේකට මොනවා හරි කරන්න පුළුවන්ද?"**

1958 වසරේ දවසක **'ගුඩ් ෂෙපඩ්'** කන්‍යාරාමයේ ප්‍රධාන කන්‍යා මව්තුමිය කළ ඒ ඉල්ලීමෙන් පසු බාබරාට හරි අපූරු අදහසක් පහළ විය. ඒ කන්‍යාරාමයේ දැරියන් වියන රෙදි වර්ණ ගැන්වීමටයි. චිත්‍ර කලාවට උපන් හපන්කම් තිබුණු ඇයට එය කිසිසේත්ම අමාරු කාරියක් වුණේ නැත. අපේ දේශීය රෙදි විවීමේ කලාවට සුදු නෝනා කෙනෙකු අතින් බැබළෙන වර්ණ එකතු වෙන්නට පටන්ගත්තේ එහෙමය.

**"අතින් වියන රෙදි ඕන දෙයක් අපිට පුළුවන් මේ විදියට දීප්තිමත් වර්ණවලින් නිර්මාණය කරන්න. හැමවිටම අලුත් දෙයක් හිතන එකයි වැදගත්. ඒකෙන් අපේ මොළය වර්ධනය වෙනවා."**

බාබරා රෙදි වියන තරුණියන් දිරිමත් කරන්නට නිතර නිතර කී කතාවකි ඒ. ඒ අතර ඇය සොබාදහමේ අපූර්ව දර්ශනද රෙදි විවීමේ කලාවට එකතු කළාය. එතෙක් රෙදිපිළි කලාවේ නොදුටු අංගයක් වූ ඊට ඉහළ ආකර්ෂණයක් මෙන්ම හොඳ ඉල්ලුමක්ද නිර්මාණය විය.

මේ අතරතුර බාබරා සුදු නෝනා තවත් අලුත් වැඩක් ගැනද සිතුවාය. ඒ තමා දන්නා දේ ගමේ ගොඩේ උන් දුප්පත් ගැහැනුන්ට කියාදී ඔවුන්ගේ අතටත් කීයක් හෝ ලැබෙන කුඩා ආදායම් මාර්ගයක් තනාදීමටයි.

ඇය **'බෙයාර්ෆුට්' (Barefoot)** ව්‍යාපාරය ආරම්භ කළේ ඒ අදහසත් ඇතිවය. ඒ හරහා ඇයට අවශ්‍ය වූයේ ග්‍රාමීය ආර්ථිකය සහ ගෘහාශ්‍රිත කර්මාන්ත නඟා සිටුවීම වෙනුවෙන් රෙදිපිළි කර්මාන්තය තුළ දැවැන්ත පෙරළියක් කිරීමටය. එහෙත් කිසිදු කොතැනක හෝ ව්‍යාපාරිකාවක් ලෙසින් තමන්ව හඳුන්වා ගන්නට ඇය අකමැති වූවාය.

බෙයාර්ෆුට් වහල යට විකිණුනේ ඈත ගම්දනව්වල දිවි ගෙවූ අඩු ආදායම්ලාභී කාන්තාවන් අතින් වියෙන ගෙතෙන මැහෙන නිර්මාණයන්ය. එවන් ඇඳ ඇතිරිලි, තිරරෙදි ආදිය බොහෝවිට ගිහින් නතරවුණේ ඒ ගැමි ගැහැනුන්ට යන්නට බැරි මෙරට තරු පන්තියේ හෝටල්වලය.

මේ අතරතුර වරක් දැවැන්ත නූල් හිඟයක් රටේ ඇතිවිය. ඒ වනවිටත් සංචාරක හෝටල්වලට තම රෙදිපිළි ලබාදෙමින් සිටි නිසා බාබරාට එය විශාල ගැටලුවක් විය. නූල් හිඟ වුණා කියා වැඩ නවත්තන්නට බැරිය. ඒ නිසා ඇය තනිවම මෝටර් රථය පදවාගෙන පිටකොටුවට ගියාය. එහි ගොස් බොම්බයි ලූනු බහාලන ගෝනි මිලට ගෙන එම ගෝනි ලිහා ඒවායෙන් මෝස්තර වියිවාය.

රෙදි විවීම ගැන එකල සමාජයේ එතරම් ඉහළ පිළිගැනීමක් නම් නොවේ තිබුණේ. එය පහත් වෘත්තියක් බවයි බොහෝදෙනාගේ මතය වුණේ. නමුත් බාබරා සුදු නෝනා නම් ඒ ගැන කවදත් කතා කළේ මහ ඉහළිනි.

**"රෙදි විවීම සරල නෑ. ඒක ඉස්තරම් කර්මාන්තයක්. මොළය වර්ධනය වන රැකියාවක්. නූලෙන් නූලට අදින එකේ පටන් එක බීම් එකකට ගේන එක, අතරමඟදී නූල් කැඩුනොත් පැටලුනොත් ආපසු එය යථා තත්ත්වයට පත්කරගන්න එක වගේ රෙදි විවීම කියන්නේ සංකීර්ණ දෙයක්. ඒ වගේම හොඳ ඉවසීමක් හොඳ නුවණක් තියෙන්න ඕන, ප්‍රශ්න විසඳගෙන නූල් ගොඩකින් කරන මේ විස්කම කරන්න."**

ඒ යුගය මෙරට කාන්තාවන් අතිබහුතරයක් මැදපෙරදිග රැකියාවලට යන්නට පටන්ගත් කාලයයි. වැලිකතරේ අනේක දුක් විඳින්නට යන ඒ අහිසංක ගැහැනු ගැන බාබරාගේ හිතේ තිබුණේ අප්‍රමාණ අනුකම්පාවකි. ඒ නිසා ඇය බෙයාර්ෆුට් ආයතනයේ ඔවුන්ට රැකියා අවස්ථා ඇති කළාය. ඒ එහි රෙදි වියන, ඩයි කරන, මහන ගොතන වැඩ හැමදේම මැෂින්වලින් වෙනුවට අතින් කිරීමට යෝජනා කරමිනි. පිටරට නොගොස් මෙරටදීම යම් ආදායමක් උපයාගන්නට අඩුආදායම්ලාභී කාන්තාවන්ට තම ආයතනය හරහා අවස්ථාවක් සලසාදීම ඇගේ එකම අරමුණ විය.

**"ඒ දේවල් අතින් කරන තරමට රස්සා වැඩි වුණා. අදටත් අපේ බෙයාර්ෆුට් ඇඳුම් සහ නිර්මාණ 80%ක්ම නිමවෙන්නේ අතින්."**

බාබරා සුදුනෝනා ඇරඹූ රෙදිපිළි කලාව අද ජාත්‍යන්තරයට ගිය ව්‍යාපාරයකි. නමුත් හැටේ දශකයේ ඇරඹූ එම ව්‍යාපාරය ඇය පවත්වාගෙන ගියේ මහා පරිමාණ ව්‍යාපාරයන් ලෙසින් නම් නොවේ.

**"කුඩාවට තියෙන තරමට වටිනාකම වැඩියි. මේක කලාවත් එක්ක යන දෙයක්. අපි මෝස්තර නිර්මාණ කරන්නේ අපේ නියමිත වෙලාව අරන්."**

එසේම ඇය හුදෙක් ලාභය ගැන සිතා කටයුතු කළ චරිතයක්ද නොවේ. ඇයට කවදත් අවශ්‍ය වූයේ ගුණාත්මක අතින් ඉහළ නිමැයුමකි.

**"අපි පාරිභෝගිකයා නොගැළපෙන වර්ණ යොදන්න කියන කිසිවක් බාරගන්නේ නෑ. එකම මෝස්තරය එකම වර්ණය දිගින් දිගටම වියන්න ගන්නෙත් නෑ."**

එසේම එදා කොළඹ නෝනා මහත්වරුන් ඇන්දේ පැළැන්දේ ඉංග්‍රීසි පන්නයේ ඇඳුම් පැළඳුම්ය. සරම, කමිසය, ලුංගිය, කුර්තාව ඔවුන්ට ඒ හැටි හිතට ඇල්លුවේ නැත. එවැනි පසුබිමක කොලඹ තරු පහේ හෝටල්වල පැවති ප්‍රියසාද, මඟුල්තුලා ආදියට ඇඳගෙන යා හැකි ආකාරයට සරම්, ලුංගි ආදිය නවීකරණය කර අලුත් ආරෙකට හඳුන්වා දුන්නේ බාබරාය. ඇය කොළඹ අහස යට හැදූ ඒ රැල්ල අදටත් වලංගුය.

සෞන්දර්යාත්මක ජීවන චාරිකාවක නියැලුණු බාබරා සන්සෝනි 1928 අප්‍රේල් 22දා ඉපදුණේ මහනුවරය. සුදු ජාතික යුවළකට දාව ඉපදුණු බාබරා තුරන්ව ගිය වටිනා කියන කර්මාන්තයක් වර්ණවලින් ගොඩගත් ගැහැනියකි. තම ජීවිතයෙන් වැඩිකලක් වර්ණ සහ රෙදිපිළි කලාව සමඟ ජීවත්වුණු ඈ පසුගියදා ඒ ජීවන චාරිකාව නිමකළේ අනූදෙවෙනි වියේදීය.

ඇය නොසිටින්නට රෙදි විවීමේ අපේ ඉපැරණි දේශීය කර්මාන්තයක් වළපල්ලට ගොස් මේ වනවිටත් බොහෝ කල්ය. ඉතින් අපේ දේ රැකගනිමින් දේශීයත්වය වර්ණගැන්වූ ඇයට සුව නින්දක් වේවායි අපි ද ප්‍රාර්ථනා කරමු.

රුවන් එස්.සෙනවිරත්න

# අතේ ඇඟිලි නැවීමේදී වේදනාකාරී ද? නිවැරදි විසඳුම



**සමාජයේ වැඩිහිටි පාර්ශවයේ බොහෝ විට මෙය දකින්න ලැබෙනවා. ඇඟිල්ල නවන්න බැහැ ලොක් වෙලා වගේ තියෙනවා. මෙය අපි ඇඟිලි අගුල් වැටීම හෙවත් Trigger Finger ලෙස හඳුන්වනවා.**

**බොහෝ දෙනෙක් හිතන්නේ හේතුව ඇඟිල්ල කියලයි.මෙහි හේතුව හරියාකාරව අපි දැනුවත් වීම ඔබට නිසැක සුවය කරා ගෙන යනවා.**




රජයේ හිටපු ප්‍රධාන හෝමියෝපති නිලධාරිනී වෛද්‍ය අනුෂා හේමකුමාර

## හේතු සාධක

ඇඟිල්ලට තරමක් ඇතින් පිහිටලා තිබෙන මේ මාංශ පේශිවල ක්‍රියාකාරිත්යව, ඇඟිල්ල නැමීම හා දිගහැරීම සඳහා භාවිතා කරනු ලබන්නේ සවිමත් සිහින් කම්බියක් මෙන් වටකුරු කේබල් එකක් මගිනුයි. මෙය අපි කන්ධරාව හෙවත් ටෙන්ඩන් ලෙස හඳුන්වනවා. මාංශ පේශිවල ක්‍රියාකාරිත්වයේදී මෙම කේබලයක් වැනි කන්ධරාව මගින් ඇඟිල්ල නැමීම හා දිගහැරීම සිදුකරනවා. මෙම කන්ධරාව හෙවත් Tendon එක ක්‍රියාකරන්නේ කිසියම් කොපුවක් වැනි රවුම් ආවර්තයක් තුලය. ඇඟිලි අගුල් වැටිම වන්නේ මෙම කන්ධරාව වටා ඇති කොපුව තුල කන්ධරාව සිරවීමය. ප්‍රතිඵලය වන්නේ තම කොපුව තුල පහසුවෙන් එහා මෙහා යාමට නොහැකි වී නවපු ඇඟිල්ල දිගහැරීමට නොහැකි වීමය.

මෙහිදී වඩා බලපෑමක් ගෙන දෙන්නේ

- අත්ල පමණට වඩා තද කරන ක්‍රියාවල නිරත වුවන්ට.
- ඉස්කුරුප්පු නිතරම භාවිතා කරන අයට.




## රෝග ලක්ෂණ

- ඇඟිලි පූර්ණව නැමීමට නොහැකි වීම.
- ඇඟිලි නැමීමේදී තදවීම (අගුල් වැටීම)
- වේදනාකාරී වීම.අත්ල දක්වාම පැතිරීම.
- ඉදිමීම.
- මූලිකව එන ඇඟිල්ල පටන්ගෙන අනෙක් ඇඟිලිවලටත් ලොක්විම (අගුළු වැටීම) සිදුවිම.

## හෝමියෝපති ප්‍රතිකාර

මෙහිදී වේදනාවට පමණක් ප්‍රතිකාර සිදුවීම පූර්ණ සුවයක් නොලැබීම හේතු වනවා හෝමියෝපති ප්‍රතිකාර රෝග මූලයට ප්‍රතිකාරය සිදුවීම අත්ලෙහි කොපුව තුළ හිරවූ කන්ධරාව ලිහිල් වී එහා මෙහා කිරීමට හැකියාව ගෙන දෙනවා.එමගින් වේදනාව නැතිවී පූර්ණ සුවයක් ලැබීමට හේතු වනවා. මෙහිදී රෝගියාට දැනෙන රෝග ලක්ෂණ වලට අනුගත කරන හෝමියෝපති ඖෂධ එම මූලධර්මයට අනුව දුර්වල ප්‍රතිශක්තිකරණ සමග ඇති වූ ව්‍යූහාත්මක වෙනස යථා තත්ත්වයට ඇති කිරීමට සමත් වනවා. මෙම ප්‍රතිකාර ක්‍රමයේ ඇති විශේෂත්වය එයයි.

එක ඇඟිල්ලකින් පටන්ගත් අගුළු වැටීම අනෙක් ඇඟිලි වලටත් යාමට පුළුවන. බොහෝ විට සිදුවන්නේ වේදනාවට ප්‍රතිකාර ක්‍රම සොයා අවසානය සැත්කම් කිරීමට සිදුවීමයි. ඇතැම් අවස්ථාවන්හි අප නොදැනුවත්වම අනෙක් ඇඟිලිවලටත් බලපෑමක් වීමට තිබෙන හැකියාවද මෙම ප්‍රතිකාර ක්‍රමයේදී නැතිවී යාමද යහපත් ක්‍රියාකාරිත්වයකින් යුක්ත නම්‍යශීලිභාවය ගෙනදීමද සිදුවීම.එහි පූර්ණ සුවයයි. හෝමියෝපති ඖෂධීය ගුණයෙන් යුක්ත ආලේපන (ආතරයිටික් කියෝ ) භාවිතයද එහි අන්තර්ගත ඖෂධ වල සුවිශේෂී ක්‍රියාකාරිත්වයද අගුල් වැටීම යථා තත්ත්වයට ගෙනඒමට මහත් ලෙස උපකාර වනවා. අභ්‍යන්තරව හෝමියෝපති ඖෂධ ගැනීම,බාහිරව ආලේපන සිදුකිරීම තුළ සැත්කම් වලින් තොරව ඉක්මන් පූර්ණ සුවය ලැබීම ඇඟිලි අගුල් වැටිමෙන් පීඩාවිඳින කාහටත් මෙය සුවිශේෂී ප්‍රතිකාර ක්‍රමයක් මෙන්ම සමාජ සත්කාරයක් වනු ඇත.

සටහන ජේ. ඒ. සී ශාන්ත කුමාර



එච්.කේ.හෝමියෝපති හෙල්ත් කෙයාර් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ්
නො.12, පි.බී. අල්විස් පෙරේරා මාවත, කටුබැද්ද, මොරටුව.
0112 637740 / 0112 637741
071 8250716 / 071 8250717

“නැණවත් වනිතාව සිය පවුල ගොඩනගන්නීය”

දෙවසරකින් හතලිස් තුන්ලක්ෂයක් ඔබට උපයාගන්න

දැන් පුළුවන් - සහතිකයි.

★ උයන්නත් පුලුවන් ඔබ කුවේයිට් රටේ ගෘහ පාලන සේවයට යන්න, - (රු. 170,000 ට වැඩි වැටුපක්)
මුදලේ අගය විනිමය අනුපාතය අනුව වෙනස් වේ

★ මෙතෙක් පිටරටක සේවය නොකළ කෙනෙක්නම්, ඔබට ට්‍රේනිං මොබයිල් (ඔන්ලයින්) තාක්ෂණය මගින්

★ පාස්පෝට් නැතත් ඔබ ග්‍රීන්වේ ඒජන්සීස් කාර්යාලයට

එන්න.!

දින 20න් ගුවන් ගමන්

0778/Advt/16/22

මෙහේ., රක්ෂණයත්, ආරක්ෂාවත්, ගුවන් ටිකට් පත් හා වෛද්‍ය පරීක්ෂණයත් ඔබට නොමිලේ.!
එහේ., වෛද්‍ය පහසුකම්, ආහාර නවාතැන් ආරක්ෂාව හා රක්ෂණයත් ඔබට නොමිලේ..!!

කාර්යශූර සේවයත් තිරසාර වගකීමත් - එදාමෙන් අදත්, අදමෙන් හෙටත්
ජනතා විශ්වාසය හා ජනහද දිනන., ඔබ අසා ඇති සිත් දිනාගත් ඔබේ

ග්‍රීන්වේ ඒජන්සීස් - කුරුණෑගල

037 7 100 100
075 1 100 100

# හිත ඇවිලෙන හැම වෙලාවකම නිවෙන්න හේතු ගෙදරින් හොයාගන්න

**පුද්ගලික සම්බන්ධතා ගත්තත්, රාජකාරි මට්ටමේ සබඳතා ගත්තත් බොහෝවිට අපි පුරුදුවී සිටින්නේ අගය කිරීමට හෝ ප්‍රශංසා කිරීමට වඩා චෝදනා කිරීමටයි. එසේත් නැතිනම් මැසිවිලි නැඟීමටයි. එම සබඳතා නිසා සතුටු වෙන්නට කාරණා සියයක් ඇතත්, පසුතැවෙන්නට ඇති එක් කාරණාවක් හෝ මුල් කරගෙන අපි කරන්නේ සියල්ල අවුල් කරගැනීමයි.**

**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**



හැම සතියකම සිකුරාද කියන්නේ මගේ සතුට වැඩිවෙන දවසක්. ඒ වෙන දෙයක් හින්ද නෙවෙයි, සතිඅන්තේ එන නිසා. බැරිවෙලාවත් එහෙම සතිඅන්තෙකට පස්සෙ එන සඳුදත් නිවාඩු නම් මම ඉන්නෙ ඉහේ මල් පිපිලා වගේ. ගිය සුමානේ සඳුදත් නිවාඩු දවසක් හින්ද සිකුරාද මම හිටියෙ පුදුම සතුටකින්. දවස් තුනක්ම නිවාඩු නිසා අපි එළියට යමු කියලා මම පැටව් තුන්දෙනාටත් කිව්වා.

ඉතින් මේ කියන සිකුරාද දහම් ඔෆිස් එකෙන් එන්න වෙනදට වඩා පරක්කු වුණා. ඔෆිස් එකෙන් එළියට ආපු ගමන් කෝල් එකක් අරන් **"දැන් බබා වැඩ ඉවර වුණේ, මම එනගමන්"** කියලා, තවත් කතාවක් කියන්න ලෑස්ති වුණා. **"ඔයාට කියන්න තව දෙයක් තියෙනවා, බිස්නස් ට්‍රිප් එකක් සෙට් වුණානේ... හෙට උදෙන්ම යන්න ඕනේ"** දහම් ඔය වචන ටික කිව්ව ගමන් මගේ සැලසුම් ඔක්කොම **කඩන් වැටුණා වගේ මට දැනුණේ. මට එවලේ තද කේන්තියක් ආවාත් මං ඒක පිට කළේ නෑ.**

**"උදේ 6.30ටවත් ගෙදරින් යන්න ඕනේ. පොඩි අය නිදි කරවන්න එපා මං එනකන්. මං උදෙන් යද්දි එයාලා නිදිනේ"** කියලා දහම් කියද්දී මම **"හ්ම්"** කියලා විතරක් කිව්වා. මට ඕන වුණේ ඒ කතාව ඉක්මනට ඉවර කරලා ෆෝන් එක තියන්න. ඒ වෙන මොකුත් නිසා නෙවෙයි මට හිතුණා මගේ කටින් ඕන නැති දෙයක් පිටවෙයි කියලා. ඊටත් වඩා මං හිටපු නොසන්සුන්තාවය දහම්ට දැනෙන්න දෙන්න මට ඕන වුණේ නෑ. ඉතින් මම ෆෝන් එක තියලා ඇස් පියාගෙන පොඩ්ඩක් හිටියා. කේන්ති ගියාම මං දැන් කරන්නෙම ඒක. එහෙම ඉඳිද්දී මට මගේ නොසන්සුන්කම නිවාගන්න හොඳම හේතු හොයාගන්න පුළුවන් කියලා මං අත්දැකීමෙන්ම දන්නවා. ඒ වෙලාවෙත් දහම් ගැන ආපු කේන්තිය අඩු කරගන්න නිවීසැනසිල්ලේ මං හේතු හෙව්වා. හෙව්ව ඉක්මනට මට ඒ හේතු හම්බුණා. දහම් දන්නේ නෑ මං එළියට යන්න සැලසුම් කළා කියලා. අනික එයාගේ රස්සාවේ විදිය මං නොදන්න දේකුත් නෙවෙයිනේ. මේ වගේ දේකට මූණ අවුල් කරගෙන හෙට උදේ යන්න ඉන්න දහම්ව අවුල් කරන්න මට ඕන වුණේ නෑ. ඉතින් දහම් ගෙදරට එද්දී මගේ මූඩ් එක හරි. උදෙන්ම නැඟිටලා **"දරුවොත් පරිස්සමෙන් බලාගෙන ඔයත් පරිස්සමෙන් ඉන්න"** කියලා නළලත් ඉඹලා ගෙදරින් දහම් පිටත්වුණා.

පස්සේ ආයෙමත් මගේ හිතට නොසන්සුන්කමක් ආවා. කලින්ද හම්බුණ හේතු මට මදි වගේ. ඒත් දරුවෝ එක්ක ඉඳිද්දී හිත නොසන්සුන් කරගෙන ඉන්න බෑ. ඒ නිසා මං පැයක් විතර ඉඳලා දහම්ට කතා කළා. **"දැන් කොහෙද මහත්තයා?"** කියලා මං අහද්දී, **"ටෝකියෝ ස්ටේශන් එකේ. ට්‍රේන් එක එනකන් ඉන්නේ"** දහම් කිව්වාම, මං ආයේම කිව්වා **"සඳුදත් නිවාඩු නිසා මං එළියට යන්න හිතුවේ අපි ඔක්කොම ඔයාට ඔහොම යන්න වැටෙයි කියලා හිතුවේ නෑ"** කියලා. මගේ සාමාන්‍ය කතාවේ අසාමාන්‍ය ගතිය දහම්ට හොඳට දැනෙනවා.



**කිසිම දේකට උත්තර හොයන්න ඇවිලිලා හරියන්නේ නෑ**

**මගේ සැනසීම මොකක්ද, මගේ සතුට මොකක්ද කියලා අද මං දන්නවා**

දහම් හරි නිස්කලංකව කතා කරන්න ගත්තා **"රෝසි මාත් හිතන් හිටියේ එහෙම, ඒත් මේක එකපාරට යන්න කිව්වේ."** ඊට අමතරව එහෙම එකපාරටම යන්න වුණ විශේෂ හේතුවත් එයා මට පැහැදිලි කරලා කිව්වා. එහෙම ගියාම ලැබෙන අත්දැකීමත් මට තේරෙන විදියට කියලා දුන්නා. දහම් කරන රස්සාවේ වටිනාකම මං දන්නවා. එයා මට එච්චර ආදරෙන් ඒ ගැන තේරුම් කරද්දිත්, තවදුරටත් කතාව ඇදන් ගිහින් එයාටත් පීඩනයක් දීලා මාත් පීඩනේකින් ඉන්න ඕන නැති බව මං තේරුම්ගත්තා.

ඒ නිසා මගේ සැලසුම් අමතක කරලා මම දරුවෝ එක්ක සතුටෙන් ඒ දවස් තුන හිටියා. වැඩත් වෙනදට වඩා හොඳින් කරගත්තා. හැමදේටම වඩා මං සතුටු වුණේ මගේ කේන්තිය පාලනය කරගන්න පුළුවන් වුණු එකට.

දවස් දෙකක් ගෙවිලා, දහම් කිව්වාම පහුවද ආපහු ගෙදර එනවා කියලා, ඒ දවස පටන් ගත්ත වෙලේ ඉඳන් මං හිටියේ ඒ සතුටෙන්. දහම් එහෙම ටික දවසකට වැඩවලට වෙන පළාතකට ගිහින් ආපහු ගෙදර එන දවසට මට දැනෙන්නේ එයා මාව මුලින්ම බලන්න ආපු දවසේ වගේ හැඟීමක්. ඇත්තමයි එහෙම දවසට වෙනදට වඩා මගේ හිත සතුටින් පිරිලා. මට ලැබෙන මේ ජීවිතේ පුංචි අත්දැකීම්වලින් නොසන්සුන් තැන් අවබෝධෙන් තේරුම්ගත්තාම පවුල් ජීවිතේ කොච්චර සුන්දරද කියලා ආයේ ආයේ මම තේරුම්ගන්නවා.

සැනසීම කියන්නේ මොකක්ද? සැනසීම තියෙන්නේ කොහෙද? සතුටින් ඉන්නේ කොහොමද? සතුට තියෙන්නේ කොහෙද?

කාලෙකට කලින් මට තිබ්බ ප්‍රශ්න ටිකක් මේ. සැනසීම, සතුට මං ගාවම තියෙද්දී මං ඒක වෙන දේවල්වලින් හොයන්න ගිය කෙනෙක්. මගේ සැනසීම මොකක්ද, මගේ සතුට මොකක්ද කියලා අද මං දන්නවා. මගේ සැනසීම මගේ පවුල. මගේ පවුල ඇතුළෙනුයි මගේ හැම දුකකටම උත්තර හොයාගන්න ලැබුණේ. හිත ඇවිලෙන හැම වෙලාවකම පවුල ඇතුළෙනුයි මට හිත නිවාගන්න හේතු ලැබුණේ. මේ පුංචි සිද්ධිය මං ලියුවෙත් ඒකයි. හැමදේටම උත්තර, ඇවිලෙන තැන නෙවෙයි නිවුණ තැනයි තියෙන්නේ කියලා ආදරෙන් මතක් කරන්න.

**හෂිනී මනමේන්ද්‍ර**



# ගෑනුන්ට රට ගිනි තියන්නත් පුළුවන් රටේම ගිනි නිවන්නත් පුළුවන්

මීට වසර කිහිපයකට පෙර HNDA සිසුන් පිරිසක් උද්ඝෝෂණයකට පෙළගැහෙන බව පොලිසියට දැනගන්නට ලැබුණි. එදමෙද තුර පැවති උද්ඝෝෂණවල රඟ හොඳටම දන්නා පොලිසිය උද්ඝෝෂණයේ සැර බාල කරන්නට අපූරු උපක්‍රමයක් යෙදුවේය. එනම් උද්ඝෝෂකයන් එන මග ඉදිරියේ පොලිස් නිලධාරිනියන් පිරිසක් සීරුවෙන් තැබීමයි.

කටේ හයිය පෑවත් ගැහැනුන්ට අතේ පයේ හයිය පෙන්වීම හරිහමන් පිරිමියෙකුට ඔබින්නේ නැති බව සිසුන්ගේත් මතය වූ නිසා එද පොලිසිය යෙදූ උප්පරවැට්ටිය සාර්ථක විය. තරුණ මදයෙන් පිරි සිසුන්ගෙන් උණුසුම් වෙන්නට ගිය උද්ඝෝෂණය එද එලෙස සාමකාමී මාවතකට හැරුණි.

මේ හා සමානම සිද්ධියක් පසුගියද මියන්මාරයේදීද වාර්තා විය. එරට ආණ්ඩුව පෙරලා හමුදාව රටේ පාලනය සියතට ගැනීමත් සමඟ මියන්මාර ජනතාව ඉන් මහත් පීඩනයට පත්වී සිටියහ. එනිසා එම පාලනය නුසුදුසු බව කියමින් ඔවුන් දිගින් දිගටම විරෝධතාවල නියැලුණහ. ඒ විරෝධතාවක් අතරතුරදී හමුදා නිලධාරියෙකුගේ ඉහළට එසවුණු අවියක් අභියස **"අනේ අපි අහිංසකයි. අපිට වෙඩි තියන්න එපා"** යනුවෙන් මියන්මාර කන්‍යා සොයුරියක් වූ ඈන් රෝස් ආයාචනය කළාය. ඇගේ ඒ ආයාචනය ඉදිරියේ හමුදා නිලධාරියාගේ ඉහළට එසවූ අවිය පහළ වැටුණේය.

ගිනි තියන්නට පමණක් නොව ගිය නිවන්නටද ගැහැනුන්ට පුදුම හැකියාවන් ඇති බවට මේවාම හොඳ නිදසුන්ය.

මේ හා සමාන සිදුවීම් කිහිපයක් පසුගියද නැවතත් අපි මෙරට අරගල භූමියේදීද දුටුවෙමු. ඉකුත් සතියේ අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ තරුණ තරුණියන් දැවැන්ත උද්ඝෝෂණයට සූදානම් වූයේ කල්තියාම ඒ බව ආණ්ඩුවටත් අඟවමිනි. ඒ අනුව ඔවුන් කොළඹ ලෝටස් පාර හරහා ගාලු මුවදෙර ජනාධිපති ලේකම් කාර්යාලය වෙත පැමිණේවි යැයි සිතා පොලිසියද මාර්ග බාධක දමා වැඩේට ලකලෑහැස්ති විය. ඒ සමීපයේ වතුර බවුසර්, කඳුළු ගෑස් මෙන්ම මුහුණු ආවරණද සූදානමින් තිබුණි. නමුත් ඊට ටිකකට පසු කන්‍යා සොයුරියන් පිරිසක් පැමිණ මාර්ග බාධකය ඉදිරිපිට පවුරක් මෙන් සිටගත්හ. ඒ තරුණ තරුණියන්ට පොලිසියෙන් එල්ලවිය හැකි ප්‍රහාරයන් වළකනු පිණිසය. කන්‍යා සොයුරියන්ගේ ඇඟට අතක් තියන්නට පොලිසියේ කවුරුත් ආවේ නැත.

ඊට පසුද අපේ නෙත ගැටුණේ ජනාධිපති නිල නිවස ඉදිරිපිට කැරලි මර්ධන ඒකකයේ පොලිස් නිලධාරිනියන් පිරිසක් පවුරක් මෙන් එක පෙළට සිටගෙන සිටින දර්ශනයකි. එනිසා එදිනද පොලිස් බාධක මැඩගෙන ඉදිරියට ආ විරෝධතාකරුවන්ට ඔවුන් පසුකර යෑමට නොහැකිවිය. උද්ඝෝෂණ සහ විරෝධතා මැඩ පැවැත්වීමට පොලිසිය විවිධ උපක්‍රම අනුගමනය කරන ආකාරය පසුගිය කාලයේ දිගින් දිගටම දක්නට ලැබුණද සාර්ථක වූ එකම ක්‍රමය මෙය බව බැලූ බැල්මට පෙනෙයි. එනිසා එදද විරෝධතාකරුවන් සහ පොලිසිය අතර ඇතිවෙන්නට ගිය උණුසුම් තත්ත්වයන් මගඇරී ගියේ කවුරුත් බලා සිටියදීමය.

ඒ පිළිබඳව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නිහාල් තල්දූව මහතා කියන්නේ මෙවැනි කතාවකි.



## මේක සැලසුම් කරලා කරන දෙයක් නෙවෙයි

-පොලිස් මාධ්‍ය ප්‍රකාශක නිහාල් තල්දූව-

**"කැරලි මර්ධන අවස්ථා සඳහා කාන්තා නිලධාරිනියන් යොදවන එක සැලසුම් සහගතවම නෙවෙයි අවස්ථානුකූලව කරන දෙයක්. හැබැයි මෙහෙම දෙයක් තියෙනවා. අපි හිතමු විරෝධතාව අතරතුරේ පිරිමි පුද්ගලයෙක් හෝ කීපදෙනෙක් ඇවිත් රාජකාරියේ යොදවලා තියෙන පොලිස් නිලධාරිනියකට හිරිහැර වෙන විදිහට හැසිරුණා කියලා. අන්න එතකොට පොලිසිය විදිහට අපිට පුළුවන් කාන්තා හිංසනය යටතේ ඒකට විරුද්ධව නීතිමය පියවරක් ගන්න. මොකද රටේ සාමාන්‍ය කාන්තාවකට තියෙන අයිතිවාසිකම් ඒ විදිහටම පොලිස් නිලධාරිනියන්ටත් වලංගුයි."**

කොහොම නමුත් ආණ්ඩුවට අභියෝග කරන අපේ අරගලකරුවන්, සම්ප්‍රදායට අභියෝග කරන්නට දෙපාරක් හිතීම අපි දකින්නේ හොඳ ලකුණක් හැටියටය. ඒ නිසා කාන්තා පොලිස් බාධක ඇති තැන්වල එකී ගැහැනු ශරීරවලට අත තියන්නට ඔවුන් ඉදිරියට එන්නේ නැත.

කන්‍යා සොයුරියන් ඉදිරියට පැමිණ සිටගත් මොහොතේ පොලිස් නිලධාරීන්ද ඔවුන්ට තට්ටු බට්ටු දමන්නට ආවේ නැත. කැමැත්තකින් හෝ අවසරයකින් තොරව කාන්තාවකගේ ශරීරයට අත තැබීම මෙරට නීතියට අනුව කාන්තා හිංසනයක්ද වෙයි. ඒ නිසා නීතියට බයේ හෝ සංස්කෘතික රැහේ එවුන් විදියට අරගලබිමකදී හෝ කාන්තාවකට අත නොතබන පිරිමි දැකීම සතුටක් නොවේද?

**භාතිය වෙඩිවර්ධන**


# ආතරයිටිස් රෝගයට (විශේෂ ප්‍රතිකාර)

## ජා ඇල ජී.ටී.සි. වෙත එන්න

**අවුරුදු 50ක පළපුරුදු වෛද්‍යවරයෙක් හමුවී ඔබගේ රෝගය සුව කර ගන්න**

සන්ධිවාත හෙවත් ඔස්ටියෝ සන්දි ප්‍රදාහය, ශරීරයේ සියලුම සන්ධි ආබාධ වලට ප්‍රතිකාර, පටක ගෙවී යාම, දණහිස්, උකුල් හා ඇඟිලි වල සන්ධි ප්‍රදාහය, උරහිසේ හා කොන්දේ කැක්කුම, සන්ධි නැවීමට නොහැකි වීම, සියලු සන්ධි ආබාධ, සන්ධිවල පටක ඉදිමීම හා ගෙවීම්වලට සුවය ලබා ගැනීමට ප්‍රතිකාර අප සතුව ඇත.

පොතු කබර, සුදු කබර, දද, කුෂ්ඨ, සමේ ඇතිවන පරණ තුවාල, ලප කැලැල් ඇතුලු සමේ ඇති වන සියලුම චර්ම රෝග සඳහා විශේෂ ප්‍රතිකාර අප සතුව ඇත.

ගැස්ට්‍රයිටිස්, අක්මාවේ තෙල් බැඳීම, වකුගඩුවල හා මුත්‍රාශයේ ගල් ඇතිවීමට (මුත්‍රාශයේ ඇති වන ගල් දියකර හැරීමට විශේෂ ප්‍රතිකාර ඇත.

ගැස්ට්‍රයිටිස්, අක්මාවේ තෙල් බැඳීම, වකුගඩුවල හා මුත්‍රාශයේ ගල් ඇතිවීමට (මුත්‍රාශයේ ඇති වන ගල් දියකර හැරීමට විශේෂ ප්‍රතිකාර ඇත.

**කාන්තාවන්ගේ දරුඵල නැතිවීම සම්බන්ධව ද ප්‍රතිකාර කරනු ලැබේ.**

**දියවැඩියා රෝගය නිසා ඇති වූ ස්නායු දුර්වලතාවයන් සම්බන්ධව ද විශේෂ ප්‍රතිකාර කරනු ලැබේ.**

**ඇදුම, පීනස, තරුණ අයගේ අකලට හිසකෙස් යාම, අකලට හිසකෙස් පැසීම**

**ස්ත්‍රී පුරුෂ සියලුම ලිංගික දුර්වලතා හා සමාජ රෝග සඳහා ප්‍රතිකාර**

දේශීය ආයුර්වේද, රස වෛද්‍ය ක්‍රමය, හෝමියෝපති (ජර්මන් ප්‍රතිකාර) බයෝකෙමික්ස්, පෙර අපරදිග ප්‍රතිකාර

**දුර බැහැර රෝගීන් දුරකථනයෙන් දිනයක් සහ වේලාවක් ලබා ගෙන පැමිණෙන්න.**

**රෝග පරීක්ෂණය : පෙ.ව. 9.45 සිට ප.ව. 4.30 දක්වා විවෘතව පවතී**


ඉරිදා දින හා පෝය දිනවල, රජයේ නිවාඩු දිනවල වසා ඇත.

G.T.C DRUGS (LANKA)

හමුවීම : G.T.C අංක 14, දුම්රියපළ ඉදිරිපිට, ජා ඇල

0112 236250/ 0112 242804/ 0112 241312/ 0773 995134/ 0722 265099

ප්‍රතිකාර සඳහා ජා ඇල දුම්රියපළට ඇතුළුවන දොරටුවට ඉදිරියෙන් දකුණු පසින් ජී.ටී.සී වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටා ඇත.



# ග්‍රහයට ඕන වෙලාවට ළමයි හදන්න නම් ඇයි මාව බැන්දෙ?

අපේ ජීවිත සාර්ථක කරගන්න යම් මට්ටමකට ඇදහිලි, විශ්වාස තියාගත්තට කමක් නැහැ. හැබැයි අනවශ්‍ය විදිහට එවැනි දේ පසුපස හඹා ගිහින් ජීවිත අසාර්ථක කරගත්තු අය ඕන තරම් මට මුණගැහිලා තියෙනවා.

කුමුදිනීත් අන්න එහෙම කෙනෙක්. ඇය, මම කාලයක ඉඳලා දන්න කියන පවුලක දියණියක්. මේ පවුලේ එකම දරුවා ඇය. කුමුදිනීගේ මව හඳහන් සහ ජ්‍යොතිෂ්‍යය ඉතාම තදින් විශ්වාස කරන කාන්තාවක්. කොටින්ම කිව්වොත් ඇය පවුලේ දරුවන් ගණන සීමා කරලා තියෙන්නෙත් ඇගේ හඳහනේ එහෙම තිබුණු නිසා කියලා ඇය මාත් එක්ක කියලා තියෙනවා. කුමුදිනීටත් අවුරුදු විසිහත විසිඅට පනිනකල් විවාහයක් සුදුසු නැහැ කියලා ඇගේ හඳහනේ තිබුණාලු. ඉතින් ඒ වයසට එනකල් පෙම් සම්බන්ධතා ඇති කරගන්න එපා කියලා තමයි කුමුදිනීට මවගෙන් උපදෙස් ලැබිලා තිබුණේ. පුංචි කාලේ ඉඳලම මේ දේවල් අහන්න දකින්න ලැබුණු නිසා මේ දියණියත් මේ දේවල් හිස් මුදුනින් පිළිගත්තු බව මම පෞද්ගලිකවම දන්නවා.

ඉතින් ඔන්න අර කිව් වයස් සීමාව පහුකළ හැටියේ මේ දියණිය පෙම් සබඳතාවක් ඇති කරගෙන ඒ ගැන මවට කියලා. පුදපු ගමන් කාපි යකා කිව්වා වගේ මේ අම්මා ගත්කටටම අර පිරිමි දරුවගේ හඳහන ඉල්ලන් එන්න කිව්වලු. ගෙන්නගෙන පරීක්ෂා කළාම මේ දෙපළගේ හඳහන් ගැලපිලා නැහැ. ඒ නිසා ඒ සම්බන්ධය නතර කරන්න කුමුදිනීත් එකඟ වෙලා. ඔය අතරේ මේ මව ඇයට මඟුල් තුලා හොයලා තියෙනවා. ඒත් ඒ හැම කටයුත්තකටම හඳහන් හරස් වෙලා. ඉතින් ඔහොම කාලය ගතවෙලා මේ දියණියගේ වයස අවුරුදු තිස්හතක් විතර වෙලා.

දියණියගේ කල වයස පහුවෙන නිසා හඳහන් දෝෂ තරමක් අඩුයි කියලා කියැවෙන කටයුත්තකට මේ මව කැමති වෙලා. විවාහයෙන් පස්සේ පුද පූජා කරලා අර කිව් දෝෂ කපාගන්න කියලා තමයි ඇය කුමුදිනීට උපදෙස් දීලා තියෙන්නේ.

කුමුදිනීගේ සැමියා මෙවැනි දේවල් විශ්වාස කරන කෙනෙක් නෙමෙයිලු. ඉතින් විවාහ වෙලා මාස හය හතක් ගත වුණත් ඔහු අර පුද පූජා කරන්න උනන්දුවක් දක්වලා නැහැ. ඉතින් ඔය ගැන කියලා ඇය නිතරම සැමියා එක්ක ගැටුම් ඇති කරගෙන. ඔය විදිහට ගැටුම් ඇති වෙන්න හේතුවම අර පූජාවන් නොකළ එක කියලයි ඇගේ අදහස වෙලා තියෙන්නේ.

> ළමයි හදනවට නැන්දම්මත් විරුද්ධ වෙලා

ඔහොම අවුරුද්දක් විතර ගත වුණාලු. කුමුදිනීගේ වයසත් එක්ක දරුවෙක් මල්ලෙක් හදගන්න එක තවත් පරක්කු කරන්න බැරි නිසා මේ සැමියා දරුවෙක් හදන්න ඇයට යෝජනා කරලා. හැබැයි ඒ වෙනකොට ඇගේ කේන්ද්‍ර සටහනේ එක ග්‍රහයෙක්ගෙන් කියවුණා කියන්නේ අවුරුදු දෙක තුනක් යනකල් දරුවෙක් හදන්න එපා කියලලු. ඉතින් සැමියට ඕන වුණාට ග්‍රහයා එපා කියන නිසා කුමුදිනීගෙ අම්මත් මේ යෝජනාවට තදින්ම විරුද්ධ වෙලා. පස්සේ මේ පවුල් දෙක අතරේ මේ නිසා විවිධ ගැටුම් පවා ඇතිවෙලා තියෙනවා.

මේ ගැටුම් විසඳගන්න හොඳම විදිහ මනෝඋපදේශනය කියලා හිතුව කුමුදිනීගේ සැමියා ඇයත් එක්ක මාව මුණගැහෙන්න ආවා. මේ සැමියා මාත් එක්ක දුරකතනයෙක් වරක් දෙවරක් කතා කළත් ඇගේ බිරිඳ කුමුදිනී බව මම දැනන් උන්නේ නැහැ. මුණගැහෙන්න එන්නේ මාව කියලා කුමුදිනීත් නොදැන හිටි නිසාදෝ මාව දැක්ක හැටියේ ඇගේ මුහුණ තරමක් අමුතු වුණා. හැබැයි ඇගේ පවුලේ තිබුණු ගැටලුව ගැන දැනහිටි නිසා කුමුදිනීගේ සිතුවිලි වෙනස් කරන්න මට පහසු වුණා.

ඒ වෙනකොටත් ඇය හිටියේ දරුවෙක් හදන හොඳම කාලේ පහු කරලා. ඉතින් ප්‍රායෝගිකව මම ඇයට කරුණු පැහැදිලි කළා. අපි හැමදාම ජීවත් වෙන්න ආපු අය නෙමෙයි. මේ විශ්වාසයන් නිසා කුමුදිනීගේ ජීවිතේ හොඳම කාලය නිකරුණේ ගතවෙලා තිබුණා. ඉතින් ඉතිරි කාලයත් නිස්කාරණේ නාස්ති නොකර සතුටින් ඉන්න හැටි මම ඇයට කියලා දුන්නා. ඒ හැමදේම ඇය පිළිගත්තේ අඬ අඬ. ඇගේ මවත් සමඟ කතා කරන්න උත්සහ කළත් ඇය ඒකට කැමැත්තක් දැක්වුවේ නැහැ. පස්සේ කුමුදිනීත් මවගෙන් ලැබෙන උපදෙස් නොසලකා හැරලා. ඒ නිසා ඔය සිදුවීමෙන් පස්සේ කුමුදිනීගේ මව මාත් එක්ක අමනාප වුණා.

ජ්‍යොතිෂ්‍යය විශ්වාස නිසා ජීවිත කාලය පුරාවට අවිවාහකව හිටි අය ඉන්නවා, දරුවෝ හදපු නැති අය ඉන්නවා, තමන්ගෙම ලෙයින් මසින් හැදුන අහිංසක නොදරුවන්ව පවුලට අපලයි කියලා පවුලෙන් ඈත් කළ අය ඉන්නවා. දරුවෙක් ඉපදෙනකොට අම්මා හරි තාත්තා හරි නැති වුණොත් ඒ නැති වුණේ ළමයගේ අපලෙට කියලා දරුවගේ ජීවිතේට පීඩා කරන අය ඉන්නවා. මේ වගේ ප්‍රශ්න දස් ගාණක් මම අහලා දැකලා තියෙනවා. ලිපිය කියවන ඔයාලත් අනිවාර්යයෙන්ම දැකලා ඇති.

මේ ලිපියෙන් මගේ අරමුණ ජ්‍යොතිෂ්‍යයට අභියෝග කරන එක නෙමෙයි. ඕනෙම නම් ඒ විශ්වාස ඒ විදිහටම තියාගන්න. හැබැයි පරීක්ෂණ, නිරීක්ෂණවලින් පිළිගත් විද්‍යාත්මක දේට පයින් ගහලා ජ්‍යොතිෂ්‍යය විශ්වාස පස්සෙම යන්න හිතෙනවා නම් ඒක ලොකු ගැටලුවකට මුල කියලා අමතක කරන්න එපා.

ගොඩක් දෙමාපියන් පුංචි කාලෙදිම මේ දේවල් දරුවන්ගේ ඔලුවලට කාවද්දනවා. ඉතින් එතැනින් පස්සේ ඒ කෙනාගේ ජීවිතේම තීරණය වෙන්නේ හඳහනට අනුව. මේ විදිහට අවිද්‍යාව පස්සේ ගොඩක්ම දුවන්නේ හිතාමතා දෙයක් තේරුම් ගන්න බැරි මානසිකව දුර්වල අය. අනවශ්‍ය විශ්වාස තුළ ජීවත් වෙන අය විවාහ වුණාම සංකීර්ණ ගැටලු ඇතිවෙනවා. සැමියා හෝ බිරිඳ ඒවා විශ්වාස කරන්නේ නැත්තම් ඔන්න එතැනත් ගැටලුවක්.

අනික කෙනෙක් මේ නිසා ප්‍රශ්න ඇතිවෙයි කියලා නිතරම හිත හිත ඉන්නවා නම් කොහොමත් ප්‍රශ්න ඇති වෙනවා. ඒක විද්‍යාත්මකව පැහැදිලි කළ කාරණයක්. විවාහය කැඩෙනවා කියලා හඳහන්වල තියෙන ගොඩක් අය වෙන්වෙන්න ඔය හේතුව බලපාන බව මම පෞද්ගලිකව නිරීක්ෂණ කරපු කාරණයක්. අනික මේ දේවල් ගැන ඕනවට වඩා හිතන එකත් මානසික ව්‍යාධියක් දක්වා දුරදිග යන්න පුළුවන්.

ඉතින් මට කියන්න ඕනේ පවුල ඇතුළේ කටයුතු කාරණා ගැන සැමියා බිරිඳ එක්ක සුහදව කතා කරලා පහසුව සහ නිවරද්‍යතාවය මත ඉඳලා තීන්දු තීරණ ගන්න. දෙන්නා දෙමහල්ලන්ගේත්, පවුලේ දරුවන්ගේත් සතුට හඳහනකට සීමා කරන්න යන්න එපා. අපි ජීවත් වෙලා ඉන්නේ ටික කාලයයි කියලා මම කිව්වනේ. ඒ නිසා ඒ කාලය පවුල එක්ක සතුටින් ජීවත් වෙන්න. ස්වභාවධර්මයට සහ හෘදසාක්ෂියට අනුව ජීවත් වෙන්න. එතකොට කාටවත් කවදාවත් වැරදෙන්නේ නැහැ.



මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා
රත්නා පුෂ්ප කුමාරී

සෙව්වන්දි හෙට්ටිආරච්චි

# ජාතියට සම්පතක්වූ ඔස්ටියෝපති රෝහල

රටක යහ පැවැත්ම උදෙසා නීරෝගීමත් දරු පරපුරක් අවශ්‍යයයි. අද පාසැල් දරුවන් අතරේ ඉතා ශීඝ්‍රයෙන් පැතිර යන "පැතිකුදය" නම් රෝගය නීරෝගීමත් දරුපරපුරක ඉදිරි ගමන නිහඬව අඩපණකරමින් පවතී. විශේෂයෙන්ම පාසැල් ළමුන් රැගෙන යන අධික බරකින් යුතු පොත් බෑගය දරුවන්ගේ අධ්‍යාපනයට දෙන රුකුලකට වඩා ඔවුන්ගේ ශාරීරික නීරෝගි කමට මහත් බාධාවක් වී ඇත. එමෙන්ම වර්තමානයේ පවතින මාර්ග ගත අධ්‍යාපනය (Online Studies) හරහා මෙම තත්ත්වය තවත් වර්ධනය වී ඇත්තේ ඔවුන් වැරදි ඉරියව් අනුගමනය කරමින් නිවසේ සිට අධ්‍යාපන කටයුතු වල නිරත වීමයි.



ඉතිං මෙම ගැටළුව ඇතුළු විවිධ අස්ථි සහ ස්නායු ආබාධ සඳහා ඉතා සාර්ථකව ප්‍රතිකාර කරන ස්ථානයක් ගැනයි අප මේ අවධානය යොමු කරවන්නේ.

කොඳුඇට පෙළ ආශ්‍රිත සියලු රෝග, අස්ථි රෝග සහ ස්නායු රෝග ඇමරිකාව ඇතුළු බටහිර රටවල සහ යුරෝපීය රටවල අතිශය ජනප්‍රිය ඔස්ටියෝපති වෛද්‍ය ක්‍රමය මගින් රෝගීන් සුවපත් කරන ලංකාවේ පිහිටා ඇති එකම වෛද්‍ය මධ්‍යස්ථානය ඔස්ටියෝපති ක්ලිනික් ආයතනයයි.

ඇමරිකාව ඇතුළු බටහිර රටවල ප්‍රචලිත මෙම ඔස්ටියෝපති වෛද්‍ය ක්‍රමයට ආධ්‍යාත්මික ප්‍රතිකාර ක්‍රම, ස්වභාවික වෛද්‍ය විද්‍යාවන්හි ප්‍රවණතාවන් සමග මුසුකොට හීලිංපති යනුවෙන් නව වෛද්‍ය ක්‍රමයක් නිර්මාණය කිරීමට ශ්‍රී ලාංකික මහාචාර්යවරයකු සමත්ව සිටී. ඒ අනුව ඔස්ටියෝපති සහ හීලිංපති යනුවෙන් පුළුල් පරාසයක පිහිටි රෝග ගණනාවක් සුව කිරීමේ හැකියාවක් මෙම නව වෛද්‍ය ක්‍රමය සතුව පවතී. එම පරාසය කෙතෙක්දැයි කිවහොත් සුව කළ නොහැකි යැයි සම්මතයේ පවතින පාකින්සන්, ගව්ට් වැනි රෝග සඳහා සාර්ථකව ප්‍රතිකාර කළ හැකි අතර, මෙය මෙම වෛද්‍ය විද්‍යාව ලද විශාල ජයග්‍රහණයකි. මේ වනවිටත් ලක්ෂ සංඛ්‍යාවක ලොව වටා රෝගීන් සුවය ලබා ඇති අතර මෙම වෛද්‍ය ක්‍රමයේ ඇති සුවිශේෂත්වය වනුයේ කිසිදු ඖෂධ පානයක් හෝ ශල්‍යකර්මවලින් හෝ තොරව රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමයි.

මේ වනවිට ශ්‍රී ලාංකික රෝගීන් දහස් ගණනක් ශ්‍රී ලංකාව තුළ සුවකර ඇති අතර මෙම වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාවට දායාද වී ඇත්තේ මීට වසර කිහිපයකට ඉහතදීය. මෙම කෙටි කාලය තුළ සිව්දෙස වෙසෙන ලක්වැසි රෝගීන් අති විශාල ප්‍රමාණයක් සුවය ලබා ඇති අතර ඔවුන් කොඳඇට පෙළ සම්බන්ධ රෝග, හන්දි වේදනා, අස්ථි රෝග, හිරිවැටීම්, අස්ථි තදවීම, ස්නායු තෙරපීම, මානසික ආතතිය, පාකින්සන්, පැති කුදය, අංශභාගය, ස්නායු රෝග, නින්ද නොයෑම, විෂාදය, රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝග, මාංශපේශීන් තද වීම්, මධ්‍ය ස්නායු පද්ධතිය ආශ්‍රිත රෝග ආදී විවිධ රෝගී තත්ත්වයන්ගෙන් සුවය ලබා ඇති අතර, පාසල් ළමුන් අතරේ ඉතා ශීඝ්‍රයෙන් පැතිර යන පැති කුදය මෙයින් විශේෂයි. එවැනි දරුවන් විශාල ප්‍රමාණයක් මේ වනවිට ප්‍රතිකාර ලබන අතර එවැනිම ප්‍රමාණයක් සුවය ලබා ඇත. එමෙන්ම සමාජයේ අවධානය අඩුවෙන් යොමුවී ඇති ආබාධිත දරුවන් උදෙසාද විශේෂයෙන්ම ප්‍රතිකාර සිදුකර ඇත.



මෙය ශ්‍රී ලාංකිකයන් ලැබූ මහඟු අවස්ථාවක් වන අතර විදෙස්ගතව සිටින අයගේ මව්පියන්ට, ඥාතීන්ටද, විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකිකයන්ටද තම මව් රටට පැමිණ තමන් සිටි ඒ ඒ රටවල විඳි ප්‍රතිකාර එලෙසින්ම හෝ ඊටත් වඩා හොඳින් සිදුකර ගැනීමට අවස්ථාව ඇති අතර ඔවුන් ශ්‍රී ලංකාවේ ගත කරන විවේක කාලසීමාවන් නිරෝගීව ගත කිරීමටත් එමගින් අවස්ථාව උදාවී ඇත.

හීලිංපති වෛද්‍ය විද්‍යාව ලොවට හඳුන්වා දුන් අභිමානවත් ශ්‍රී ලාංකිකයකු වූ මහාචාර්ය සාගර කරුණාතිලක වෛද්‍යතුමාගේ මූලිකත්වයෙන් සිදුකරන මෙම මහඟු සේවය මේ වනවිට දෙස් විදෙස් පැසසුමට හා සම්මානයට ලක්ව ඇත. "සිංහ සමාජ", "සමස්ත ලංකා දහම් සුවඳ පදනම" ඇතුළු විවිධ සංවිධාන රැසක දේශමාන්‍ය ඇතුළු කීර්තිමත් ගෞරව සම්මාන රාශියකින් පිදුම් ලද මහාචාර්යතුමා හට "සියලු ජාතීන්ගේ සමගි සංවිධානය" මගින් "වෛද්‍ය විද්‍යා කීර්ති" යන ගෞරව සම්මානය පුදන ලද්දේ මෑත දිනකදීය. මහා බ්‍රිතාන්‍යයේදී නයිට් පදවි දෙකකින්ම පිදුම් ලැබුවේ එතුමා මෙම වෛද්‍ය ක්‍රමය හරහා ලක්ෂ සංඛ්‍යාත රෝගීන් සංඛ්‍යාවක් සුව කිරීම ඇගයීමට ලක් කරමිනි. එය මෙම මහඟු සේවාවට කරන ලද ඉහළම ඇගයීමද වේ.

ඔස්ටියෝපති ක්ලිනික් ආයතනය තුළ තවත් උතුම් කර්තව්‍යයක් සිදුවෙමින් පවතී. ඒ, අසරණ රෝගීන් උදෙසා කරන ලද ස්වේච්ඡා සේවාවයි. පූජ්‍ය පක්ෂය, ආබාධිත රණවිරුවන් සහ අසරණ කලාකරුවන් වෙනුවෙන් ඉතා කාරුණික දෘෂ්ටියෙන් බලන මහාචාර්යතුමා, පූජ්‍ය පක්ෂය සහ රණවිරුවන් හට නොමිලේ ප්‍රතිකාර කරන අතර, අසරණ රෝගීන් සහ කලාකරුවන් හට සහනදායී ලෙස ප්‍රතිකාර කරයි.

එමෙන්ම මහජනතාවගේ ඇති දැඩි ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් දැන් ඔස්ටියෝපති ක්ලිනික්හි ශාඛාවක් මාතර, මිරිස්ස ප්‍රදේශයේදී පවත්වාගෙන යන අතර, එම ප්‍රදේශය ආශ්‍රිත සියලු රෝගීන් හට මෙය මහත් අස්වැසිල්ලක් වී ඇත.

**ඉන්දික ප්‍රියදර්ශන විතාන**

## වෛද්‍යවරුන්ගේ සහ සුවය ලැබූවන්ගේ අදහස් කිහිපයක්

### Dr. Thilini Dayarathna (M.B.B.S)



I Am Dr. Thilini Dayarathna. I Came To Professor Sagara Karunathilake, Three Months Ago. I Had Back Pain and Scoliosis For 14 Years. I Suffered Immensely. I Fed Up Of Everything My Paining Was Vanished Soon After I got Treatments. All The Others Recommended Medicines And Surgeries Now I Am Spending Normal Life. This Is A Fine Treatment System I Recommend It For Anyone. I Thankful For Doctor for Curing All Illnesses That I Had.

### වෛද්‍ය විජයත් (M.B.B.S) රත්නපුර



මට දරුණු කොන්දේ අමාරුවක් තිබුණේ. මම රටේ සුප්‍රසිද්ධ වෛද්‍යවරුන් වෙත ගියා. ඒත් කිසිම සුවයක් ලැබුනේ නෑ. මගේ යහළුවෙක් ගේ මාර්ගයෙන් දොස්තර සාගර මැතිතුමා වෙත ආවා. කොඳුඇටේ $L_4$, $L_5$ ස්නායු තද වීම, දකුණු කකුලේ තිබූ දුර්වලතාවයට, කෙන්ඩා පෙරළීමට ප්‍රතිකාර ලබා ගත්තා. දැන් 80% හොඳයි. කාටවත් කළ නොහැකිව තිබූ මගේ රෝග තත්ත්වය එතුමා සුවපත් කළා. මම ඉල්ලා සිටිනවා මෙවැනි රෝග තත්ත්වයක් තිබෙන අයට එතුමා ළඟට එන්න කියලා.

### Statement of Dr.V.P.C. Rajakaruna (M.B.B.S) Dip.HA PG Dip. HD Colombo& Lecturer



Thank you very much Prof. Sagara Karunathilaka & his team for giving great relief for my mother who was suffering from a bad backache for more than 10 years time. As a doctor, to me it was such a surprise to seen mother's improvement with this treatment method which is called "Osteopathy & Healingpathy" especially for spinal problem such as backache scoliosis, Frozen shoulder & many other conditions.


### වෛද්‍ය වීරවර්ධන.



මම ඉන්නෙ එංගලන්තයෙ මට අවුරුදු 10 ක් තිස්සේ තද ඔළුව කැක්කුමක් තිබුණා. බටහිර වෛද්‍යවරු හමුවුණා ආයුර්වේද ක්‍රමයෙනුත් ප්‍රතිකාර ගත්තා. නමුත් සුවයක් ලැබුණෙ නෑ. පසුව අන්තර්ජාලයෙන් මේ ඩොක්ටර් ගැන දැනගත්තා. මම දවස් පහක් ප්‍රතිකාර ගත්තා. මට සෑහෙන වෙනසක් දැනෙනවා. බෙල්ලෙ තද ගතිය නැතිවුණා.

තවම ඔළුව කැක්කුම හැදුනෙම නැහැ. මම මේ රෝගයෙන් සෑහෙන පීඩා වින්ද කෙනෙක්. මම ස්තූතිවන්ත වෙනව ඩොක්ටර්ට මාව සුවකරලා දුන්නට.

### William J. Burke, DO. Family practice Program Director. Doctors Hospital.



පේෂී පද්ධතිය ගැන සලකන විට මා සිතන විදිහට මූලික වෙනස මගේ මනසට දැනෙන ලෙස නම් ඔස්ටියෝපති චිකිත්සක වරයා ලබන අතිරේක පුහුණුවයි. ඔස්ටියෝපති වෛද්‍ය ක්‍රමය දෑතින් සිදුකරන පිවිසුමක් වුවද, රෝග ලක්ෂණ හදුනාගත් සහ එසේත් නැතිනම් ප්‍රතිකාර තත්ත්වයන් යටතේ සිටින රෝගීන් දෙවර්ගයටම යෝග්‍ය වේ. මම සිතනවා දෙඅත් පිවිසුම සහ ඔස්ටියෝපති වෛද්‍ය ක්‍රමය යටතේ රෝගී ලක්ෂණ හදුනාගෙන කරන ප්‍රතිකාරය යන දෙකම එක්කල හොත් රෝගීන් හට අපට අතිරේක යමක් පිරිනැමිය හැක. හුදු බෙහෙත් පෙති නියම කරනවට වඩා දෑත් මගින් අසමතුලිත තත්ත්වයන් තුලනය කිරීම වඩාත් යෝග්‍යවේ .

### වෛද්‍ය පූර්ණ කීර්ති පෙරේරා (M.B.B.S) වෛද්‍ය අධ්‍යක්ෂ ඔස්ටියෝ ක්ලිනික්



මිනිස් සිරුරට කිසිඳු හානියක් නොමැති ඉතා ගුණාත්මක හා ස්වභාවික ප්‍රතිකාර ක්‍රමයක් වශයෙන් ඔස්ටියෝපති ප්‍රතිකාර ක්‍රමය හඳුන්වන්න පුළුවන්. මෙම ප්‍රතිකාර ක්‍රමයේ අතුරු ආබාධ කිසිවක් නොමැත. ඖෂධ පානයක් හෝ ශල්‍යකර්ම වලින් තොරය. කොඳු ඇට පෙළ සම්බන්ධ සියලුම රෝගද අස්ථි හා ස්නායු රෝගද සඳහා උසස් තත්ත්වයේ සාර්ථක ප්‍රතිකාර ක්‍රමයක් වශයෙන් මෙය නොපැකිලිව හඳුන්වන්න. පුළුවන්.

**ඔස්ටියෝ ක්ලිනික් වෛද්‍ය මධ්‍යස්ථානය, මාලඹේ.**

531/ 1, අතුරුගිරිය පාර, මාළඹේ. ක්ෂණික ඇමතුම් 076 73 33 971 / 077 52 60 401

දු: ඇමතුම් 0112 054 444 / 0112 054 433 / 0112 054 499

**ශාඛා : මිරිස්ස, මාතර**

වැඩි විස්තර සඳහා www.osteodr.com වන අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.



# තරුණ දරුවන්ගේ අරගලයට මමත් දෑතම ඔසවා ආශිර්වාද කරනවා!

**කුස්සියේ දුක තේරෙන්නේ අම්මලාට. මමත් මධ්‍යම පාන්තික පවුලක අම්මා කෙනෙක්**

## හිටපු අමාත්‍ය ඩලස් අලහප්පෙරුමගේ බිරිඳ ප්‍රදීපා ධර්මදාස

රට මුහුණ දෙමින් සිටින දැවැන්ත ආර්ථික අර්බුදය හමුවේ ජීවත්වන්නේ කෙසේද යන ගැටලුව බොහෝදෙනෙකුට තිබේ. ඒ ගැනත්, නව දේශපාලන ගමනකට බලාපොරොත්තු ඇතිකළ තරුණ අරගලය ගැනත් අප විමසුවේ හිටපු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතාගේ බිරිඳ වන ජනප්‍රිය ගායිකා ප්‍රදීපා ධර්මදස මහත්මියගෙනි.

**අද වෙද්දි රට තුළ ජීවත් විය නොහැකි තත්ත්වයක් නිර්මාණය වෙලා. ගෘහනියක්, මවක් විදියට ඔබට මේ ජීවන බර දැනෙන්නේ කොහොමද?**

ඇත්තටම මමත් මධ්‍යම පාන්තික පවුලක අම්මා කෙනෙක්. බිරිඳක්, ගෘහනියක් විදියට මට මේ බර දැනෙන්න ගන්නකොටම මම ඔයාලගේ සහෝදර පුවත්පතක් වන **'අරුණ'** පුවත්පතට කිව්වා අපි කනවා නෙවෙයි දැන් ලෙවකනවා කියලා. මේ අර්බුදය ටික ටික ආවේ. වැරදි ආර්ථික කළමනාකරණය ඇතුළු කාරණා රැසක් ඊට බලපෑවා. අද සුළු පඩියෙන් ජීවත්වෙන කෙනෙකුට, ජීවත්වෙන්න බැරි තත්ත්වයටම රට ඇවිල්ලා ඉවරයි. මමද ඇතුළුව බොහෝ මධ්‍යම පාන්තික අම්මලාට මේ ජීවන බර දරාගන්න බැහැ. මමත් බඩු ගන්නේ තොග කඩෙන්. බොහොම සරල ජීවිතයක් අපට තියෙන්නේ. ඒත් බඩුවල මිල ගණන් අහන හැම මොහොතකම මට හිතෙනවා අපේ අහිංසක අම්මලා, දරුවන්ගේ තුන්වේල කොහොමද හදන්නේ කියලා. දරුවන්ට කිරිපිටි පැකට් එක අරන් දෙන්නේ කොහොමද කියලා. ඒක දුකක්. හැබැයි ඒ දුක ඇතුළේ මම එක දෙයක් ගැන සතුටු වෙනවා.

**මොනවා ගැනද ඔබ සතුටු වෙන්නේ?**

ඇත්තටම තරුණ දරුවන්ගේ අරගලය ගැන මට ලොකු සතුටක් තියෙනවා. පක්ෂ පාට භේදයකින් තොරව එය ආරම්භ වුණා. 2019 වසරේ හැටනම ලක්ෂයක් ගෝඨාභය මහත්තයා බලයට ගෙනාවේ ලොකු විශ්වාසයකින්. ඒ බලාපොරොත්තු හොරකම හෝ මොනයම් කාරණයක් නිසාවෙන් හරි බිඳ වැටෙනවනම් තරුණයින් හැටියට නැගිටින්න ඕන. නැත්නම් රට තවත් අගාධෙට යනවා. අපේ තරුණ දරුවෝ කළේ කළ යුතුම දෙයක්. ඒ තරුණ දරුවන්ගේ අරගලයට මමත් දෑතම ඔසවා ආශිර්වාද කරනවා.

**කලාකාරිනියෝ බොහෝදෙනෙක් ඔබ කියන අරගලභූමිය තුළ දැක්කා. හැබැයි ඔබ එහි හිටියේ නැහැ?**

ඔව්. මම මගේ සහෝදරියකගේ පෞද්ගලික කටයුත්තක් වෙනුවෙන් ගිහින් ඒ දවස් ටිකේ හිටියේ ප්‍රංශයේ. මම ගිහින් සතියකින් විතර තමයි මේ අරගලය පටන්ගත්තේ. මම ඒකට දක්වන උනන්දුව දැකලා මගේ සහෝදරිය කිව්වා, ඔයා මෙහේ හිටියට හිත ලංකාවේ නේද කියලා. ඇත්තටම මම ඒ මොහොතේ ලංකාවේ හිටියනම් මමත් ඒ අරගලභූමියට යනවා. දැන් මම එතැනට යන්න ප්‍රමාදයි. හැබැයි අම්මා කෙනෙක්, සහෝදරියක් හැටියට මම හදවතින්ම එතැන ඉන්නවා. මම කියන්නේ පක්ෂ පාට ගාගත්තු අරගලය ගැන නෙවෙයි තරුණ දරුවන්ගේ සැබෑ සාමකාමී අරගලය ගැනයි.

**මම මේ දවස්වල ගමන් බිමන් යන්නේ ත්‍රීවිලර් එකෙන්. ඒ සැහැල්ලුවට මම කැමතියි**

**අපට අද නිතරම ඇහෙන දෙයක් තමයි පාර්ලිමේන්තුවේ 225ම හොරු කියලා ජනතාව නගන චෝදනාව. එහෙම දේවල් ඇහෙද්දි ඔබට මොනවද ඔබේ සැමියා ගැන හිතෙන්නේ?**

එහෙම ඇහෙද්දි නම් ඩලස් ගැන මට ලොකු දුකක් දැනෙනවා. අපි අයථා විදියට ඇල්පෙනෙත්තක දෙයක් හොරකම් කරලා නැහැ. මම වුණත් ඔහුගේ මන්ත්‍රීකමේ, ඇමැතිකමේ වරප්‍රසාද අරගෙන එක විදේශ සංචාරයක් ගිහින් නැහැ. ඔහු මැති ඇමතිකම් දැරුවා කියලා අපේ ජීවන පැවතුම් වෙනස් වෙලත් නැහැ. ඔහුගේ පැවතුම් වෙනස් වුණෙත් නැහැ. අපි වාහන පර්මිට් අරන් නැහැ. සරලව පොළොවේ පය ගහලා ජීවත්වෙන සාමාන්‍ය මිනිස්සු හැටියට එහෙම කතා ඇහෙද්දී දුක හිතෙනවා. ඒ වගේම ඔය 225 අතරේ රට ගැන හැඟීමක් තියෙන අවංක දේශපාලනඥයෝ නැතුව නෙවෙයි. මම වගේම අපේ දරුවොත් ඔහුට කියන දෙයක් තමයි, ඕනම වෙලාවක ඔය තනතුරු අතහැරලා දාලා ගෙදර එන්න කියන කාරණය. මේ ළඟදි දවසකත් මම ඔහුට කිව්වා, අපිට ඔයාගේ සෙවනැල්ල තියෙනවා, ඔයාව බලාගන්න මම ඉන්නවා, මාව බලාගන්න අපේ දරුවෝ දෙන්නා ඉන්නවා කියලා. අපි වැඩි කලක් ජීවත්වුණේ නිල නිවාසවල. විවාහවෙලා අවුරුදු විසිපහකට පස්සෙයි අපිට අපේම කියලා ගෙයක් හදාගන්න පුළුවන් වුණේ. ඉතින් දන්න අය අපේ ජීවිත ගැන දන්නවා. ඇමැතිකමෙන් අයින් වුණ ගමන් ඔහු වාහන බාර දුන්නා.

**පාර්ලිමේන්තුවේ ඉන්න 225ම හොරුයි කියලා කියනවා ඇහෙද්දි මට ඩලස් ගැන පුදුම දුකක් දැනෙනවා**

**එතකොට ඔබ කොහොමද මේ දිනවල ගමන් බිමන් යන්නේ?**

මම දන්න කියන අයෙකුගේ ත්‍රීවීලර් එකක ගමන් බිමන් යනවා. ඒ ගිහින් ඇවිත් ගාණ බේරනවා. ඒ ගමන් හරි සැහැල්ලුයි. හිතේ බරක් නැහැ. කොහොමටත් අපි සරල, පොළොවේ පය ගහලා ඉන්න මිනිස්සු. මේවා අපට නුහුරු දේවල් නෙවෙයි.

**ඔබේ සැමියා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වෙත ලිපියක් යොමු කරමින් සභාග රජයක් ගැන යෝජනාවක් කර තිබුණා. ඒ සභාග රජයේ අගමැතිවරයා ගැනත් ඉඟි මේ වනවිට පළවෙනවා නේද?**

එම දේශපාලන කාරණා ගැන මා දන්නේ නැහැ. ඔහු එම ලිපිය සකසද්දී මම ලංකාවේ හිටියේ නැහැ. මට ඕන මේ වැටිලා තියෙන තැනින් රට ගොඩගත හැකි ක්‍රමවේදයක් ඉක්මනින් ඇතිවෙනවා දකින්නයි. ඇත්තටම බඩු ගේන්න කඩේට යද්දී බඩු මිල දවසින් දවස වැඩි වෙනවා අහද්දී, මගේ හිතට ලොකු බරක් දැනෙනවා.

ඒ බර ඇතුළේ මේ රටේ අහිංසක අම්මලා තාත්තලා ගොඩක් ඉන්නවා. එකවර ගෑස් එක රුපියල් දෙදහස් එකසියයකින් වැඩි වුණාහම පුංචි වැටුපක් අරන් ජීවත්වන පවුල් මොනතරම් අසරණයිද? මේ තරුණ නැගිටීම හමුවේ මේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්න දැන්වත් පාලකයෝ පෙළඹේවි. ජනතාවගේ පැත්තේ සිටයි ඔවුන් තීන්දු තීරණ ගත යුත්තේ.

**මම ඇහුවේ පසුගිය දිනවල අලුත් ආණ්ඩුවේ අගමැතිවරයා ගැන කියද්දී ඔබේ සැමියගේ නමත් කියැවුණා?**

අද වෙනකොට සමාජ මාධ්‍ය ඉතාම ජනප්‍රියයි.

මේ මොහොතේ සමාජ මාධ්‍ය තුළ විවිධ මත පළවෙනවා. එහෙම දෙයක් මමත් දැක්කා. හැබැයි ඊට ප්‍රතිචාර දක්වන්න මම උත්සාහ කළේ නැහැ.


**එහෙම තනතුරක් ගැන ඔහු ගෙදරදි කතා කරලම නැද්ද?**

ඇත්තටම නැහැ. ඔහුට වැඩක් කරන්න අවස්ථාවක් ලැබුණද කියන ගැටලුව නම් මට හැමදාම තියෙනවා.

හැබැයි මට මතකයි අධ්‍යාපන අමාත්‍යංශයේ, තරුණ කටයුතු අමාත්‍යංශයේ ඔහු තනතුරු දරද්දී තීන්දු තීරණ ගත්තේ තාත්තා කෙනෙක් වගේ, සමස්ත දරු පරපුර ගැනම ආදරෙනුයි. ඔහු දේශපාලනයේ නියැලෙනවානම් ඒ විදියට දේශපාලනයේ නියැලෙනවට මා කැමතියි.

දීපා වසන්ති එදිරිසිංහ

# හෝටල් වල උපන්දින සැමරුවම පව් සිද්ද වෙනවද ?



**ඒක තමයි. හෝටලයට වෙනම ගාණක්. ඒක සරසලා තියෙන්නේ වෙනම කෙනෙක්. එතකොට කේක් එක හදවලා තියෙන්නේ තව තැනකින්. මල විකාර**

**"නෙතුලිලාට පිස්සුද කොහෙද? අච්චර වියදම් කරන්නේ පොඩි එකෙක්ගේ උපන්දිනයකට."**

සාමා එහෙම කිව්වේ නෙතුලිගේ පුංචි දියණියගේ උපන්දින උත්සවයට සහභාගී වෙලා එන ගමන්.

**"ඒක තමයි. හෝටලයට වෙනම ගාණක්. ඒක සරසලා තියෙන්නේ වෙනම කෙනෙක්. එතකොට කේක් එක හදවලා තියෙන්නේ තව තැනකින්. මල විකාර."**

මාෂා කිව්වේ හිනා වෙවී.

**"මේ රටේ ඕනේ තරම් දුප්පත් ළමයි ඉන්නවා. ළමා නිවාස තියෙනවා. අර්ථවත් විදිහට උපන්දිනය සමරනවා නම් කරන්න තිබුනේ ඒ වගේ දරුවෝ ටිකකට මොනවා හරි අරන් දෙන එක. අර දරුවටත් ඒක කොච්චර ලොකු ආශිර්වාදයක් වෙයිද?"**

සාමා ආයෙමත් කිව්වා.

මේ අතරේ නෙතුලි සහ සේනක මුදල් ගනුදෙනු බේරන්න පටන් ගත්තා.

බිම වැටිලා තියෙන ආහාර කැබලි අතු ගාන්න ආපු සුවිනිතා නෙතුලිගේ සුරතල් දියණිය දිහා බලලා ආදරෙන් හිනා වුණා.

**"මටත් ඉන්නවා නෝනා මේ වගේම මිනිබිරියක්."**

**"ආ එහෙමද? ඒ දුවගේ වයස කීයද?"**

නෙතුලි ඇහුවේ හිනා වෙලා.

**"අවුරුදු තුනයි නෝනා. මගේ දුගේ දරුවා ඒ. දුගේ මහත්තයාගේ රස්සාව නැති වුනානේ හදිසියේම. මටවත් මේ හෝටලයේ රස්සාවක් තිබුණු එක හොඳට ගියා නෝනා. දැනට මගේ ආදායමෙන් තමා එයාලත් ජිවත් වෙන්නේ."**

**මේ ඒක නෙවෙයි ඔයා කිව්වා නේද අර අපේ ඩෙකරේෂන් වැඩ ටික කරලා දුන්නු හංසකගේ වයිෆ් එක් තැන වෙලා කියලා. පව් නේද?**

සුවිනීතා කිව්වේ හිතේ දුකෙන්. තමන්ගේ එකම දුවගේ පවුලේ ආදායම් මට්ටම කඩාගෙන වැටුණු එක ගැන වේදනාවෙන් ඉන්න නිසා සුවිනිතාට මේ ගැන කා එක්කත් කියවෙනවා.

නෙතුලි යන්තම් හිනා වෙලා සුවිනීතා දිහාවට හැරුණා.

**"අපෙන් මුකුත් උදව්වක් එහෙම..."**

**"අනේ නැහැ නෝනා. මට මේ හිතේ දුකට කියවුණේ. නෝනලා වගේ අය මේ හෝටලයට එන නිසා නේන්නම් අපිටත් මේ රස්සාව රැකිලා තියෙන්නේ? මෙතන ලොකු තැනක් නොවුණට පනහක් විතර වැඩ කරනවා. ඒ හැමෝටම හෝටලෙන් පඩි ගෙවන්නේ ඉතින් නෝනලා වගේ අය මෙහෙ එන නිසානේ."**

එහෙම කියලා සුවිනිතා බිම අතු ගාන්න පටන් ගත්තා.

හෝටලයේ මුදල් ගෙවලා ඉවර වෙලා සේනක දරුවත් වඩාගෙන ඉස්සර වුණා. මෝටර් රථයේ දොර ඇරලා දියණියව කාර් සීට් එකේ තියලා සේනක රියදුරු අසුනට ආවා. නෙතුලි අනික් පස අසුනේ වාඩි වුණා.

**"කේක් එක හොඳට තිබුනා නේද? මම හිතුවේ නැහැ ඔච්චර රහට තියෙයි කියලා."**

සේනක කිව්වේ නෙතුලි දිහාවට හැරිලා.

නෙතුලි ආඩම්බරකාර හිනාවක් මුහුණේ ඇඳ ගත්තා.

**"ඒකනේ මම කිව්වේ. කේක් එක සඳුනි නංගිට කියලම හදු ගමු කියලා. කෙල්ලගේ කෑම රසයි. ඒ ළමයාගේ උත්සාහවන්තකමට මම හරිම කැමතියි. අර වයසක අම්මවයි තාත්තවයි තනියම බලාගෙන, බිස්නස් එකකුත් කරනවා කියන්නේ ලේසි වැඩක් නෙවේනේ."**

**"ඔව් ඇත්තටම රසයි තමා. පාර්ට් එකට ආපු අයත් කිව්වා ගොඩක් රසයි කියලා."**

සේනක කිව්වේ සතුටින්.

**"මේ ඒක නෙවෙයි ඔයා කිව්වා නේද අර අපේ ඩෙකරේෂන් වැඩ ටික කරලා දුන්නු හංසකගේ වයිෆ් එක් තැන වෙලා කියලා. පව් නේද?"**

ටික වෙලාවකින් නෙතුලි ඇහුවා.

**"අනේ ඒකනේ. දැන් අවුරුදු දෙකක්ලු. බස්කාරයෙක් හප්පගෙන ගිහින්ලු. දරුවෝ තුන් දෙනෙක් ඉන්නවා මනුස්සයට. දරුවෝ බලාගෙන, උයා පිහාගෙන ඉන්න හෙල්පර් කෙනෙක් ඉන්නවලු. නෝනාව බලා ගන්න තව හෙල්පර් කෙනෙක් ඉන්නවලු.**

**නෝනාගේ බෙහෙත් වලට වෙනම වියදම් කරන්න වෙනවලු. දකුණු අතට ලැබෙන ආදායම වම් අතින් වියදම් වෙනවා කියලා තමා මනුස්සයා කියන්නේ නිතරම."**

සේනක කිව්වා.

**"පව්. හංසකගේ ෆේස්බුක් පේජ් එකේ හොඳ රිව්ව් එකක් දන්න ඕනේ. තව බිස්නස් ලැබෙයිනේ එතකොට."**

නෙතලි එහෙම කිව්වේ දුරකථනය අතට ගන්නා ගමන්.

**සමාධි ඩයස්**

**ව්‍යාපාර හා ආයෝජන අවස්ථා**
**ඩුබායි / UAE**
ලංකාවේ ඇති සමාගමක ශාඛාවක් UAE හි ව්‍යාප්ත කිරීමට
නව ව්‍යාපාරයක් UAE ආරම්භ කිරීමට
UAE හි ආරම්භ කර ඇති සමාගම්වල ආයෝජනය කිරීමට
UAE හි අධ්‍යාපනය ලැබීමට
වෘත්තීය වීසා (Professional Visa) හා වෙනත් වීසා සඳහා
අමතන්න.
ANS
ANS Consulting FZCO
DSO - FZCO - 13679
License Number 13699
16/36, Pio Mw, Circular Road, Kandana.
0775 714 718

# නවසීලන්තයේ සිට ආ බිරිඳ මරා සැමියා ළිඳට පැනලා

එකමග එකට යාමට සිතා අත්වැල් බැඳගත්තද, ඒ අත් අතරමග ලිහී යන අවස්ථා කෙතෙකුත් තිබේ. අප්සරාත්-මියැසියත් හදවතින් බැඳුනේ මේ භවයේ පමණක් නොව මතු සංසාරයේත් එකමග එකට යන්නට සිතාගෙනය. එහෙත් හිතන පතන සියල්ල ඉටු නොවන දහම මේ යුවළටද ඒ ලෙසම බලපෑවේය.

හරියටම කිවහොත් ඒ මීට වසර හයකට පමණ පෙර දිනකි. ඒ වනවිට අප්සරා කල්පනීට වයස අවුරුදු විසිහතකි. දුටුමනින් කෙනෙකුගේ නෙත් සිත් පැහැර ගැනීමට තරම් රුවැති යුවතියක වූ ඇය, මියැසියගේ නෙත ගැටුණුද, ඔහුට දැනුණේ කල්ප කාලාන්තරයක් බලාපොරොත්තුවෙන් සිටි යුවතිය හමුවූවා වැනි හැඟීමකි. අප්සරාද මියැසියට **‘ආදරෙයි’** කියා කීවේ තමා බලාපොරොත්තු වූ ගතිගුණ සමුදයක් ඔහු තුළ තිබුණු නිසාය.

**“මම අම්මට ඔයා ගැන කිව්වා. ඔයාට අපේ ගෙදර එන්න කිව්වා.”**

**“හරි, මම විතරක් නෙවෙයි ගෙදර අය එක්කම එන්නම්.”**

අප්සරාගේ යෝජනාවට ඔහු විශ්වාසය එක්කළේ එලෙසිනි. මාතර කැකණදුර ප්‍රදේශයේ පදිංචි මියැසියගේ පවුලේ උදවිය ගම්පහ වැලිවේරිය, වෑබොඩ ගමට නෑගම් යන්නේ ඔවුන්ගේ විවාහය ස්ථිර කරමිනි. මියැසිය පවුලේ බාලයා වූ අතර අප්සරා වාගේම උපාධිකාරියෙකුද විය. අප්සරා ඒ වනවිට කථිකාචාර්යවරියක ලෙස කටයුතු කළාය. මියැසිය පෞද්ගලික ආයතනයක විධායක රැකියාවක නියැලිණි.

දෙපාර්ශවයේ ආශිර්වාද මැද සිදුවූ ඔවුනගේ විවාහයට වසරක් ගෙවුණේ ලස්සන සිහින මැදය. මේ අතරතුර දෙදෙනා කථිකා කරගත්තේ විදෙස් රටකට යන්නටයි.

**“අපි නවසීන්තෙට යමු. වීසා ගන්න අමාරුවෙන එකක් නැහැ. රස්සාවක් කරන ගමන් ඉගෙනගන්නත් පුළුවන්නේ.”**

> **දෙන්නා එකටම රට යන්න හිටියත්, කොරෝනා නිසා සැමියගේ ගමන වැළකිලා**

ආර්ථික අතින් ස්ථාවර වී ජීවිතයේ බලාපොරොත්තු ස්වෝත්සාහයෙන් ජයගැනීමේ අදිටන දෙදෙනාටම තිබුණි. සමාජශීලී කාන්තාවක වූ අප්සරා, පාසල් සමයේ සිටම අභියෝගවලට බියවූ යුවතියක නොවේ.

නවසීලන්ත ගමනට සූදනම් වෙද්දී සියල්ල බලාපොරොත්තු වූ ලෙස සිදු නොවන බව මියැසියට තේරුම් ගියේ තමන් වෙත කඩාපාත් වූ බාධාව නිසාය. ඒ කොරෝනා වසංගතයේ වැඩි බලපෑමක් තිබුණු දින කිහිපයයි. මියැසියටද කොරෝනා වැළඳී තිබුණි. ඒ වනවිට දෙදෙනාම වීසා අයැදුම්පත් යොමුකොට තිබුණත්, කොරෝනා නිසා මියැසියගේ අයැදුම්පත ප්‍රතික්ෂේප වෙද්දී, අප්සරාගේ අයැදුම්පත අනුමත විය.

**“කමක් නෑ. මම පස්සේ එන්නම්. ඔයා ගිහින් ඉගෙනුම් වැඩ පටන්ගන්න. රස්සාවක් ලැබුණොත් කරන්න. මං පුළුවන් තරම් ඉක්මනට එන්නම්.”**

අප්සරාගෙන් කෙටි කලකට හෝ වෙන්වීමේ දුක මියැසියට තදින් දැනුණත්, අප්සරා සිටියේ සතුටිනි. ඒ නවසීලන්ත ගමන සැබෑවන සතුටයි.

**“ඒ ගියාම මාව අමතක වෙයිද දන්නේ නෑ.”**

මියැසිය කළේ විහිළුවකි.

**“එහෙම වෙන්නේ නෑ මියැසි. ඔයාටත් ඉක්මනින් එහේ එන්න ලැබේවි.”**

**“ඔව්... ඉක්මනින් මටත් එන්න පුළුවන් වෙයි. ඔයා නැතුව මට පාළුයි.”**

අප්සරා ලංකාවෙන් ගිය දිනය මියැසියට තදින්ම දැනුණි. ඒ පාළුව විඳ දරාගන්නට හැකි වූයේ ඇගෙන් ලද ඇමතුමකිනි.

රැකියාවට ගියත් ඇය මතක් නොවුණු මොහොතක් ඔහුට නැත.

එහෙත් දින, සති, මාස ගෙවෙද්දී, මියැසියට අප්සරාගේ වෙනසක් දැනෙන්නට වූයේය. ඇය කතා කරන වාර ගණන අඩුවිනි. ඊට හේතු විමසද්දී දෙදෙනා අතර බහින්බස්වීම්ද ඇතිවිය. වෙනදට නැති වෙනසක් අප්සරාගේ වෙතැයි මියැසිය කියද්දී අප්සරාද නිකන් හිටියේ නැත.

අනතුරුව ඔවුන් එකිනෙකාට චෝදනා කරගන්නට වූයේ සැමියා බිරිඳ ලෙස නොව සදකාලික හතුරන් විලාසයෙනි.



සිද්ධිය පිළිබඳ මහේස්ත්‍රාත් පරීක්ෂණ පැවැත්වෙමින්



සැකකරු සියදිවි නසාගැනීමට පැන්න ළිඳ

> **ඇය නවසීලන්තේ ඉඳලා ආවේ සති දෙකක නිවාඩුවකට. ඒ අම්මා බලලා යන්න**



මියගිය අප්සරා

**“මම තමුන්ගෙන් ඩිවෝස් වෙනවා.”** අප්සරා කීවාය.

මියැසියට ඈ ගැන සැක ඇතිව තිබුණි. ඔහුගේ නවසීලන්ත ගමනද හරි නොගියෙන්, ඔහු තුළ තරහක්ද වැඩිවෙමින් තිබුණි. අප්සරාද මියැසියගේ හිත හැදෙන්නට වචනයක් හෝ කතා කළේ නැත. ඇය ඔහුගෙන් දික්කසාද වනවා යැයි කී දිනෙන් පසු නැවත ඔහුට ඇය හා කතා කරන්නට නොහැකි වූයේ ඔහුගේ ඇමතුම් නොම්බරය ඇය බ්ලොක් කර දමා තිබුණු නිසාය.

මේ අතර අසල්වැසියෙකු මියැසියට කියන්නේ අප්සරා ගෙදර පැමිණ ඇති බවයි. හිතේ තිබූ වෛරය අලුත්වන්නට වැඩිවෙලා ගියේ නැත. ඔහු අප්‍රේල් විසිහතරවනද මාතර සිට වැලිවේරියට එන්නේ තියුණු ආයුධයක්ද බෑගයේ සඟවාගෙනය.

අප්සරාත්, ඇයගේ මිතුරියකුත්, නැගණියත් එම මොහොතේ නිවසේ සිට ඇත. රෑ බෝ වනතුරු බලාසිටි මියැසිය නිවසේ පිටුපසින් ගෙට ඇතුළු වූයේ මේ මොහොතේයි.

> **සැකය නිසා රණ්ඩු වෙද්දි ඇය එතෙරදිම දික්කසාදෙත් ඉල්ලලා**

**“ඒ වෙලාවේ අප්සරා ඉඳලා තියෙන්නේ ගෙයි ඉදිරිපස. ඇය සැමියාව දැකපු ගමන් කලබල වෙලා තියෙනවා. කොහොමහරි සැකකරුගෙන් බේරෙන්න ඇයට හැකිවුණේ නැහැ. ඇයව තියුණු ආයුධ පහරවලින් බරපතළ තුවාල සහිතව බිම ඇද වැටිලා. ඇයගේ කෑගැහිල්ලට නැගණියත්, යෙහෙළියත් දුවගෙන ඇවිත් තියෙනවා. ඒ වෙලාවේ සැකකරු ඔවුන්ටත් එම තියුණු ආයුධයෙන් කොටලා තියෙනවා. අප්සරා එම ස්ථානයේදීම මියගියා. යෙහෙළියත්, නැගණියත් රාගම රෝහලට ඇතුළත් කර තිබෙනවා.”**

පොලිසිය කියන්නේ අප්සරාව කපා කොටා ඔහුද එම ආයුධයෙන්ම ගෙල කපාගෙන ඇති බවයි. ඔහුට ජීවත් වෙන්නට බලාපොරෙත්තුවක් ඒ වනවිට ඉතිරිව නොතිබූ බැවින්දෝ ඔහු ළිඳට පැන්නේ අප්සරාව යැවූ ගමනම ඇය හා යන්නට සිතා වන්නට ඇත. එහෙත් දෛවය මෙවරද එම අවස්ථාව මියැසියට දුන්නේ නැත. ඔහුව ළිඳෙන් ගොඩගෙන ගම්පහ රෝහලට ඇතුළත් කරන්නට ගම්මු කටයුතු කළහ.

සති දෙකක නිවාඩුවකට මවගේ සුවදුක් විමසා යන්නට ලංකාවට ආ අප්සරා දැන් ජීවතුන් අතර නැත.

මියැසිය තමන්ට තමන්ම කරගත් තුවාල සුව වූ වහාම නීති මගින් දඬුවම් ලබන්නෙකු වනු ඇත.

ආදරයෙන් බැඳී, එක වහලක් යටට වී ජීවිතය ආදරයෙන් බෙදාගත්, ජීවිතය ගැන අනන්ත සිහින දුටු යුවළකගේ බලාපොරාත්තු සුණු විසුණු වී ගියේ එලෙසිනි.

**‘සැකය’** එය බියකරු නමුත්, කතාබහකොට ආදරයෙන් එය විසඳගැනීම හෝ අතහැර දැමීමට තරම් තව පියවරක් ගැන මියැසිය සිතුවා නම් එම ජීවිත දෙකම, එකම මාවතක හෝ මාවත් දෙකක හෝ අදත් ලස්සනට ජීවත්වනවා නොවේද?

මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැලිවේරිය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධනගේ මූලිකත්වයෙන් වැඩිදුර විමර්ශන සිදුකෙරේ.

දීපා වසන්ති එදිරිසිංහ

# කසිප්පු ටිකක් බී බජව්වට සෙට්වෙන සක්‍ර දෙවියන්ගේ යාළුවා




**තමාට විශ්ව ශක්තිය නමැති බලයක් ඇති බවත් ඔහු වියපත් යුවළට කියලා**

ශ්‍රී ලාංකීය බෞද්ධයන්ගේ අසමසම පූජා නගරය අනුරාධපුරයයි. ශ්‍රී මහා බෝධීන් වහන්සේ, රුවන්වැලි සෑය ඇතුළු අටමස්ථාන නිසා ඊට හිමිවන තැන ලංකාවේ අන් කිසිඳු පුරවරයකට හිමි වී නොමැති බව මගේ විශ්වාසයයි. නමුත් බෞද්ධයන්ගේ ඇති මේ අතිමහත් ශ්‍රද්ධාව නිසා අනුරාධපුරය ආශ්‍රිතව ජාවාරම්කාර උපසංස්කෘතියක්ද බිහිවී තිබේ. මේ දිනවල අනුරාධපුරය ගැන පැතිරෙන එවැනි එක් කාන්තාවක්ද ඒ ජාවාරම් උපසංස්කෘතියේම ප්‍රතිඵලයකි.

අනුරාධපුරයේ ජන විශ්වාස සම්බන්ධ හැදෑරීම්වලදී මට සහාය වන්නෝ කිහිපදෙනෙක් වෙති. ඔවුන් අතුරින් අනුරාධපුර, රුවන්වැලි මහා සෑ ආරාමයේ කැපකරුවෙකු වන ඩී.එම්. මුතුබණ්ඩා මහතා විශේෂය.

මුතුබණ්ඩා මහතා ඇසුරු කරන විවිධ තරාතිරම්වලට අයත් පුද්ගලයන් අතරේ දූ දරුවන් විදේශ රටවල පදිංචි වියපත් මාපිය යුවළක්ද වෙයි. ඔවුන් නිතිපතා අනුරාධපුර පුදබිමට පැමිණෙන්නේ තමන් කරන නොයෙක් පින් දහම්වල ආශීර්වාද බලය තම දූ දරුවන්ට අනුමෝදන් කිරීම පිණිසය.

**"ඒ නෝනයි මහත්තයයි මහරගම. අවුරුදු ගාණක් තිස්සේ අනුරාධපුරේ වන්දනාවේ එන හින්ද දැන් කාලෙක ඉඳලා මාවත් හොඳට දන්නවා. පහුගිය දවසක ඒ දෙන්නා අනුරාධපුරේ ආපු වෙලාවක මගෙන් ඇහුවා, 'මේ කිට්ටුවක කඩුපුල් මල් පිපෙන තැනක් දන්නවද?' කියලා. එතකොට මම කිව්වා, 'කඩුපුල් හැමතැනම නෑ. ඒවායේ මල් පිපෙන්නෙත් බොහොම කලාතුරකින්. අනික ඒ මල් රෑ මැදියමට කිට්ටුව පිපිලා පාන්දර වෙනකොට පරවෙලා යනවා' කියලා. ඒ නෝනටයි මහත්තයටයි ඔය කඩුපුල් මල් ගැන කියලා තියෙන්නේ අනුරාධපුරේදී හම්බුණු අනුරාධපුරේම කෙනෙක්. කඩුපුල් මල් පිපෙන වෙලාවක ඒ මල් කඩාගෙන බුදුන් වැඳලා ශක්‍ර දෙවියන්ට පින් දුන්නම ශක්‍ර දෙවියෝ ඒ අයට පුදුමාකාර විදියට පිහිට වෙනවා කියලා ඒ මනුස්සයා මේ නෝනටයි මහත්තයටයි කියලා තියෙනවා."** මුතුබණ්ඩා මහතා කී අන්දමට එම යුවළට මේ කතාව කියා ඇත්තේ පොහොයක්ද නොවන දිනයක අනුරාධපුර මහමෙවුනා උයනේ සිල් ඇඳුමකින් සැරසී සිටි පුද්ගලයෙකු විසිනි. මෙසේ වන්දනාවේ පැමිණෙන පිරිස් සමීපයට ගොස් දැන හැඳුනුම්කම් පාමින් තමන් තුළ සුවිශේෂ ආධ්‍යාත්මික බලයක් ඇතැයි පවසන පුද්ගලයෝද සිටිති.

එහෙත්, කඩුපුල් යනු ඉතා දුර්ලභ ලෙස දැකිය හැකි, මිනිසුන්ට රහසින් මධ්‍යම රාත්‍රියට ආසන්න කාලයක පිපී අලුයම් යාමයේ පරවී යන මල් විශේෂයක් නිසා කඩුපුල් සොයාගැනීමේ අසීරුව ගැනත් කියා ඇති ඒ පුද්ගලයා කාටත් රහසින් කළ යුතු කඩුපුල් පූජාව පිළිබඳව තමන් හා ප්‍රකාශ කළේද ශක්‍ර දේවේන්ද්‍රයා බව පවසා ඇත. වරක් තමන් සිල් සමාදන්ව මහමෙවුනා උයනේ භාවනානුයෝගීව සිටි මධ්‍යම රාත්‍රියක ශක්‍ර දේවේන්ද්‍රයා පැමිණ ඒ පණිවිඩය දී සැණින් අතුරුදන් වූ බව යුවළට කියා තිබේ. එමෙන්ම තමන් තුළ විශ්ව ශක්තිය නම් බලයක් ඇතැයිද ඔහු ඒ යුවළට කියා ඇත.

**"කොහොම හරි අන්තිමට ඒ නෝනයි මහත්තයයි වෙනුවෙන් කඩුපුල් මල් පූජාවක් කරන්නත් ඒ මනුස්සයා කැමතිවෙලා තියෙනවා. හැබැයි ඉතින් ඒ විදියට පිපිච්ච කඩුපුල් මල් කීපයක් හොයාගන්න සෑහෙන්න අමාරුයි කියලා, ඒ වෙනුවෙන් තරමක වියදමක් දරන්න වෙනවා කියලත් ඒ මනුස්සයා කියලා තියෙනවා. කොහොමහරි ඒ මනුස්සයගේ කතාවට පැහැදුනු ඒ නෝනයි මහත්තයයි වියදමට තියාගන්න කියලා රුපියල් පන්දහක් වගේ ගාණක් දීලා. ඒ කඩුපුල් මල් පූජාව කරන වෙලාව අපිට දැනුම් දෙන්න කියලා ඒ මනුස්සයගේ ටෙලිෆෝන් නම්බර් එකත් ඉල්ලාගෙන තියෙනවා. කොහොම නමුත් මේ කතාවේ මොකක් හරි ලොකු 'කොස්සක්' තියෙන බව මට තේරුණා."** මුතුබණ්ඩා මහතා කීය.

නමුත් ඒ සම්බන්ධයෙන් ඒ යුවළට කී පසු ඔවුන් කියා ඇත්තේ පුද්ගලයාගේ පෙනුම, කතාබහ, හැසිරීම් විලාසය ආදී කරුණු අනුව බලනවිට ඔහු තුළ කිනම් හෝ ආධ්‍යාත්ම ශක්තියක් ඇති බව තමන්ට වැටහුණු බවය.

**"කොහොමහරි ඔන්න පහුගිය දවස්වල මේ අනුරාධපුරය අවට තැන් කීපයකම කඩුපුල් පිපිලා තිබුණා. මේ කිට්ටුව තියෙන කටුකැලියාව හරියේ කඩුපුල් පිපිලා තියෙනවා මටත් බොහොම අහම්බෙන් දකින්න ලැබුණා. ඊට පහුවෙනිදා උදේ මම අර මහත්තයට ටෙලිෆෝන් කරලා, 'ඔන්න දැන් මෙහේ නම් තැන් කීපයක කඩුපුල් පිපිලා තියෙනවා. අර මනුස්සයා කඩුපුල් පූජාව ගැන මොනවාහරි කිව්වද?' කියලා ඇහුවා. එතකොට, 'තාම නම් නෑ, සමහර වෙලාවට ඒ මනුස්සයට ඒවා හොයාගන්න බැරි වුණාද දන්නෙත් නෑනේ' කියලා කිව්වා. ඒත් එතකොට මම කිව්වා, 'ඒ වුණාට ඉතින් විශ්ව ශක්තිය තියෙන කෙනෙකුට එහෙම වෙන්න විදියකුත් නෑ නේද?' කියලා."** මුතුබණ්ඩා මහතා කීය.

කෙසේ හෝ සිත තුළ පැනනැගුණු සැකය සහ කුතුහලය නිසා ඔහු දී ඇති දුරකතන අංකය භාවිතාකොට උපායශීලී ලෙස ඔහු හමුවිය හැකි ක්‍රමයක් පිළිබඳව මම මුතුබණ්ඩා මහතා දැනුවත් කළෙමි.

**"අර ශක්‍ර දෙවියන්ට පින් දෙන්න කඩුපුල් මල් පූජා කරන මනුස්සයව මම හොයාගත්තා. මම යනකොට මිනිහා නහයෙන් කටින් එන්න කසිප්පු ගහලා පාළු ගෙදරක තව ඒ වගේ කීපදෙනෙක් එක්ක බජව්වක් දනවා."**

මගේ ඉල්ලීම පිට ඒ පුද්ගලයා ගැන සොයාබැලූ මුතුබණ්ඩා මහතා කීයේ අනුරාධපුර පූජා නගරය ආශ්‍රිතව සිදුවෙන ආධ්‍යාත්මික ජාවාරම් ජාලය පිළිබඳ එක් නිදසුනක් පමණක් අප හමුවට ගෙන එමිනි. කෙසේ වෙතත් අද වනවිට අප රටේ පාලකකාරකාදීන් පවා මෙවන් මිථ්‍යා ජාවාරම්කරුවන්ගේ, කාරියන්ගේ ගොදුරු බවට පත්වීම ජාතික ඛේදවාචකයක් දක්වාම දුරදිග ගොස් තිබීම කණගාටුවට කරුණකි.

**කොහොමහරි ඒ මනුස්සයගේ කතාවට පැහැදුනු ඒ නෝනයි මහත්තයයි වියදමට තියාගන්න කියලා රුපියල් පන්දාහක් දීලා**



මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

# ඉන්දියාවේ ගෑනු මෝදිව ගෙදර යවයිද?



කයිවාරුවලටයි, පුහු ආටෝපවලටයි වඩා ගෑනු කවදත් කැමති වුණේ පිරිමින්ගේ 'පිරිමිකමට'නේ. ඔය පිරිමිකම කියන එක විවිධ විදියට නිර්වචනය කරන්න පුළුවන් වුණාට අධ්‍යාත්මික කාරණා ඇරුණම පිරිමියෙකුගේ බාහිර පෙනුමත් ඒකට අදළයි. උස, මහත, රැවුල, කොණ්ඩෙ විතරක් නෙවෙයි සමහරවිට හඬත්, පිරිමියෙකුගේ පිරිමිකම තීරණය කරන එක සාධකයක්.

කෙහොම වුණත් අසල්වැසි රටේ අගමැති නරේන්ද්‍ර මෝදිගේ පිරිමිකමට ඒ රටේ මිලියන ගණනක් ගැහැනු වහවැටිලා කියලා තමයි විදෙස් ආරංචි මාර්ග කියන්නේ. අවුරුදු 71ක් වුණාට මොකද මෝදි තාමත් මැතිවරණ වේදිකාවල මාකට් කරන්නේ මේ පිරිමිකමලු.

පහුගිය පෙබරවාරි-මාර්තු මාසවල ඉන්දියාවේ පවත්වපු ප්‍රධාන ප්‍රාන්ත මැතිවරණවලදී මෝදිගේ භාරතීය ජනතා පක්ෂය ලැබූ සාර්ථකත්වයට හේතුවත් මේ කාරණාව කියලයි දේශපාලන විචාරකයන්ගේ අදහස. 1962 ඉඳලා ඉන්දියාවේ මහ මැතිවරණවල ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතය වෙන් කරලා පෙන්වන්නෙ ස්ත්‍රී-පුරුෂභාවය අනුව. එහෙම බලද්දි මෙතුවක් කාලෙකට ඒ රටේ කාන්තාවන් වැඩි ප්‍රමාණයක් මහ මැතිවරණවලදී ඡන්දය දීලා තිබුණේ කොන්ග්‍රස් පක්ෂයට.

මොකද ඉන්දියාවේ අනිත් පක්ෂවල වගේ භාරතීය ජනතා පක්ෂයේ ස්ත්‍රීවාදීන් හෝ ස්ත්‍රීන් වෙනුවෙන් කතා කරන අය හිටියෙ නෑ. ඒ වගේම ඒ පක්ෂයේ මුහුණුවර වුණත් කාන්තාවන්ට වැඩිය රිස්සුවේ නෑ. අපේ සමහර අයට වගේ මේ පක්ෂයේත් පක්ෂ නායකයොන්ගේ කටවල්වලට බ්‍රේක් නැති වුණාම ඒගොල්ලො ස්ත්‍රීවිරෝධී ප්‍රකාශ තමයි වැඩිපුර කළේ. එච්චර විතරක් නෙවෙයි මේ කට්ටියගෙ පාලනය යටතේ පවතින ඇතැම් ප්‍රාන්ත රජයන් ස්ත්‍රී දූෂණ නඩු හසුරුවන විදිය ගැන එහෙම කතා කරන්නම දෙයක් නෑ.

භාරතීය ජනතා පක්ෂයේ පැටිකිරිය එහෙම වුණාට 2019 ඉඳලා කොන්ග්‍රස් පක්ෂයට කාන්තාවන්ගේ වැඩි ඡන්ද ලැබෙන එක නතර වෙන්න පටන්ගත්තා. ඒකට හේතුව 'මෝදි' කියලා තමයි දිල්ලියේ බුද්ධි මණ්ඩලයක් වන සංවර්ධිත සමාජ අධ්‍යයන මධ්‍යස්ථානය (CSDS) නම් කියන්නෙ.

**මෝදි පපුව ඉස්සරහට දාලා තමන්ගේ අඟල් 56 පපුව ගැන කතා කරන හැම වෙලාවකම කාන්තා ඡන්ද දායකයින් වාඩිවෙලා ඉන්න පැත්තෙන් විමතිය දනවන විදියේ ශබ්ද නිකුත් වෙනවලු**

"**පක්ෂය කාන්තාවන්ගේ සිත් දිනාගැනීම එක රැයින් වෙච්ච දෙයක් නෙවෙයි. මෝදි, එහි අනිවාර්යය වගේම ප්‍රධාන සාධකයක්**" කියලා CSDS වැඩිදුරටත් කරුණු දක්වමින් පවසනවා. 2019දී ජාතික මට්ටමින් සිද්ධ වෙච්ච මේ විශාල වෙනස පටන්ගත්තේ 2007 අවුරුද්දේ බටහිර ගුජරාට් ප්‍රාන්තයේ මහ ඇමතිවරයා විදියට මෝදි පත්වුණාට පස්සෙලු. දේශපාලන විද්‍යාඥයෙක් සහ කතුවරයෙක් වෙච්ච නලීන් මෙහ්තා, මෑතකදී පලකළ The New BJP කියන පොතේ තමයි එහෙම සඳහන් වෙන්නේ.

ඒ වගේම රටේ ගෑනුත් එක්ක එද පටන් කෙහෙවලු පටලවගත්ත භාරතීය ජනතා පක්ෂය මෙච්චර ස්ත්‍රී ආකර්ෂණයක් දිනාගන්න හේතුව මෝදිගෙ හැඩිදැඩි පපුව කියලත් මෙහ්තාගේ පොතේ සඳහන් වෙනවා. මොකද මැතිවරණ ප්‍රචාරක රැස්වීම්වල ඔහු නිතරම කතා කරලා තියෙන්නේ අඟල් 56ක් පළල ඔහුගේ පපුව ගැනලු. ඒක හින්දි භාෂාව කතා කරන ප්‍රාන්තවල ප්‍රබලයෝ දෙසාබාන පුරසාරමක් කියලයි පොතේ විස්තර වෙන්නේ. මෝදිට තියෙන දේශපාලන ඉතිහාසය නිසා මැතිවරණ වේදිකාවල මෙහෙම පාරම්බාන වැඩේ සමහරවිට ඔහුට තවත් ලේසි වෙන්න ඇති.

එච්චර විතරක් නෙවෙයි මෝදි පපුව ඉස්සරහට දලා තමන්ගේ අඟල් 56 පපුව ගැන කතා කරන හැම වෙලාවකම කාන්තා ඡන්ද දයකයින් වාඩිවෙලා ඉන්න පැත්තෙන් විමතිය දනවන විදියේ ශබ්ද නිකුත් වෙනවලු. එකත් එකටම ඉතින් එහෙම හැඩිදැඩි පිරිමි පපුවක් ඉස්සරහ ගෑනුන්ගෙ ගෑනුකම එළියට එන එක පුදුම වෙන්න දේකුත් නෙවෙයි.

සමහර පිරිමින්ගේ පිටට පේන්න පපුව පිම්බිලා තිබුණට මොකද ඒක යට ගැහෙන හදවත කිසි කමකට නෑනේ. ඉන්දියාවේ අගමැති ගැන මේ කතාව කියද්දි අපේ වර්තමාන අගමැති මහින්ද රාජපක්ෂ මහත්තයත් අමතක කරන්නම බෑ. දැන් තත්ත්වෙ මොකක් වුණත් එතුමත් කාලයක් මේ රටේ බහුතරයක් කාන්තාවන්ගේ ආකර්ෂණය දිනාගත්තු පාලකයෙක්. එතුමගේ පපුවෙ දිග, පළල ගැන කියන්න නම් අපි දන්නෙ නෑ. හැබැයි එතුමා අර '**පළමුවත් රට, දෙවනුවත් රට, තුන්වෙනුවත් මගේ රට අපේ හාන්දුරුවනේ**' කියලා පපුවට අත්දෙක ගහගෙන කියද්දි නම් ඉතින් අපේ ගෑනු හිතුත් හෙලවුණේ නෑ කියලා හිතට එකඟව කියන්න පුළුවන්කමක් නෑ.

**මේ කතාව කියද්දි අපේ වර්තමාන අගමැති මහින්ද රාජපක්ෂ මහත්තයත් අමතක කරන්නම බෑ. දැන් තත්ත්වෙ මොකක් වුණත් එතුමත් කාලයක් මේ රටේ බහුතරයක් කාන්තාවන්ගේ ආකර්ෂණය දිනාගත්තු පාලකයෙක්. එතුමගේ පපුවෙ දිග, පළල ගැන කියන්න නම් අපි දන්නෙ නෑ. හැබැයි එතුමා අර 'පළමුවත් රට, දෙවනුවත් රට, තුන්වෙනුවත් මගේ රට අපේ හාන්දුරුවනේ' කියලා පපුවට ගහගෙන කියද්දි නම් අපේ ගෑනු හිතුත් හෙලවුණේ නෑ කියලා හිතට එකඟව කියන්න පුළුවන්කමක් නෑ**

අපේ අගමැතිතුමා එහෙන් කොපි කළාද, එහෙ අගමැතිතුමා අපෙන් කොපි කළාද කියලා කියන්න දන්නෙ නැති වුණාට මෝදිත් නිතරම කාන්තාවෝ ඉස්සරහට ගිහින් කියනවා කියන්නේ "**මම ඔබේ සහෝදරයා, මම ඔබේ පුතා, මට ඡන්දය දෙන්න, මම ඔබව බලාගන්නම්**" කියලලු. අපේ අගමැතිතුමත්, ජනාධිපති වෙලා ඉන්න කාලේ ටිකක් වෙනස් විදියට මේ කතාවම කිව්වා දූවරු ටිකක් ඉස්සරහට ගිහින්. "**මම තමයි ඔබේ ආඩම්බරකාර තාත්තා**" කියලා. වළක්වන්නම බැරි හේතුවක් වුණොත් මිසක් තාත්තලා විශේෂයෙන් දුවලට දෙන පොරොන්දු කඩන්නෙ නෑ. සමහර විට මහින්ද මහත්තයත් එහෙම කාරණාවක් නිසා අසරණ වුණාද කියලා කවුද දන්නෙ? ඒ ආඩම්බරකාර තාත්තාව තමන්ගේ පපුවල කොටාගනිපු තරුණ දූලා පුතාලා මෙහෙම පාරට බැහැලා පොරොන්දු කඩකිරීමේ වේදනාව පිට කරද්දි එහෙම නැත්නම් මොන අප්පටද බලන් ඉන්න පුළුවන්?

2014 අවුරුද්දෙ මෝදි ඉන්දියාවේ අගමැති වෙලා ජාතිය අමතා කළ මුල්ම කතාවේ ගැහැනු කළල ගබ්සා කිරීම්වලට එරෙහිව කතා කිරීම, ස්ත්‍රී දූෂණ හෙළා දැකීම සහ වඩාත් හොඳ පුතුන් හදන්නට දෙමාපියන්ට උපදෙස් දීම වගේ කාරණා ටිකක් නිසා ස්වභාවයෙන්ම හැඟීම්බර කාන්තාවන්ගේ හදවත්වලට ළංවෙන්න ඔහුට පුළුවන් වුණා. මේවට අමතරව මෝදි භාරතීය ජනතා පක්ෂය තුළත් අද වනවිට කාන්තාවන්ට වැඩි නියෝජනයක් ලබාදීලා තියෙනවා.

ඒ කොහොම වුණත් යමෙකුගේ බාහිර පෙනුම හෝ පෞරුෂය කේන්ද්‍ර කරගෙන ලැබෙන ස්ත්‍රී-පුරුෂභාවය මත පදනම් වූ සහයෝගයට වැඩි ආයුෂ නෑ කියලයි අශෝක විශ්වවිද්‍යාලයේ මාධ්‍ය අධ්‍යයන අංශ ප්‍රධානී, ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදිනී මායා මිර්චාන්දනී කියන්නේ.

"**මෝදි ඉතා ආකර්ෂණීයයි. ඔහුගේ ආධාරකරුවන් ඔහු සරල ජීවිතයක් ගත කරන සරල මිනිසකු ලෙස දකිනවා. ඔවුන්ට ඔහු ආකර්ශනීය වන්නේ ඔහුගේ දේහය ශක්තිමත් නිසායි. පිටස්තර අලංකාරවලට වැඩි තැනක් නොදුන්නත්, සමාජයට පැමිණීමේදී ඔහුට නිර්මලබවක් තිබෙනවා. නමුත් ඔහුට දැනටමත් අවු.71ක්. ඒ නිසා සමහර දේවල් වයසත් එක්ක මැකී යාවි.**"

ඒ කතාවෙත් ඇත්තක් නැත්තෙම නෑ. විරැකියාව, උද්ධමනය, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල වගේම ඉන්ධන මිලත් නිරන්තරයෙන් ඉහළ යද්දී ඒ ගින්දර අඟල් 56ක් පළල පපුවේ හංගගෙන පිටට නොදී ඉන්න බැරි වුණොත් මෝදිව ගෙදර යවන්නත් මුලින්ම පාරට බහින්නේ ඒ පපුවට ප්‍රේම කරපු කාන්තාවොම වෙන්න බැරිකමක් නෑ.

සුරා

# එකම නම තියෙන දෙන්නෙක්ගේ ඉරණම වෙනස් වෙන්න

# ඉස්පිල්ලක වෙනසකුත් ඇති



නම කෙනෙක්ගේ අනන්‍යතාවයය. එහෙත් එක නම් ඇති අය බොහෝය. එක පන්තියක එක නම් ඇති දරුවෝ දෙදෙනෙක්වත් ඇත. එක පාසලේ එක නම් ඇති දරුවෝ අපමණය. කාර්යාලයකද එක නම් ඇති අය දෙතුන් දෙනෙක්වත් ඇත. නම එක වුවත් එක නම් ඇති අය විවිධය. රුවෙන්, ගුණෙන් පමණක් නොව අධ්‍යාපනයයෙන්, රැකියාවෙන්ද විවිධය. නමක පලාපල එක වේ නම් එක නම් ඇති අය විවිධ වන්නේ කෙසේද? ඒ පැනයට පිළිතුරු දෙන්නේ නාම හා ශබ්ද ශාස්ත්‍රඥ වෛද්‍ය නිවංක දිනාරංග රත්නායක මහතාය.

**"පුද්ගලයෙක්ගෙ නමකට කොටස් කිහිපයක් තියෙනවා. නම, දෙවැනි නම, තවත් අයට තුන්වෙනි නමකුත් තියනවා. ඒ වගේම වාසගම, පෙළපත් නම මේ හැමදෙයක්ම නමක කොටස්.**

**නමකින් පලාපල කියනවා කියන්නේ මුල නමට පලාපල කියන එක නෙමෙයි. අපේ රටේ නම් තැබීමේදී මතයක් තියනවා චන්ද්‍ර, දේව, සූර්ය, භූමි කියන ගණ සුබයි කියලා. ඒත් නාම ශාස්ත්‍රයේදී ඒ ගැන සලකන්නෙම නෑ. අපි නමක සුබ අසුබ බලන්නේ සම්පූර්ණ නමින්.**

**වාසගම්, පෙළපත් නම් ඇතුළු සම්පූර්ණ නම සහිත අය ඉන්නේ බොහොම කලාතුරකින්. හැබැයි එහෙම නෑ කියන්නත් බෑ. එහෙම ඉන්න පුළුවන්. අකුරකවත් වෙනසක් නැතුව සම්පූර්ණම නම සහිත දෙන්නෙක්ගෙ පලාපල එක සමානයි.**

**අධ්‍යාපනය, රැකියාව, ආකර්ෂණය, විවාහය, ආර්ථිකය මේ හැම දෙයක්ම එක හා සමානයි. නමුත් එක අකුරක හෝ වෙනසක් තියනවා නම් පලාපල සම්පූර්ණයෙන්ම වෙනස් වෙනවා."**

විජේරත්න ආරච්චිගේ ඉසුරු චාමර විජේරත්න කුඩා අවධියේ සිට විවිධ ප්‍රශ්නවලට මුහුණ දුන් පුද්ගලයෙකි. කුඩා කාලයේ දෙමාපියන් අහිමි වූ අතර දුෂ්කරතා මැද ඇති දැඩි වූයේ මිත්තණිය සමඟය. අධ්‍යාපනය පිළිබඳවද ඉසුරුගේ දක්ෂතාවක් හා උනන්දුවක් නොවීය. වැඩිදුර අධ්‍යාපනයට කැමැත්තක් නොදැක්වූ ඉසුරු උසස් පෙළින් පසු රැකියාවක් සොයා ගත්තේ ආර්ථික ප්‍රශ්න නිසාමය.

**ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් සොයන්නට රැකියාවට ගිය ඉසුරු ගෙදර ආවේ පෙට්ටියකින්ය. ඒ ආයතනයේ හිතවතුන් සමඟ මළ ගෙදරක ගොස් ගිය බස්රථයටම යට වී අවසන් ගමන් ගිය නිසාය**

ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් සොයන්නට රැකියාවට ගිය ඉසුරු ගෙදර ආවේ පෙට්ටියකින්ය. ඒ ආයතනයේ හිතවතුන් සමඟ මළ ගෙදරක ගොස් ගිය බස්රථයටම යට වී අවසන් ගමන් ගිය නිසාය. ජීවිතයෙන් සමුගන්නා විට ඉසුරුගේ වයස අවුරුදු 20ක්ය. උපන්දා සිට ජීවිතයේ දුකම විඳගත් ඒ අහිංසක තරුණයා ජීවිතයෙන් සමුගත්තේ නාඹර තරුණ වියේදීය.

**නාම ශාස්ත්‍රඥ වෛද්‍ය නිවංක පවසන ආකාරයට ඉසුරුට විනයක් වූයේ ඔහුගේ නමය**

නාම ශාස්ත්‍රඥ වෛද්‍ය නිවංක පවසන ආකාරයට ඉසුරුට විනයක් වූයේ ඔහුගේ නමය. ඒ නම නාම හා ශබ්ද ශාස්ත්‍රයට අනුව අසුබය. නමුත් අප කවුරුත් දන්නා ලඝු ගුරු ශාස්ත්‍රයට අනුව ඉසුරු දේව ගණයේ සුබ නමක්ය. එහෙත් ඉසුරුට නමෙන් ඉසුරුමත් ජීවිතයක් හිමි නොවුණේ නාම ශාස්ත්‍රයට අනුව ඒ නම අසුබ පිහිටීම් රාශියක් සහිත නමක් නිසාය.

**"ඉසුරු බැලූ බැල්මට ගණ හොඳ නමක්. නම හොඳ නම් ඉසුරුට අකාලයේ ජීවිතයෙන් සමුගන්න වෙන්නෙ නෑ. මේ ඉසුරුට මෙහෙම වුණාට හැම ඉසුරුගෙම ඉරණම එක වගේ වෙන්නෙ නෑ.**

**එහෙම වෙන්නේ මම මුලදිත් කිව්වා වගේ නමක සුබ අසුබ කියන්න සම්පූර්ණ නමම හේතුවක් වන නිසා. ඉසුරු විජේරත්නගේ නමට අනුව කුඩා කාලයේදීම මව හා පියාගෙන් වෙන් වෙනවා.**

**ආදරය සෙනෙහස අහිමි වෙනවා. ආර්ථික අතින් දුර්වල නමක්. විවාහය තෙක් හිටියා නම් විවාහයත් ආසාර්ථකයි. ආයුෂ අඩුයි. පෞරුෂය ගත්තත් ආකර්ෂණීය චරිතයක් වෙන්නෙ නෑ. ඉසුරු දේව ගණ වුණාට ඉසුරුට දෙවියන්ගෙ බැල්මවත් ලැබුණෙ නෑ.**

**විජේරත්න ආරච්චිලාගේ ඉසුරු චාමර විජේරත්න කියන නම පෙර කිව් නමින් වෙනස් වෙන්නේ එක අකුරකින් විතරයි. ඒ වෙනස තමයි විජේරත්න ආරච්චි වෙනුවට විජේරත්න ආරච්චිලාගේ. එක අකුරක**

**විජේරත්න ආරච්චිලාගේ ඉසුරු චාමර විජේරත්න කියන නම පෙර කිව් නමින් වෙනස් වෙන්නේ එක අකුරකින් විතරයි. ඒ වෙනස තමයි විජේරත්න ආරච්චි වෙනුවට විජේරත්න ආරච්චිලාගේ. එක අකුරක වෙනසක් තියෙන්නේ. ඒත් මේ දෙන්නගේ නම් වල පලාපල අහස පොළොව වගේ**

**වෙනසක් තියෙන්නේ. ඒත් මේ දෙන්නගේ නම් වල පලාපල අහස පොළව වගේ. විජේරත්න ආරච්චිලාගේ ඉසුරුට දෝෂයකට කියලා තියෙන්නේ විවාහ දෝෂයක් විතරයි. සහකාරියට ගැලපෙන නමක් ලැබිලා තිබුණොත් ඒ ප්‍රශ්නයත් හරි. දියුණුව උපරිමයෙන් තියෙන නමක්. අධ්‍යාපනයටත් සුබ පිහිටීම් තියනවා. විදෙස් ලැබීම්, විදෙස්ගත වීමේ වාසනාව තියනවා. පිරිස් බලය හොඳින් තියන පුද්ගලයෙක්. නායකත්වයට සුදුසු චරිතයක්.**

**ආකර්ෂණීය පුද්ගලයෙක්.**

**මේ නම තියන කෙනෙක් ඉන්නවා නම් බය නැතිව කියන්න පුළුවන් මේ තමයි එයාගෙ පලාපල. අකුරක වෙනසකින් කෙනෙක්ගෙ දෛවය කණපිට හැරුණේ නාම හා ශබ්ද ශක්තියේ ඇති ප්‍රබල බව නිසයි. මෙන්න මේ නිසා අලුත උපන් දරුවෙක්ට නමක් තියන විට නමේ ලස්සන, තේරුම විතරක් නෙමෙයි ඒ නම නාම හා ශබ්ද ශක්තියට ගැලපෙනවාද කියලත් බලන්න ඕනෑ. එහෙම නැතුව අපි දන්න සුබ ගණ හතරින් නම තිබ්බට වැඩක් නැහැ. ඒ ගණ හොඳයි සෙත් කවි හදන්න. නම් හදන්න ඒ ගණ සුදුසු නෑ කියලා මම වගකීමෙන් කියනවා."**



නාම හා ශබ්ද ශාස්ත්‍රඥ
නිවංක දිනාරංග රත්නායක

හිමේෂා සවන්තී රාජපක්ෂ

## එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධව සිට පුනරුත්ථාපනය වූ

# විභාග ප්‍රතිඵල A-8ක් මරාගෙන මැරෙන අදහස

පාසල් ගිය හිටපු එල්.ටී.ටී.ඊ. බාලවයස්කාර සාමාජිකාවන් කීපදෙනෙකු පිළිබඳව ඉකුත් සතියේදී කතා කළෙමි

**“මාධ්‍ය මගින් මම දැකලා තියෙනවා ශ්‍රී ලංකාවට වගේම හමුදවට යුද අපරාධ චෝදනා එල්ල කරනවා. මේක සැරෙන් සැරේ සිද්ධ වෙන දෙයක්. නමුත් රජයට භාරවුණ එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ගේ සුබසාධනය වෙනුවෙන් කරපු දේවල් ගැන ඒ අයගේ අවදනයක් නැහැ. ඒ නිසා අධ්‍යාපනය අහිමි වෙලා ඉඳපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට අධ්‍යාපනය ලබාදෙන්න කරපු දේවල් ගැනත් සටහන් කරලා තියන්න”** යනුවෙන් කපිතාන් ජයනි සිය කතාව ආරම්භ කළාය.

**“යුද්ධය ඉවර වෙද්දී 500-550 අතර වගේ බාලවයස්කාර එල්.ටී.ටී.ඊ. සාමාජික සාමාජිකාවන් පිරිසක් පුනරුත්ථාපනයට යොමු කරලා තිබුණා. මේ අයට නැවත අධ්‍යාපනය දෙන්න කැමැත්ත ඇහුවම ඉදිරිපත් වුණේ ටික දෙනයි. ඒකට හේතුවක් තිබුණා. සමහර ළමයි එල්.ටී.ටී.ඊ. එකට ගිහින් තිබුණේ ප්‍රාථමික පංතිවලින්ම අධ්‍යාපනය කඩාකප්පල් කරගත්තට පස්සේ. තවත් සමහරු අඩු වයසෙන් එල්.ටී.ටී.ඊ. එකට බැඳිලා අවුරුදු 3-4 ගරිල්ලා සාමාජිකයෝ විදියට කටයුතු කරපු අය. ඒ අයට වයස 17-18ක් වුණාට පාසලට ඇතුළත් කරන්න වෙලා තිබුණේ 7-8 ශ්‍රේණිවලට. වයසෙන්, ශරීරයෙන් ලොකු ළමයි නිසා පොඩි පංතිවලට යන්න කැමති වුණේ නැහැ. අධ්‍යාපනයේ වැදගත්කම පහදලා දුන්නම 300ක් විතර වගේ ළමයි නැවත පාසල් යන්න ඉදිරිපත් වුණා”** යැයිද කපිතාන්වරිය පැවසුවාය.

එසේ ඉදිරිපත් වූ පිරිසද පාසල් යැවීම පුනරුත්ථාපන නිලධාරීන්ට අභියෝගයක් විය. ඒ මක්නිසාද යත් ඔවුන් සතුව උප්පැන්න සහතික, අධ්‍යාපන සහතික හෝ පාසල් හැර යාමේ සහතික ආදී ලියවිලි කිසිවක් නොතිබීමයි. ඇතැමුන්ට භාරකරුවන් සිටියේද නැත. ඒ නිසා මුලින්ම ඔවුන්ට උප්පැන්න සහතික සාදදීමට සිදුවිය. පාසලට ඇතුළත් කළේ ඉන් අනතුරුවයි.

**“රත්මලාන හින්දු විදුහලේ තමයි මේ ළමයින්ට ඉගෙනගන්න සූදනම් කරලා තිබුණේ. එතැන නේවාසිකාගාරයකුත් ප්‍රතිසංස්කරණය කරලා ළමයින්ට සූදනම් කරලා තිබුණා. මේක පාසලක් වුණාට මේ ළමුන් භාරව පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක වුණා. එතැන ප්‍රධානියා විදියට කටයුතු කළේ කර්නල් හර්මන් ප්‍රනාන්දු සර්. අපේ උදව්වට පොලිස් නිලධාරීන් සහ නිලධාරිනියන් කීපදෙනෙකුත් හිටියා. මේ ළමයින්ට වෙනම පංති තිබුණා. හැබැයි ඒ පාසලේ මුල ඉඳන් හිටපු ළමයිනුත් ඉගෙනගත්තා.**

**බාලවයස්කාර ගරිල්ලා සාමාජිකයන් (ළමා සොල්දදුවන්) පිරිසකට අධ්‍යාපනය දෙනවා කීවාම ගොඩක් අය උදව් කරන්න ඉදිරිපත් වුණා. විවිධ පුද්ගලයෝ වගේම ආයතනත් ඉදිරිපත් වුණා. ඒ වගේ විදේශ ආයතනත් තිබුණා. සමහර ධනවත් අය තමන්ගේ උපන්දිනය සැමරුවේ මේ පාසලට ඇවිත්. ළමයින්ට තෑගිභෝග දීලා, සිංදු කියලා සතුටු වෙලා යනවා. අපි මේ ළමයින්ට වෙනම නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක් තිබ්බා. එංගලන්තෙ ‘ක්‍රිකට් ෆෝ චේන්ජ්’ කියලා ආයතනයක් ඇවිල්ලා එංගලන්තෙයි, ලංකාවෙයි පුහුණුකරුවන් ඇවිත් ක්‍රිකට් කඳවුරකුත් තිබ්බා. කොළඹ SSC එකේ තරගයකුත් තිබුණා. එතැනදී ලොකු මුදලක් වුණු අංග සම්පූර්ණ ක්‍රිකට් ක්‍රීඩා උපකරණ**



**සංගීත ගුරුවරියක් මෙන්ම ක්‍රීඩිකාවක ලෙසද දස්කම් දක්වා ඇති කපිතාන් ජයනි හේරත් කලක් අධ්‍යාපන අමාත්‍යංශයේ ක්‍රීඩා සංවිතයේත් රාජකාරි කර ඇත. 1996දී දෙවන ලුතිනන්වරියක ලෙස ජාතික ශිෂ්‍ය භට බළකායට එක්වූ ඇය 2006 වසරේදී සක්‍රීය හමුද සේවයට එක්වී ඇත.**

**පසුව ඇය යුද සමයේ අවසාන කාලයේදී හමුද භාරයට පත්වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකාවන්ගේ පුනරුත්ථාපන රාජකාරියටද එක්වූ අතර එලෙස පුනරුත්ථාපනය වූ කොටි සාමාජිකාවන් ගැන කපිතාන් ජයනි හේරත් කියන කතා පෙළයි මේ.**

**සංකර්ව කොළඹ D.S.සේනානායක විද්‍යාලයට භාරගන්න ලියුමත් ගැහුවට පස්සෙ දෙමව්පියෝ විරුද්ධ වුණා**

**කට්ටයක් හැම ළමයෙකුටම නොමිලයේ දුන්නා. ගුවන්විදුලියේ ‘හඳමාමා’ වගේ ළමා වැඩසටහන්වලට සම්බන්ධ කළා. ඒ කාල යේ පුනරුත්ථාපන කටයුතු භාරව හිටපු සුහද ගම්ලත් සර් (හිටපු සොලිස්ටර් ජෙනරාල්) ඇවිත් අපට උපදෙස් දුන්නා, ‘මේ ළමයි කැලෑවේ ජීවිතය ගත කරපු අය, මේ අයට ලෝකය පෙන්නන්න, ජීවිතය ගැන ආස හිතෙන විදියට මනස හදන්න’ කියලා. ඊටපස්සේ අපි ළමයින්ව ගල්කිස්ස වෙරළට එක්කරගෙන ගිහින් විනෝද වෙන්න අවස්ථාව සලසලා දුන්නා. ළමයින්ව කණ්ඩායම් කරලා තරු පහේ හෝටල්වල කෑමට එක්කරගෙන ගියා. Pizza Hut, KFC වගේ තැන්වල කෑමට එක්කරගෙන ගියා. මේ දේවල්වලට සමහර ආයතන අනුග්‍රහය දැක්වුවා. ඒ වගේම තමයි පාසල් උපකරණ, පොත්, බෑග්, ක්‍රීඩා උපකරණ වගේ දේවල් ලැබුණා. මේ දේවල් ඒ පාසලේ ළමයිනුත් දකිනවා. දවසක් මේ ළමයි කීපදෙනෙක් අපිත් එක්ක කතාවට වැටුණා. ඒ වෙලාවේ ඒ ළමයි කියනවා,**

**‘මැඩම් අපිත් එල්.ටී.ටී.ඊ. එකට ගිහින් හිටියනම් හරි නේද?’ කියලා.**

**‘ඒ ඇයි?’ කියලා මම ඇහුවා.**

**‘එතකොට අපිටත් තෑගිභෝග, ඉස්කෝල බඩු, ඇවිදින්න එහෙම යන්න ලැබෙනවනේ’ කියලා කීවා.”**

**“පාසලේ එල්.ටී.ටී.ඊ. ළමයින්ගේ විනය, හැසිරීම එහෙම කොහොමද?”** මා ඇසීමි.

**“ළමයි අපි කියන දේවල් අහලා හොඳ**



හිටපු එල්.ටී.ටී.ඊ සාමාජිකාවන්ගෙන් සැදුම්ලත් හින්දු විදහලේ ක්‍රිකට් කණ්ඩායම



රත්මලාන හින්දු විදුහලේ ඉගෙන ගත් එල්.ටී.ටී.ඊ හිටපු සාමාජිකවාන්

**විනයක් ඇතිව හිටියා. ඒ ගැන ඉස්කෝලේ ආචාර්ය මණ්ඩලයටත් පුදුමයි. හැබැයි දවසක හොඳ සිදුවීමක් වෙලා තිබුණා. අපේ මධ්‍යස්ථාන ප්‍රධානී කර්නල් ප්‍රනාන්දු සර් ඉස්කෝලේ පංති කාමර බලාගෙන යද්දි දැකලා තියෙනවා අපේ ළමයෙක් පංතියේදී විනය විරෝධී විදියට හැසිරෙනවා. නමුත් එතැන ඉඳපු ගුරුවරිය දැක්කෙ නැහැ වගේ ඉන්නවා කියලා. මේ ගැන ප්‍රනාන්දු සර් ගුරුවරියගෙන් අහලා තියෙනවා. එතකොට ඒ ගුරුවරිය කියලා තියෙනවා,**

**‘සර් මගේ ගම යාපනය. යාපනයේදී මේ අය කොටි නිලඇඳුම් ඇඳගෙන අපේ පවුලට**

**දැන් මෙයාලා ළමයි වුණාට මේ අය එල්.ටී.ටී.ඊ. කියන දේ මගේ හිතේ තියෙනවා**

**කරපු හිරිහැර නිසා තමයි යාපනය අත්හැරලා මෙහේ පදිංචියට ආවේ. දැන් මෙයාලා ළමයි වුණාට මේ අය එල්.ටී.ටී.ඊ. කියන දේ මගේ හිතේ තියෙනවා. ඒ නිසා මෙයාලට දඬුවම් කරන්න බයයි පස්සේ මට කරදරයක් කරාවි කියලා.’**

**සමහරු ගුරුවරු විතරක් නෙමෙයි ඉස්කෝලේ ළමයිනුත් අපේ ළමයින්ට බයයි.**

**මොකද මෙයාලා එල්.ටී.ටී.ඊ. හිටපු අය නිසා බෝම්බ ගහාවි, වෙඩි තියාවි කියලා ඉස්කෝලෙ ළමයි මේ අයට බැණලා රණ්ඩු වෙලා නැහැ.”**

කතුන්ගේ සුබිත මුදිත ජීවිත කතා පෙළ - 07 වැනි කොටස

# කියලා දැනගත්තම අතෑරලා පැනලා ගියා

"මුලින්ම අඹේපුස්ස මධ්‍යස්ථානය ආරම්භ කරද්දී යුද්ධය යනවා. මේ මධ්‍යස්ථනයේ ඉඳපු එක තරුණයෙක්ට වැඩි වයසක් නැහැ. ඒ නිසා එයාගෙන් විස්තරය ඇහුවා. ළමයගේ නම සංකර්.

'සර් මම සාමාන්‍ය පෙළ විභාගයට ලියපු ගමන්ම මරාගෙන මැරෙන බළකායට බැදුණා. එතැනදී පුහුණුවක් දීලා මාව වව්නියාවට එව්වා, මට නියෝග කරන දවසක බෝම්බ අඩංගු මෝටර් සයිකලයකින් ගිහින් හමුදා බස් රථයක හප්පන්න කියලා. ඉලක්කය, මෝටර් සයිකලය අදාළ දිනයේදී දෙන්නම් කිව්වා. ඔහොම ඉද්දී දවසක මට යාළුවෙක් හමුවුණා. එයාට කීවා මුලතිව් ගමට ගිය දවසක මගේ O/L ප්‍රතිඵල ඉස්කෝලෙන් බලාගෙන එන්න කියලා. ටික දවසකට පස්සේ එයා කීවා ඔයාගේ ප්‍රතිඵල තමයි ඉස්කෝලේ හොඳම ප්‍රතිඵල, A-08ක් තියෙනවා කියලා. එතැනින් පස්සේ මරාගෙන මැරෙන අදහස අත්හැරලා හැටන්වලට පැනලා ගිහින් නෑදෑ ගෙදරක නැවතුණා. එහෙ වැඩි දවසක් ඉන්න බැරිවුණා. එල්.ටී.ටී.ඊ. එකෙන් ඇවිත් මාව වව්නියාවට අරගෙන ආවා. වව්නියාවේදී සැක නොහිතෙන විදියට ප්‍රයිවට් ක්ලාස් ගියා. ඒ අතර තමයි පොලිසියෙන් මාව අත්අඩංගුවට ගත්තේ. එතැන ප්‍රශ්න කරලා තියාගෙන ඉඳලා මෙතැනට එව්වා.'



කර්නල් හර්මන් ප්‍රනාන්දු
හිටපු මධ්‍යස්ථාන භාර නිලධාරී

කියලා කීවා. එතැනදී මම දීපු මුල්ම උපදේශය තමයි මරාගෙන මැරෙන බළකායේ හිටපු විස්තර කාටවත් කියන්න එපා. මොකද දැනගත්තොත් අඹේපුස්ස ගමේ අයත් කලබල වේවි. අනිත් අතට එල්.ටී.ටී.ඊ. තර්ජනයකුත් ඇතිවෙනවා කියලා. මේ ළමයා මට කීවා 'සර් මට ඉස්කෝලේ ගිහින් ගණිත අංශයෙන් උසස් පෙළ කරන්න ඕන' කියලා. ඔහෙම ඉද්දි දවසක අපේ මධ්‍යස්ථාන බලන්න ගම්ලත් සර් අවා. එතුමට මේ විස්තරය කීවාම මේ ළමයට උදව් කරන්න ඕන කියලා කීවා. ටික දවසකින් ගම්ලත් සර් පණිවිඩයක් එව්වා කොළඹ D.S. සේනානායක විදුහලත් එක්ක කතා කළා එතැන විදුහල්පතිතුමා ළමයව භාරගන්න කැමති වුණා කියලා. තවත් දවස් කීපයක් යද්දි ළමයව D.S. එකට භාරගන්න අදාළ ලියුමත් ලැබුණා. ඒ ලියුම ලැබුණ දවසේ මධ්‍යස්ථානයේ ලොකු උත්සවයක්. ළමයිනුත් දෙමව්පියනුත් ඇවිත් සුහද හමුවක් තිබුණා. සංස්කෘතික උත්සවයකුත් තිබුණා. එදා අලුතින් පත්වුණු පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් දයා රත්නායක (පසුව හමුදාපති) සර්රුත් ඇවිත් හිටියා. එදා උත්සව වේදිකාවට සංකර්ට එන්න කියලා දයා රත්නායක සර්ගේ අතින් සංකර් D.S. එකට භාරගන්න අනුමැතිය ලැබුණ ලියුම භාරදුන්නා. මෙතැනට මාධ්‍යවේදීනුත් ඇවිත් හිටියා. මාධ්‍යවේදියෙක් සංකර් එක්ක කතා කළා. පහුවනිදා පත්තරේ ප්‍රවෘත්තියක් ගියා හිටපු මරාගෙන මැරෙන කොටි සාමාජිකයාට D.S. විදුහලේ ඉගෙනගන්න අවස්ථාව ලැබුණා කියලා. ඊට ටික කාලයකට කලින් D.S. සේනානායක විදුහලේ බේස්බෝල් කණ්ඩායම කොටුව දුම්රිය ස්ථානයේදී මරාගෙන මැරෙන ප්‍රහාරයට ලක්වෙලා සිසුන් කීපදෙනෙක්ම මරණයට ලක්වෙලා තිබුණා. ඒ නිසා දෙමව්පියන් D.S. එකට ගිහින් සංකර්ව භාරගන්න එකට විරුද්ධ වෙලා. ඊටපස්සේ එවකට D.S. විදුහල්පති අශෝක සේනානි ජයසිංහ මහත්තයා අපට දැනුම් දුන්නා සංකර්ව භාරගන්න එක ටිකක් කල්දාන්න කියා. ඒ වෙද්දි සංකර් ඉස්කෝලේ යන්න නිලඇඳුම්, පොත්, බෑග්, සපත්තු සේරම සකස් කරලා තිබුණේ. පෞද්ගලික ආයතනයකින් ඒ කාලේ ගොඩක් වටිනා උසස් පෙළ ගණිත අංශයට අදාළ පොත් නොමිලේම සංකර්ට දුන්නා.

සංකර් ඉස්කෝලෙ යන්න ආසාවෙන් හිටියේ. එයාගේ බලාපොරොත්තු කඩවෙලා දවසක් මට කීවා 'ඉස්කෝලේ යන්න බැරි වුණොත් මැරෙනවා' කියලා. අපිත් බයවුණා. ඔය කාලේ හිටියා නිශාගරා යසාගරා කියලා වයස අවුරුදු 16-17 වගේ අක්කලා නංගිලා දෙන්නෙක්. මෙයාගේ තාත්තට සිංහල පුළුවන්. මේ තාත්තා දයා රත්නායක සර්ට කීවා අපේ දුවලා ඉගෙනගන්න ආසයි කියලා. සංකර්ගේ පාසල් ප්‍රශ්නය නිසා අපිත් අමාරුවේ වැටිලා හිටියේ. ඒ නිසා සංකර්ට පාසල් හොයද්දී රත්මලාන හින්දු විදුහල කැමති වුණා. එතැන ඉඩ තිබුණා. කොළඹ හින්දු කොංග්‍රස් ආයතනය උදව් කළා. ළමයින්ට නේවාසිකාගාර ලැබුණා. සංකර්ගේ ප්‍රශ්නය නිසා ළමයි සේරටම ඉගෙනගන්න අවස්ථාව ලැබුණා. 2009 ඔක්තෝබර් 25දා මිලින්ද මොරගොඩ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පාසල ආරම්භ කළා. එදා ළමයි 294ක් හිටියා."

"එතකොට සංකර්?"

"සංකර්ව ළඟදිත් මට හමුවුණා. එයා දැන් අධිකරණයට සම්බන්ධ ආයතනයක රජයේ සේවකයෙක් විදියට වැඩ කරනවා. විවාහ වෙලා දරුවොත් ඉන්නවා."

**සනත් ප්‍රියන්ත**



# දකින දකින බෝධියට වතුර කළ ගෙඩි හල හලා මම පුතෙක් ඉල්ලුවා



**පුංචි කෙල්ලක් වෙලා ඉන්න කාලෙට වඩා මල්වර නැකතින් එළියට එන දැරිවියක්ගෙ හිතේ උපදින හිතුවිලි දිගෑරෙන්නෙ හරිම සිනිඳුවට. ඒත් ගෑනු හිතක හැඟීම් කියන්නෙ ඒ සිනිඳු හැඟීම්වලට විතරක්ම නෙමෙයි කියලා අපිට තේරුම්යන්නේ පවුල, ගෙදර, ගම අතහැරලා විවාහයකින් පස්සෙ නන්නාඳුනන තැනක, නන්නාඳුනන මිනිස්සු අතරේ නුහුරු ගෙදරක තනිවෙන්න වුණාම. එහෙම පසුබිමක තවන, දවන, රිදවන හැඟීම් හා අත්දැකීම් අතරේ නොවැටී ඉන්න උත්සාහ කරපු එවන් ගැහැනු හිතක දිගහැරුම තමයි මේ...**

හුරුපුරුදු වෙච්ච හැමදේම අතහැරලා තරුණියකට යන්න වෙන දවසක් එනවා. ඒ විවාහයකදි. තමන්ගෙ ගෙදර, ගෙදර සාමාජිකයො, යාළු මිත්‍රයො, තමන් එතෙක් දවස් හැදුන ගම, වටපිටාව. ඒ ඈරෙන්න සමහරුන්ට තමන් ඇඳපු පැළඳපු විදිහ, හැසිරීම, කන බෙන දේවලුත් අත අරින්න වෙනවා.

මස් මාළුවලට ගිජුව හිටි මගේ මිතුරියකට කසාදෙන් පස්සේ එළවළුයි බතුයි විතරක් කන්න වුණා කියලා ඇය කීවේ ආයාසයකින් මවාගත්ත හිනාවක් එක්ක.

විවාහය කියන තැන ජීවිතයේ සුන්දරම නවාතැන්පොළ වෙන්නත් පුළුවන්. ඒ වගේම ජීවිතයේ අසුන්දරම තැන වෙන්නත් පුළුවන්. ඒක තීරණය වෙන්නේ ගොඩක් වෙලාවට විවාහයෙන් පස්සේ අපිට හම්බවෙන අලුත්ම නෑදෑයො හින්ද. ඒක බොරුවක් නම් නෙවෙයි. ජීවිතේ අතරමගදී මුණගැහෙන අය හා මුසුවීම හරියට තරඟ විභාගයක ප්‍රතිඵල වගේ. හොඳම හා නරක යන අවස්ථා දෙකෙන් එකක් අනිවාර්යයෙන්ම ප්‍රතිඵල විදිහට ලැබෙනවා.

මගෙ කසාදය වුණේ යෝජනාවකින්. ගෙදර ඉඳන් හැතැම්ම සීයකටත් වඩා දුරකට තමයි මටත් යන්න වුණේ. විවාහයෙන් පස්සෙ අවුරුදු දෙකක් විතර යනකන්ම දරුවෙක් ලැබුණෙ නැහැ. පුංචි පුංචි කහට රස මුලදී මුලදී ටික ටික දැනුණත්, කසාද ජීවිතේ ලොකුම තිත්ත රහ පළවෙනියට දැනුණෙ එතැනින් තමයි. නැන්දම්මාත්, එයාගෙ නෑදෑයිනුත්, අහල පහල උදවියත් එතැන ඉඳන් මගේ ජීවිතයේ එක පැත්තක් පුරාම කළු පාට කරන්න පටන්ගත්තා.

**“ළමයො මොකද තවම මොනවත් නැත්තෙ?”**

**“පවුලෙ කවුරුත් නෑ නේද ඔහොම?”**

**“දෙස්තර කෙනෙක්වත් මුණ ගැහෙන්න ගියොත් නරකද?”**

**“දේවාලෙකට ගිහින් බාරයක් වුණොත් නරකද?”**

**“පුතාලගෙ පරම්පරාවෙ නම් වැරැද්දක් නෑ. හැමෝටම දරුවො හිටියනෙ.”**

**“දැන්ම ළමයි හදන්නෙ නැද්ද?”**

**“දරුවෙක් මල්ලෙක් නැත්නම් කසාද ගෑනියෙක්ගෙන් වැඩක්ද ළමයො?”**

දුහක් ප්‍රශ්න හැම පැත්තෙන්ම ඇහෙන්න වුණා. ළිඳට ගියත්, කඩේට ගියත්, පාරෙ ගියත්, මඟුල් ගෙයක, මළ ගෙයක, දනෙ ගෙයක ගියත් මේ ප්‍රශ්න පත්තරේ දකින දකින නෑදෑ සනුහුරේම මගෙ ඉදිරියේ දිගාරින්න වුණා.

**ගැහැනියක් විදිහට තවත් ගැහැනියකට අනුකම්පා කළ යුතු හොඳම තැන මේ අවස්ථාව කියලා මම නම් අද වුණත් හිතනවා. ගැහැනු බොහොමයක් කරන්නෙ එවන් අවස්ථාවක අනිත් ගැහැනියකගෙ හිත රිදවීම විතරයි. ආදරය, අනුකම්පාව හා මගපෙන්වීම් පසෙක ලා සරදම් කිරීම දැනුවත්වම හෝ නොදැනුවත්ව කරන්නේ ගැහැනුන්ම තමයි**

ගැහැනියක් විදිහට තවත් ගැහැනියකට අනුකම්පා කළ යුතු හොඳම තැන මේ අවස්ථාව කියලා මම නම් අද වුණත් හිතනවා. ගැහැනු බොහොමයක් කරන්නෙ එවන් අවස්ථාවක අනිත් ගැහැනියකගෙ හිත රිදවීම විතරයි. ආදරය, අනුකම්පාව හා මගපෙන්වීම් පසෙක ලා සරදම් කිරීම දැනුවත්වම හෝ නොදැනුවත්ව කරන්නේ ගැහැනුන්ම තමයි. ඒත් එතැන මට මගේ සැමියා විශාල හයියක් වුණා. කවුරු මොනවා කිව්වත් ඔහු ඒක ප්‍රශ්නයක් කරගත්තෙ නෑ. වැඩ ඇරිලා ගෙදර ඇවිත් අපේ ගේ ළඟම තිබ්බ මහගෙදරට ඔහු අම්මා තාත්තා බලන්න ගිහින් ආවා. සමහරවිට ඒ දේවල්වලින් ඔහුගේත් කන් පිරෙව්වා වෙන්න පුළුවන්. නමුත් ඒ කිසි දෙයක් මා එක්ක කතා කළේ නෑ.

නිබ්බූත පද කියන්නට කෙනෙක් අලුත් නෑදැයින් අතර හිටියෙ නෑ. මේ කන්දෙස්කිරියාවෙන් ගැලවෙන්න තියෙන හොඳම මග ලැබෙනකන් නොඉඳ ඉක්මනටම දරුවෙකු හදගැනීම කියලා මට හිතුණෙ ඊටපස්සෙ. හොඳයි කියන දෙස්තරවරු හොය හොයා යන්න බලකෙරුවෙ මම. මොකද මේ වගේ වෙලාවකදි ගෙදරක පිරිමියෙකුට දික් නොකරන ඇඟිලි ඔක්කොම ගැහැනිය දිහාටම උලුක්කරන හින්ද. දවල් කාලයේ තනියම ගෙදර හිටිය මම දරු සම්පත පමාවීම ගැන කියැවෙන රූපවාහිනී වැඩසටහන් දැක්ක තැන බැලුවා. පොත් පිටු, පත්තර පිටු පෙරල පෙරලා බැලුවා. වෛද්‍යවරුන්ගෙ අවවාද, උපදේශන වලින් ඔලුව පිරෙනකොට ඇහෙන දෙස් පරොස්වලට මගේ හිතේ ඉඩ නැතිව ගියා.

**“අම්මෙ හැමවෙලාවෙම ධනාත්මක වෙන්න.**

**අම්මෙ හැමෝටම මෛත්‍රී කරන්න.**

**අම්මෙ පුළුවන් තරම් පොඩි දරුවො එක්ක ඉන්න.**

**අම්මෙ ඔයා බබාලා ලැබෙන්න ඉන්න අම්මලාට කෑම ටිකක් එහෙම හදලා දෙන්න.**

**මට දරුවෙක් ලැබෙනවමයි කියල හැම විනාඩියෙම හිතන්න.**

**නිතරම පෙනෙන්න පොඩි බබාලගෙ පිංතූර ටිකක් නිදියන කාමරෙ අලවගන්න. ඒ වගේ බබෙක් ළඟදිම මට ඉන්නවා කියලා හිතන්න.”**

ඒ ගිය හැමතැනකින්ම මට ලැබුණේ හිත නිවන උපදෙස්.

දෙස්තර මහත්වරු පැල කරපු අලුත් බලාපොරොත්තු ගොඩක් දවසින් දවස මගෙ හිත ඇතුළෙ පඳුරු දාන්න පටන්ගත්තා. මල් තියෙන්න වල් ඔක්කොම හිත ඇතුළෙන් ගලවන්න මං පටන්ගත්තෙ ඊටපස්සෙ.

මම නිස්කලංක තැන්වලට ප්‍රිය කෙරුවා. පන්සල්වලට ගිහින් දකින දකින බෝධියට වතුර කළ ගෙඩි හල හල පුතෙක් ඉල්ලුවා. තාත්තා පත්තු කරන පහන මතක් කර කර රත්නපුරේ ගිහින් සමන් දෙයියන්ගෙනුත් පුතෙක් ඉල්ලුවා.

හිත තිබුණෙ අමුතුම තැනක. පා වෙන නොවෙන තැනක. එකම අරමුණක. එතැන හිටියෙ පුංචි පුතෙක් විතරයි. එයා එක්ක මං කතා කළා. හිනා වුණා. එයාව නැවුවා. නිදි කළා. කිරි පෙව්වා. හිත ධෛර්යමත් කරගත්තා මිසක් ඉහරවගන්න ඕන වුණේම නෑ.

දවසක මම දැක්කා රූපවාහිනී වැඩසටහනක හේමන්ත පෙරේරා වෛද්‍යතුමාව. මට හිතුණා එතුමාවත් හමුවෙන්න. ජයවර්ධනපුර මහරෝහලේ ප්‍රසිද්ධ ප්‍රසව හා නාරි වෛද්‍ය විශේෂඥ හේමන්ත පෙරේරා වෛද්‍යතුමා අපේ සියලු වෛද්‍ය වාර්තා බලමිනුත් කිව්වෙ,

**“අම්මෙ, ඔයාලට කිසිම වැරැද්දක් නෑ. අනිවාර්යයෙන් දරුවෙක් ඉන්න ඕන. ස්වාභාවික විදිහට දරුවෙක් ලබාගන්න අම්මට කිසිම බාධාවක් නෑ”** කියලමයි.

**“කෝකකටත් තව මසෙකින් එන්න. පොඩි ටෙස්ට් එකක් තියෙනවා. ඒකත් කරලම බලමු.”**

ඒ මාසෙ ඉක්මනට ගෙවිල ගියා. හේමන්ත පෙරේරා වෛද්‍යතුමා දුන් දිනය ආදු ශ්‍රී ජයවර්ධනපුර ඉස්පිරිතාලෙට මම ගියේ කුතුහලයෙන් හා ලොකු තිගැස්මක් එක්ක. එදා මාව පරීක්ෂා කළේ මටත් වඩා ළාබාල වෛද්‍යවරයෙක්. එක අතකින් මගේ ශරීරය තුළට යවපු කැමරාව හසුරවන ගමන් ඔහු බලා හිටියෙ හරිම තියුණු විදිහට පරිගණක තිරය දිහාමයි. ඔහුට තිබුණේ සුන්දර පෙනුමක්. හැඟීම්බර කල්පනාකාරී ගතියක් තිබ්බ ඒ මූණෙ පිරෙන්නම සන්සුන්කමකුත් තිබ්බා. කම්පියුටර් තිරයෙ ඇකිළෙන, දිගෑරෙන, වෙනස්වෙන ආයෙ එන රූප දිහා බලාගෙනම ඔහු මට කිව්ව ඒ ලස්සනම ලස්සන වචන ටික මට හොඳට මතකයි.

**“අම්මෙ මම හිතන්නෙ ඔයාට දැනටමත් මිලිමීටර් ගාණක බබෙක් ඉන්නවා කියලා. ඒක විස්වාස කරන්න පුළුවන් අම්මේ.”**

ඉදින් ඒ ජීවිතේ ඇරඹුම දෙවැනි උපතක් ලැබීම හා සමානවම දැනෙන්නට ගත් මොහොතේ කොයිතරම් නම් සතුටකට මුල පිරුවාදැයි කොහොම කියන්නද? මට සමච්චල් පෑ මුහුණු මත අංගසම්පූර්ණ ගැහැනියක විදිහට ආඩම්බරයෙන් එබී බැලීමේ ආසාව ලොකුවට මට දැනුණා. ඒ දවස, ඒ මොහොත මගේ ජීවිතය ලොකුම ලොකු වෙනසකට අරගෙන යන බවක් එදානම් මට මේ තරමට තේරුණේ නෑ.

**(මේ ඇරඹුමක මතකය පමණමය. තව ඉතිරියක් ඇත.)**

ප්‍රියංකා නානායක්කාර

# ශිෂ්‍යත්වය ලෙහෙසියෙන් ජය ගන්න

# කිරණ

## මාසික අධ්‍යාපනික පුවත්පත් 3




**මැයි කලාපයන් දැන් වෙළෙඳපොළේ**

## 5 කිරණ

පත්තරෙන්

## ශිෂ්‍යත්වයට ඉලක්ක ප්‍රශ්න පත්තර හතරක්...

- කනට ඇහෙන ගීත
- සිංහල - ගණිතය - පරිසරය - දෙමළ - ඉංග්‍රීසි පාඩම් -
- රූප කොළ ● තෑගි ලැබෙන ප්‍රහේලිකා
- පුංචි ඔයාලගෙ කවි - කතන්දර ඇතුළු විශේෂාංග රැසක් සමඟින්

## දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් හා පොත්හල්වලින් දැන් මිලදී ගත හැක

ශිෂ්‍යත්වය හරි ලේසියි
fmG KIDS
YouTube
සම්මන්ත්‍රණ මාලාව
මැයි 21 වැනිදා සිට
සෑම සෙනසුරාදාවකම
පෙරවරු 8.00 සිට 12.00 දක්වා

කිරණ
ශිෂ්‍යත්ව පුවත්පත හා සමගාමීව පැවැත්වෙන
fmG ශිෂ්‍යත්වය හරි ලේසියි
පාඩම් මාලාව
සෑම සතියේ දිනකම
පෙරවරු 6.00 සිට 7.00 දක්වා

# මිලාන් යළි නොඑන බව සඳුනිට අමතක කරවන්න හදන රැෆී



විවාහයෙන් මාස තුනකට පසු සඳුනි හා මිලාන් වෙනම ගෙදරක පදිංචියට ගියේ ජීවිතය නිදහසේ සතුටින් විඳින්නටයි. විවාහවී මාස හතක් ගෙවී ගිය 2021 වසරේ දෙසැම්බර් 31 වැනිදා ඔවුන් කොළඹ සිට හබරණ බලා ගියේ '31 රෑ' සමරන්නටම නොවේ. ඊටත් වඩා විශේෂ කාරණාවක් ඉන් දින දෙකකට පසු එළැඹෙන ජනවාරි 02 වැනිදාට යෙදී තිබුණ නිසාය. විවාහයෙන් පසු පළමුවරට එළැඹෙන මිලාන්ගේ උපන්දිනය එදිනට යෙදී තිබුණි. මිලාන්ගේ විසි අටවැනි උපන්දිනය වූ එය ත්‍රිකුණාමලයේදි සමරන්නට ඔවුන් දෙදෙනා සැළසුම් කළේ බොහෝ දිනකට කලිනි. කෙසේ වුවද හබරණ විලේජ්හි දෙසැම්බර් තිස්එක රාත්‍රිය ගෙවී ගියේ සතුටෙනි. එදා ඔවුන් නින්දට ගියේද ජනවාරි පළවැනිදාට උදාවූ පාන්දරය. උදා වූ අවුරුද්දේ සතුටත් හදේ පුරවාගෙනම ඔවුන් එදා දවල් දොළහට පමණ හෝටලයෙන් පිටත් වූයේ ත්‍රිකුණාමලය බලා යන්නටයි. වාහනය පිටත් වනවාත් සමඟම මිලාන් සඳුනිට පුරුදු දුරකතන ඇමතුම ගන්නට මතක් කළේය.

ඒ '**රැෆී**' ගැන අම්මාගෙන් අහන්නටයි. රැෆී ඔවුන් දෙදෙනා දරුවෙකු සේ හදන ගෝල්ඩන් රිට්‍රීවර් වර්ගයේ බලු සුරතලාය. මිලාන් සඳුනිට රැෆීව ගෙනත් දෙන්නේ ඇගේ අවුරුදු දහතුනක් වයසැති 'රෙක්ස්' ඔවුන්ගේ විවාහයට සතියකට පෙර මියගිය නිසාය. නිරන්තරවම රෙක්ස් සිහි කරමින් දුක් වූ සඳුනිට ඒ වියෝවෙන් මසක් පිරෙන ද මිලාන් රැෆීව රැගෙන දුන්නේය. සුරතල් බලු පැංචියට රැෆී යන නම දුන්නේද මිලාන්මය. එතැන් පටන් රැෆී ඔවුන්ට දරුවෙක් විය. සඳුනිත් මිලානුත් රැෆීට අම්මා හා තාත්තා වූහ.

නිවසින් පිට රැය ගත කරන්නට නතර නොවෙන ගමන්වලදී ඔවුන් රැෆීව කැටුව ගියත් දිනක් දෙකක් නිවසින් පිට රැය ගත කරන ගමන්වලදී ඇයව බාරවන්නේ සඳුනිගේ අම්මාටයි. සඳුනිගේ බාල සහෝදරයාටත් දැඩි සේ ඇලුම් පාන රැෆීට ඒ නිවසේදී ඒ නිසා සඳුනී හා මිලාන් නැති අඩුව ලොකුවට දැනෙන්නේ නැත. ඒත් සඳුනිටත් මිලාන්ටත් නිතර රැෆී මතක් වුණේය. ඒ නිසා අනිවාර්යයෙන්ම උදේ, හවස, රෑ අම්මා සමඟ කතා කර සඳුනි රැෆීගේ තොරතුරු අසන්නීය. එදා ඒ මොහොතේත් සඳුනි අම්මා සමඟ රැෆීගේ තොරතුරු අසමින් ගියාය. මිලාන් වාහනය පැදවූ අතර පහුවෙන ගස්, ගල්, ගොඩනැගිලි, වංගු කිසිවක් ඈ මතකයේ නොවුණේ අම්මා හා කරමින් සිටි කතාවට හිත බැඳී තිබූ නිසාය. අම්මාගේ ටෙලිෆෝනය ආච්චිට මාරු වෙද්දී සඳුනිගේ කතාව අතරේ මිලාන් කිලෝමීටර් තුනකට ආසන්න දුරක් ගොස් සිටියේය. ඔහු සිටියේ ගල්වංගුව පසු කරමිනි. සඳුනි හදිසියේම දුටුවේ ඔවුන් ඉදිරියට වේගයෙන් බසයක් එන අන්දමය. ඇයට මතක එච්චරමය. ඉන්පසු ඇයට ඇස් ඇරුණේ හබරණ රෝහලේදීය.

**"ඒක හරි භයානක රිය අනතුරක්. ඒ ආව බස් එක හරි මැදින් වැදිලා මීටර් විස්සක් විතර කාර් එක ඇදගෙන ගිහින්. මං ඉඳලා තියෙන්නේ බස් එක ඇතුළෙ හිරවෙලා. මගේ මූණෙ ඉඳලා දකුණු පැත්තම ඩැමේජ් වෙලා තිබ්බෙ. දකුණු අත, උරහිස කැඩිලා, මැණික් කටුව ළඟින් කැඩිලා, දකුණු ඇහැ එළියට ඇවිත් තිබුණා. ඇඟ පුරාම තුවාල. මං ඇහුවෙ මිලාන් කෝ කියලා. එයා කොළඹ අරන් ගියා කිව්වා. එයාට සිහිය එනකල් කිව්වා බලාගෙන ඉන්නෙ. ඒත් ඒ මට කියලා තියෙන්නෙ බොරු. මිලාන් හොස්පිටල් එකට අරන් ගිහින් විනාඩි පහක් යනකොට නැතිවෙලාලු. එයාගේ අවසන් කටයුතුවලට මාව ගෙදර එක්ක එනකොට තමයි මං ඒක දන්නේ..."**

විසිපස් හැවිරිදි සඳුනි පමුදිතාට ඒ සියල්ල ඉවසා දරා සිටින්නට සිදුවුණේ පැහැදිලිවම ඔහු යළි නේන බව ඇස්වලට පෙනුණ නිසාය. ඊටද ඒ දරුණු රිය අනතුර ඇගේ පියවි සිහිය නැති කර තිබුණි. ඈ සිටියේ සිහිනයක සේය. කටාර් ගුවන් සමාගමේ රැකියාව කරන සඳුනි පමුදිතා හා මිලාන් විජේසිංහ විවාහ වූයේ 2021 මැයි 13 වැනිදාය. ඒ වසර එකහමාරක් පෙම් කිරීමෙන් අනතුරුවය. මිලාන් පෞද්ගලික සමාගමක ආයෝජන උපදේශකවරයෙක් විය.

> **රැෆීට ගොඩාක් දේවල් තේරුනාට මිලාන් ආයෙ එන්නෙ නෑ කියලා දැනෙන්නෙ නෑ**

**"ඔක්කෝම ඉවර වුණා. මිලාන් මාවයි රැෆීවයි දාලා සදහටම යන්න ගියා. මගේ ළඟ ජීවිතේ මහා වේදනාවකුත් දරුණු තනිකමකුත් ඉතුරු වුණා. ඒත් අපේ රැෆී මට තනියම අඬන්න දෙන්නෙ නෑ. කල්පනා කරන්න දෙන්නෙත් නෑ. මොනව හරි කරලා කල්පනාව කඩනවා. තනිවෙන්න දෙන්නෙත් නෑ. මං දුකෙන් නම් බෝලයක් අරන් එනවා සෙල්ලම් කරන්න. මං උඩ ඉඳලා පහල තට්ටුවට ගියත්, මිදුලට බැස්සත්, බාත්රූම් එකට ගියත් හෙවනැල්ල වගේ මගේ පස්සෙන් ඉන්නවා. එයාව අවධානයට යොමු කරනවා. මං හොස්පිටල් එකෙන් ඇවිත් කැඩුණු අත්, තුවාල මූණ එක්ක ඉන්නැද්දි මගේ ඇඟේ නැගලා කරදර කරයි කියලා කිසි කෙනෙක් එයාට ළඟට එන්න දුන්නෙ නෑ. ඒත් එයා කොහොම හරි හොරෙන් ආවා. ඒ ඇවිත් මගේ ළඟටම වෙලා හිටියා. එදා ඉඳලා අද වෙනකල් රැෆී මගේ ජීවිතේ කොටසක් වෙලා..."**

රිය අනතුර වී මිලාන් වෙන්ව ගොස් මාස හතරක් වුවත් සඳුනිගේ මුහුණේ තුවාල සහ ඇගේ කැඩුණු බිඳුණු තැන් සුව වී නැත. වියෝ වේදනාවත් සමඟ ඇයට විඳින්නට සිදුව ඇත්තේ තදබල ශාරීරික වේදනාවකි.

**"මේ වෙනකොට ඔපරේෂන් හතරක් කරලා තියෙන්නේ. තව ඔපරේෂන් අටක් කරන්න තියෙනවා කියලා ඩොක්ටර්ස්ලා කිව්වා. ඇහැ හදාගන්න තව අවුරුදු එකහමාරක්වත් ඉන්න වෙනවා කිව්වා. දැන් ඇහැ වැහිලා තියෙන්නේ. තවම බෙහෙත් බොනවා. හැම සතියකටම පාරක් හොස්පිටල් යනවා බෙහෙත් කරන්න."**

ජීවිතයට සෙවන දෙන්න සිටි ඒ මහා වෘක්ෂය ඉදිරී වැටුණ බව සඳුනි දැන සිටියත් රැෆී ඒ බැව් දන්නේ නැත. රැෆී තාමත් ඔහු එනතුරු මග බලන්නේ ඒ නිසාය.

**"රැෆීට ගොඩාක් දේවල් තේරුණාට මිලාන් ආයෙ එන්නෙ නෑ කියලා දැනෙන්නෙ නෑ. තාත්ති එනවද බලන්න කිව්වම බැල්කනියට ගිහින් ඉස්සර වගේම බලාගෙන ඉන්නවා. එයාව ගේ පුරා හොයනවා. මිලාන්ගේ හෝදපු නැති ඇඳුමක් අහුවුණාම අරන් ගිහින් ඒ උඩ නිදාගෙන ඉන්නවා. එයාව පස් යට දාපු සෙමෙට්‍රියට එක්ක ගියාම මුල් දවසේ ඒ පස් කන්දට නැගලා අත් දෙකයි කකුල් දෙකයි දෙපැත්තට දාලා වරුවක් විතර ඒ උඩ නිදාගෙන හිටියා.**

> **දැන් මට රැෆීව වඩාගන්න බෑ. දකුණු අතින් කිසිම බරක් උස්සන්න එපා කියලා තියෙන්නේ ආයෙත් අත කැඩෙන්න පුළුවන් කියලා. 'අම්මිට ඌවා වෙලා' කියලා මං කිව්වම ලොකු හුස්මක් අරන් ඒක බිමට දාලා මගේ දිහා දුකෙන් බලා ඉන්නවා**

**දැන් මට රැෆීව වඩාගන්න බෑ. දකුණු අතින් කිසිම බරක් උස්සන්න එපා කියලා තියෙන්නේ ආයෙත් අත කැඩෙන්න පුළුවන් කියලා. 'අම්මිට ඌවා වෙලා' කියලා මං කිව්වම ලොකු හුස්මක් අරන් ඒක බිමට දාලා මගේ දිහා දුකෙන් බලා ඉන්නවා. මිලාන් නැති ජීවිතේ දුක නැති කරන්න රැෆී මහන්සි වෙනවා කියලා මට දැනෙනවා."**

දුක තුනී වෙනවා වෙනුවට ඇත්තේ දුක එකතුවන දේවල්ය. පසුගිය 26 වැනිදා රැෆීගේ පළමු උපන්දිනය යෙදී තිබුණි. මිලාන් හිටියානම් රැෆීගේ උපන්දිනය සමරන්නට තිබුණා නොවේදැයි සඳුනිට එදා දවස පුරාම සිතුණි.

**"මං වගේම මිලානුත් සත්තුන්ට හරිම ආදරෙයි. අපි කැනඩා යන්න දාලා තිබ්බෙ. ඇත්තටම මේ වර්ගෙ සුරතලෙක් හැදුවෙත් එයාව එතකොට අරන් යන්න ලේසි නිසා. ඒත් මේක වුණේ මට වීසා ඉන්ටවිව් එකට සති දෙකක් තියෙද්දි. මට හැමදේම නැතිවුණා. මට අද මිලාන්ගෙන් කියලා ඉතිරි වුණේ මඟුල් මුද්දයි, රැෆියි විතරයි..."**

ඇගේ ඒ කතාව අස්සේ තවත් අතුරු කතාවක් ඇත්තේය. ඈ කියන්නේ රිය අනතුර වූ මොහොතේ වාහනයේ තිබූ සියලු දේ නැතිවූ බවයි. ඇගෙත් මිලාන්ගේත් කර බැඳි චේන්ද කවුරුන් හෝ සොරාගෙනයි. සඳුනිගේ මුදල් පසුම්බියද නැතිවිය. එහි තිබූ මුදල්වලට වඩා ඇගේ රෝගී තත්ත්වයකට ප්‍රතිකාර ගන්නා පසුගිය වෛද්‍ය වාර්තා සියල්ල ද නැතිවී තිබුණි.

**බියංකා නානායක්කාර**




මිලාන්, සඳුනි සහ රැෆී



# ලප වැඩි වුණොත් මූණේ ඇපත් නෑ නෝනේ

අතීත කැළැල් අනාගතයට අරන් යන්න එපා කියලා කතාවක් තියෙනවනේ. හිත්වල ඇතිවෙච්චි කැළැල් විතරක් නෙමෙයි මූණේ ඇතිවෙච්චි කැළැලුත් ඉස්සරහට ගෙනියන්න එපා කියලා තමයි අද කියන්න හදන්නේ.

ගොඩක් අයගේ මූණේ ලප ඇතිවෙන්නේ කුරුලෑ නිසා. ඊට අමතරව ආසාත්මිකතා, කැපුම්, සීරීම් නිසාත් ලප කැළැල් ඇතිවෙනවා. දහසය වැනි ශතවර්ෂයේ ජීවත් වෙච්චි මිනිස්සුන්ට නම් වසූරිය ඇතුළු විවිධ වසංගත රෝග නිසාත් ලප කැළැල් ඇති වුණාලු. මේ රෝග නිසා ඒ කාලේ බොහෝදෙනෙක් මියගිහිල්ලත් තියෙනවානේ. ලෙඩවලින් නොමැරී බේරුණු උදවියගේ මුළු සිරුර පුරාම ලප කැළැල් ඉතිරි වෙලා. වසංගත බෝවෙන්නේ අපිරිසිදු ලේ තියෙන උදවියටයි කියලා ඒ කාලේ කසුකුසුවක් තිබුණලු. ඉතින් ඉතිරි වෙච්චි ලප දැක්ක හැටියේ වසූරිය හැදුනු කෙනෙක්ය කියලා තේරෙන නිසා ලප තියෙන අයව සමාජයෙන් කොන් වෙලා. ලප තියෙන කාන්තාවන් දිහා පිරිමියෙක් ඇහැක් ඇරලා බැලුවෙත් නැතිලු.

ඉතින් ඔය පුරස්නෙන් බේරෙන්න ඒ බවලත් උදවිය ගමනක් බිමනක් යනකොට ඇඟ පුරාවම මේකප් තට්ටුවක් ආලේප කරලා. ඉතින් ඒකෙන් ප්‍රශ්නේ විසඳුනා කියලද හිතන්නේ? නැහැ... ඔය කාලේ මේකප්වල ඊයම් වගේම රසදියත් අඩංගුයිලු. ඉතින් කාලයත් එක්ක මේ කාන්තාවන්ට දරුණු රෝග ඇතිවෙලා ඒ ඇතැම් කාන්තාවන් මියගිහිල්ලත් තියෙනවා. ඒ අය විතරක් නෙමේ දැන් ඉන්න අයත් ලපයක් දෙකක් ආව හැටියේ කරන්නේ මේකප් තට්ටුකින් එතැනට තාවකාලික පැලැස්තර අලවන එක. හැබැයි ප්‍රමිතියෙන් බාල මේකප් නිතර නිතර ආලේප කරන එකෙන් වෙන්නේ කබලෙන් ලිපට වැටෙන එකයි කියලා මතක තියාගන්න.

චර්ම සෛල තුළ සීබම් කියන ස්වභාවික තෙල් වර්ගය සහ මැරුණු චර්ම කොටස් එක්කාසු වුණාම තමයි කුරුලෑ ඇතිවෙන්නේ. දවස් කිහිපයකින් කුරුලෑව ඇතුළේ තියෙන ඔය දේවල් සමෙන් එළියට එනවනේ. අන්න එතකොට චර්ම සෛල බිත්තියට සහ ඒ අවට කොලැජන් තන්තුවලට හානිවෙනවා.

කුරුලෑවක් ගැඹුරින් සහ වට ප්‍රමාණයෙන් විශාල වෙන්න වෙන්න ලප කැළැලක් ඇතිවෙන්න තියෙන ඉඩ වැඩි වෙනවා. පස්සේ අලුත් චර්ම සෛල සහ කොලැජන් තන්තු නිර්මාණය වෙලා ඔය ලප කැළැල් මැකිලා යනවා. ඒත් ඉතින් ඒකට සෑහෙන කාලයක් ගතවෙනවා. හැබැයි අපේ නරක රූපලාවණ්‍ය පුරුදු නිසා ඒ කාලය තවත් වැඩි වෙන්න වගේම කැළැල් නොමැකීම යන්නත් පුළුවන්.

කුරුලෑවලට අමතරව මුහුණේ අනවශ්‍ය රෝම ඉවත් කරන්න භාවිත කරන රේසර්, ත්‍රෙඩින් වගේ දේවල් නිසාත් මුහුණේ තුවාල ඇතිවෙලා ලප හිටින්න ඉඩ තියෙනවා. හැබැයි ගැඹුරු තුවාල ඇති නොවන නිසා ඒ වගේ කැළැල් නම් බොහොම ඉක්මනින් මැකිලා යනවා.

ලප කැළැල් පහසුවෙන්ම ඉවත් කරගන්න ගෙදරදිම කරගන්න පුළුවන් පිළිවෙත් සහ සත්කාර කිහිපයක් ගැනත් බලමු.

පළවෙනි දේ කුරුලෑවක් ආවම ඒක අල්ලන්න යන්න එපා. අත පය නිකන් තියාන ඉන්න බැරුවට සමහරු කුරුලෑ අතපත ගාලා කඩලා දන්න හදනවනේ. ඒ වැඩවලින් දෑත් මත තියෙන විසබීජ මගින් කුරුලෑව ආසාදන වෙලා එහි ගැඹුර වැඩි වෙන්න පුළුවන්. එතකොට ඉතින් කොටියෙක්ගේ වගේ මූණ පුරා පුල්ලි ඇතිවෙන එක නවත්තන්න බැහැ. ඊළඟ දේ කුරුලෑවක් ආවහම ලොකු කාලයක් ගන්නේ නැතුව ඒකට ප්‍රතිකාර කරන්න. ඒකෙන් ලප හිටින එක අවම කරගන්න පුළුවන්.

මුහුණේ දැනටමත් ලප කැළැල් තියෙන කෙනෙක් නම් මුහුණ නිතරම පිරිසුදුව තියාගන්න. මද උණුසුම් ජලයෙන් මූණ සෝදන්න. ඒ වගේම සතියකට වතාවක්වත් මූණ සම්බාහනය කරන්න. එවැනි දෙයින් පහසුවෙන්ම කොලැජන් උත්තේජනය කරගන්න පුළුවන්.

හිරුඑළියට නිරාවරණය වෙනවා නම් හිරු ආවරණ ක්‍රීම් එකක් ආලේප කරන්න අමතක කරන්නම එපා. මොකද වැඩිපුර හිරුඑළියට නිරාවරණය වෙනවා නම් ලප කැළැල් තව තවත් අඳුරු වෙනවා. අනික සමේ වර්ණය අඳුරු වෙන තරමටත් මේවා වඩාත් පැහැදිලිව පේන්න පටන් ගන්නවලු. ඒ නිසා අව්ව එක්ක සෙල්ලම් පරිස්සමින්.

ලප කැළැල් මකන්න හිතාගෙන බ්ලීච්න් ක්‍රීම් නැත්තම් ස්ටෙරොයිඩ් ක්‍රීම් ආලේප කරන එකත් නරක පුරුද්දක්. ලප මකන්න එවැනි දේවල් ආලේප කරන එකෙන් තාවකාලික ලප මැකෙනවා තමයි. හැබැයි ඒවගෙන් සමට වෙන හානිය නිසා නැවත හැදෙන ලප මකන්න නම් බොහොම අමාරුයි පුතේ. ඒ නිසා ලප මකන්න හිතාගෙන එක එක වස වර්ග මූණේ ගාන්න එපා. ඒ වෙනුවට ඇල්ෆා හයිඩ්‍රොක්සි ඇසිඩ් (AHA), ලැක්ටික් ඇසිඩ්, රෙටිනෝල්, සැලිසිලික් ඇසිඩ් වගේ සංඝටක අඩංගු දේ භාවිතා කරන්න. ඒවා කැළැල් ඉවත් කරන්න උදව් වෙනවා.

ඒ වගේම මයික්‍රෝඩර්මාබ්‍රේෂන්, කෙමිකල් පීලින්ග්, ස්කින් නීඩ්ලින්ග් සහ ලේසර් සත්කාර මගිනුත් ඉක්මනින්ම ලප කැළැල් ඉවත් කරගන්න පුළුවන්.

ගෙදරදිම කරගන්න සත්කාර විදිහට අර්තාපල් යුෂ, අමුකහ සහ කඩල පිටි මිශ්‍ර කරලා ආලේප කරන්න. ආමන්ඩ් පිටිවලට බිත්තර කහමද ස්වල්පයක් මිශ්‍ර කරලා මූණේ ආලේප කරන්න. විනාඩි විස්සක් විතර ගියාට පස්සේ සෝදන්න.

ඉදුණු බෙලි ගෙඩියක් පොඩි කරලා ඒකට මුංඇට කුඩු, සුදුහඳුන් සහ මීකිරි මිශ්‍ර කරලා ලප කැළැල්වලට ආලේප කරන්න.

ඒ වගේම තැම්බූ අර්තාපල් අලයකට මී පැණි, කඩල පිටි මිශ්‍ර කරලා ආලේප කරන එකත් ලපවලට හොඳ සත්කාරයක්. සතියකට දෙවරක්වත් මේ සත්කාර ටික කරගන්න පුළුවන් නම් ලප නැති සෝම් සඳවන් මුහුණක් ලබාගන්න එක හීනයක් වෙන එකක් නැහැ.

ඊළඟ දේ කුරුලෑවක් ආවහම ලොකු කාලයක් ගන්නේ නැතුව ඒකට ප්‍රතිකාර කරන්න. ඒකෙන් ලප හිටින එක අවම කරගන්න පුළුවන්

ලප කැළැල් මකන්න හිතාගෙන බ්ලීච්න් ක්‍රීම් නැත්තම් ස්ටෙරොයිඩ් ක්‍රීම් ආලේප කරන එකත් නරක පුරුද්දක්

සෙව්වන්දි හෙට්ටිආරච්චි

# ආයෙ එහෙම වැරැද්දක් වෙන්නෙ නෑ නෝනා.... මට සමාවෙන්න

## ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

67 කොටස

**මෙතෙක් කතාව**

*විදුහල්පතිවරයෙකු වූ සෙනරත් ඇල්ලේපොලගේත්, සේපාලිකා ඇල්ලෙපොලගේත් වැඩිමල් දියණිය වන අංජනා සරසවි සිසුවියකි. ඇමතිවරයකු වන බණ්ඩාර තෙන්නකෝන්ගේත්, සෙනෙහෙලතා මැණිකේ තෙන්නකෝන්ගේත් බාල පුතා වූ තේනුක ඇය හා පෙමින් බැඳෙන්නේ දුටු සියලු තරුණියන් අතරින් ඈ ළඟ හිත සෙවූ පෙම්වතිය සිටි නිසාය. දේශපාලනය නොරුස්සන ඔහු ගෙදරින් ඈත්ව ඔහුගේම ව්‍යාපාරයක් කරගෙන යන්නේ ජපානයේ සිට පැමිණියාට පසුවය. සෙනෙහෙලතා මැණිකේ දියණියට හා වැඩිමල් පුතුට වඩා තේනුකට ආදරය කළාය. ඒත් ඔහුගේ වැඩිමල් සහෝදරයා වූ මේනක බණ්ඩාර හැමවිටම ඔහු හා තරඟයට ආ අතර මේනක විසින් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා නිතර රටේ කතාබහට ලක් කරන පුවත් මැව්වේය. සෙනරත් ඇල්ලේපොල හෘදයාබාධයකින් හදිසියේ මියයාමත් සමඟ රැකියාවක් නොකළ සේපාලිකාත්, අංජනා, නංගී සහ මල්ලීත් අසරණ වෙද්දී ඔවුනට පිහිට වූයේද තේනුකය. ඒ වනවිට ඔහු කඩවත පියාගේ නිවසේ පදිංචිව සිටි අතර මේනක, තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා රවටමින් ඒ නිවසේ ගෙවත්ත එළවලු වගාවට ඉල්ලා සිටියේය. ඔහුට ඊට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙසින් තේනුකට ඒ නිවසේ සිටින්න බැරි වුණේය. ඒ අවස්ථාවේ කාටත් රහසින් සෙනෙහෙලතා මැණිකේ ඇගේ ගමේ ඉඩමක් සහෝදරයාට විකුණා ගත් මුදල් තේනුකට නිවසක් මිලදී ගන්නට දුන්නාය. ඔහු නිවසක් මිලට ගත්තද එය අංජනාට සැඟවූයේ දිනෙක ඈ පුදුමකරනු සඳහාය. ඒ නිසා ඔහු ඉන්නේ කුලී නිවසක බව කී තේනුක ඒ නිවසේම පහත මහළ අංජනාගේ පවුලේ අයට ලබා දුන්නේය. දරුවන් සම්පූර්ණයෙන් මාතලේ ඉගෙනීම් කටයුතු නැවැත්වූ පසු කොළඹ එන්නට සේපාලිකාගේ බලාපොරොත්තුව විය. මේ අතර තේනුකගේ කේන්දරයේ සිකුරුගේ බලය වැඩිවූවා සේ ඔහු නොදැන මංගල යෝජනා දෙකක් පැමිණ තිබුණි. එකක් බණ්ඩාර තෙන්නකෝන් ඇමතිවරයාගේ සහෝදර ඇමතිවරයෙකුගේ දියණියකි. අනෙක තේනුකගේ මාමාගේ දියණිය චතුමිණිය. ඒ කිසිත් නොදැන තේනුක අංජනාව සමන් දේවාලය වන්දවන්නට කැඳවා ගියේය. විදේශයක සිට ලංකාවට පැමිණ සිටි චතුමිණි දෙමාපියන් සමඟ ඔහු බලන්නට ඒ අතරවාරයේ ඇමති නිල නිවසට පැමිණියාය.*

**අද එතැන් සිට**

ඇමති නිවසින් එළියට ගත් වාහනය ප්‍රධාන පාරට ගත්තාට පසු තේනුක පාරේ පසෙකට කර නැවැත්තුවේය. දුරකතනය ක්‍රියාත්මක වෙද්දී කෙටි පණිවිඩ කීපයක්ම එනු ඇසුණේය. එහි අංජනා විතරක් ගත් ඇමතුම් සියයකට වඩා තිබුණි. විනාඩි ගාණෙන් ගාණට එවූ කෙටි පණිවිඩද දහයක් පහළොවක් තිබුණි.

**"අනේ... ඔයාට මොකද වුණේ...?"**

ඈ එවූ අවසන් කෙටි පණිවුඩය ලෙස සටහන් වී තිබුණේ එයයි. තේනුකගේ හිතට මහත්ම වරදකාරී හැඟීමක් දැනුණේය. තම දුරකතනය වැඩ නොකිරීම ඈ කෙතරම් පීඩාවට පත්කර ඇත්දැයි ඔහුට දැනුණේය. ඔහු දුරකතනයේ කෝල් බොත්තම මතින් අත තැබුවේ වහා අංජනාට ඇමතුමක් ගන්නටයි. ඒත් ඊට පෙර එය නාද වෙන්නට ගත්තේය. ඔහු ඒ දෙස වඩා හොඳින් නොබලා ඇමතුම ගත්තේ කතා කරන්නේ අංජනා වන්නට ඇතැයි සිතාගෙනයි. ඒත් අනෙක් පසින් කතා කළේ චතුමිණීය.

**"මොනවද අනේ, පැයකටත් වැඩියි ෆෝන් එක ඕෆ් වෙලා. ඔයාට මං ගැන දුක නැද්ද තේනුක අයියේ...?"**

ඈ කතා කළේ දුක්ගැනවිල්ලක් කියාගෙනය. තේනුකට දැනුණු කේන්තිය ඒ මොහොතේ වචන වූවානම් ඇගේ මව්පියන් සමහරවිට අම්මාගේ මුහුණවත් නොබලනු ඇත. ඒ නිසා ඔහු බොහෝ ඉවසීමෙන් කතා කළේය.

**"මං මේ හදිස්සි කෝල් එකක් ගන්න හදන්නේ චතුමිණී... මං පස්සෙ කතා කරන්නම්..."**

ඇය හා කියන්නටත් පෙර ඔහු ඇමතුම විසන්ධි කළෙය. ඒ සැණින් අංජනාගේ දුරකතනයට ඔහු ඇමතුමක් ගත්තේය.

දුරකතනය කීපවරක් නාද වෙද්දී අනෙක් පසින් සම්බන්ධ වෙනු දැනුණි.

ඇගේ කටහඬ බරවී තිබුණි.

**"සොරි නෝනා... මං අම්මා බලන්න ගියා. එහෙන් කෝල් එක එද්දි තමයි ෆෝන් එකේ බැට්‍රි බැස්සෙ."**

**"මං බය වුණා... ඒකයි බැරිම තැන කමල්ට කතා කළේ..."**

**"ඒකට කමක් නෑ. හදිස්සියට කතා කරන්න තමයි කමල්ගෙ නොම්මරේ දීලා තියෙන්නේ."**

**"කමල් ආපිට පණිවිඩේ කිව්වම තමයි හිත හරි ගියේ."**

ඈ නාසය ඉහළට අදිමින් කීවාය.

**"මොකද හෙම්බිරිස්සාව හැදුණෙ... ඇඬුවද?"**

ඔහු ඇසුවේ මෘදුවය.

ඊට ඈ උත්තරයක් දුන්නේ නැත. ඒ නිහඬ බවින් තේනුකගේ හිතට බොහෝ දේවල් දැනුණේය.

**"පාඩම් කළෙත් නෑනේ...?"**

**"නෑනෙ. මං පිච්චි පිච්චි හිටියෙ. මං හිතුව මං මේ සැරේ විභාගෙට ලියන්නෙ නෑ කියලත්. වෙනදට ෂොප් එකට ගිහින් කෝල් එකක් දෙනවනේ. ඒක දුන්නෙ නැති හින්ද තමයි කතා කළේ. ඒ වෙලේ ඉඳලා මං බයෙන් හිටියෙ..."**

**"ආයෙ එහෙම වැරැද්දක් වෙන්නෙ නෑ නෝනා. මට හිටපු තැනකින් ඔයාට කෝල් එකක් දෙන්න තිබ්බා, ඒක මට අමතක වුණේ ගිය තැන තිබ්බ වාතාවරණෙත් එක්ක..."**

**"කමක් නෑ... අම්මා කොළඹ ඇවිත්ද?"**

අංජනාගේ ඊළඟ ප්‍රශ්නය ළඟ ඔහුගේ හිත හිරවුණේය. ඊට නම් සැකක් නොහැඟෙන උත්තරයක් දිය යුතුම බැව් ඔහු සිතුවේය.

**"එයාලා කොළඹයි ඉන්නෙ. මං ඔයාට කිව්වද නැද්ද කියල මට මතක නෑ. හැබැයි මං එහෙ යන්නෙ එන්නෙ නෑ. හදිස්සියකට කතා කළොත් යනවා. මේ ගියෙත් ඒ වගේ..."**

අංජනා ප්‍රශ්න නාසා හුම්ටි තැබුවාය.

**"ඔයාට මං කියන අපබ්‍රංශ තේරෙන්නෙ නැතුව ඇති. ඒ ගැන හිතන්න එපා දැන්ම. විභාගෙ ඉවර වුණාම මං ඔයාට අම්මා ගැන කියන්නම්..."**

**ඔයාට මං කියන අපබ්‍රංශ තේරෙන්නෙ නැතුව ඇති. ඒ ගැන හිතන්නත් එපා දැන්ම.**

**"ඔයා එහෙනම් ඉතින් පරෙස්සමට ෂොප් එකට ඇවිත් මට කියන්න. මං පාඩම් කරන්නම්."**

ඔහු සිටින්නේ තවමත් මග බව දැනුණ නිසා ඈ කීවාය. දුරකතන ඇමතුම විසන්ධි වී ගියත් තේනුක බණ්ඩාර තෙන්නකෝන් වාහනය පණ ගන්වා නොගෙන තවත් මොහොතක් එසේම සිටියාය. අංජනා ඇල්ලේපොල කෙතරම් අපූර්ව චරිතයක්ද කියා ආයෙත් ඔහුට සිතුණි. ඈ ඔහු කී සියල්ල අසා විශ්වාස කළා මිස ප්‍රශ්න කිරීම් හෝ නෝක්කාඩු කීම් කිසිවක් වූයේ නැත. එය මහා බරට ඔහුගේ සිතට දැනුණි.

තේනුක සාප්පුවට යනවිට ඒ ගොඩනැගිල්ලේ හිමිකරු පැමිණ සිටිනු පෙනුණි. ඔහුට හදිසියේම මතක් වූයේ බදු දෙන්නට ඇති අල්ලපු කඩ කාමරයයි. ඔහු වාහනයෙන් බැස සාප්පුව තුළට නොයා ඔහු සමීපයට ගියේය. ඔහු සේවකයකුත් සමඟ පැමිණ එකී කඩ කාමරය අලුත්වැඩියා කරමින් සිටියේය. තේනුක දකිත්ම ඔහු හිතවන්තව සිනාසුණේය.

**"මං කතා කරන්නත් හිටියෙ මිස්ට කුලසේකරට..."**

ඔහු සමීපයට යමින් තේනුක කීවේය.

**"ඇයි මොකක් හරි ප්‍රශ්නයක්ද...?"**

ඔහු අඩසිනාවක් පාමින් ඇසුවේය.

**"අනේ ප්‍රශ්නෙකට නෙවේ, ඔය කඩ කාමරේ ගැන අහන්න."**

කුලසේකර මහතාගේ මුහුණේ වූ අඩසිනාවද මැකී ගියේය. ඔහුගේ මුහුණේ කණගාටුදයක පෙනුමක් වහා ඇඳුණේය.

**"දැන් දවස් දෙක තුනකට කලින් කෙනෙක් ඇඩ්වාන්ස් කරලා, ඊයෙ බදු ඔප්පු ලිව්වනෙ තේනුක මහත්තයා... අපරාදේ..."**

ඔහු කියද්දී තේනුකට පශ්චාත්තාපී සිතුවිල්ලක් ඇති වුණේය. කඩ කාමරය දෙන බව දැනගත් මොහොතේම කතා කළානම් එය ගන්නට ඉඩ තිබුණු බව ඔහුගේ හිත කීවේය.

**"අපරාදේ තමයි... මං ගන්න හැදුවෙ මගේ නංගි කෙනෙකුට සැලොන් එකක් දන්න. ඒක නම් මට අතපහු වෙලා ගිය බරපතළ වැරැද්දක්..."**

තේනුක කීවේ සැබෑවටම පසුතැවිල්ලෙනි. ඔහු හිත තබාගෙන සිටියේ රූපලාවණ්‍ය වැඩ දන්නා තරුණියක වැටුපට සොයාගෙන අංජනා බාරයේ රූපලාවණ්‍යාගාරයක් පටන් ගන්නටයි. ඇය විභාගෙට ලිව්වාට පසු සිටින්නට වෙන්නේ නිවසේ නිසා ඔහු ඒ විකල්පය කල්පනා කළේ ඒ වෙනුවෙන් වැය කරන්නට ටොෂිකෝ දී ගිය මුදල්ද තිබූ නිසාය.

පසුගිය දිනක කතා කළ විට ටොෂිකෝ කීවේ ඒ මුදල් ඇයට යළි ලබා දී තරහ වනවාට වඩා ව්‍යාපාරයේ හෝ දියුණුවකට යොදවා ගන්නා ලෙසය. ජපන් මිනිසුන්ගේ කීමෙහි හා වැඩවල තරම දන්නා තේනුක ඒ මුදලින් වැඩක් කරන්නට හිතුවේ ඉන්පසුවය.

**"ගත්ත කෙනත් කිව්වෙ ලේඩීස් සැලොන් එකකට කියලා තමයි..."**

ගොඩනැගිල්ල හිමිකරුවා කීවේය.

තේනුකට පුදුම හිතුණි. ඒ ඔහුට සිතුණ දෙයම තව කෙනෙකුට සිතීම ගැනය.

**"ඒ කොහේ කෙනෙක්ද මිස්ට කුලසේකර...?"**

ඒ කවුරුන්දැයි දැනගැනීම තේනුකට වඩාත් වැදගත් වුණේය. ඒ ඔහුගේ සාප්පුවට යාවූ සාප්පුව නිසාය. කවුරුන් හෝ හොඳ කෙනෙක් ආවොත් හොඳය. නැත්නම් වාහන නැවැත්වීමේ සිට ගැටලුය.

තේනුකගේ ප්‍රශ්නයට ගොඩනැගිල්ල හිමියා එකවර උත්තරයක් දුන්නේ නැත. නිශ්ශංක රාජපක්ෂ කීවේ කවුරුන් ඇහුවත් කඩ කාමරය ගත්තේ ඔහු බවට දැනට නොකියා ඉන්න ලෙසටය. සැලෝන් එක විවෘත කළාට පසුව එය දැනගත්තාට කම් නැති බව ඔහු කීවේය.

**"රට ඉඳලා ආව කෙනෙක් කියලයි කිව්වේ..."**


නිශ්ශංක රාජපක්ෂ කී විස්තර ඇසුරින් ඔහු කෙටි උත්තරයක් වුණේය.

**"ආ එහෙනම් පිටරටත් සැලොන් වැඩ කරපු කෙනෙක් වෙන්න ඇති. හොඳයි, හොඳයි කුලසේකර මහත්තයා..."**

තේනුක ආපසු හැරුණේය. ඔහු ගිය දේ ගැන යළි නොසිතා සාප්පුව තුළට ගියේය. ඔහු ඇතුළුවූයේ කෙළින්ම ඉදිරිය බලාගෙනය.

පසුපස හරවාගෙන දුරකතන කවර තෝරන්නිය ඔහුගේ හිතට එක්වරම අමුත්තක් කැන්දුවේය. අව් කණ්ණාඩිය දෑසින් උස්සා හිස මුදුණේ රන්දගෙන සිටි ඇය දිග කෙස් කළඹ ලිහිලෙන් සීගිරි විලාසිතාවට බැඳගෙන සිටියාය.

එක්වරම ඇය රවුමට කැරකී කවුන්ටරය පසට හැරුණාය. තේනුකගේ හිත සීතල කරමින් ඔහුගේ සැකය නිවැරදි කළේය.



**අපරාදේ තමයි... මං ගන්න හැදුවෙ මගේ නංගි කෙනෙකුට සැලොන් එකක් දාන්න. ඒක නම් මට අතපහු වෙලා ගිය බරපතළ වැරැද්දක්**

ලබන සතියට...



# වයසක අම්මලා පාරේ ඉඳන් කෑගහලා කියනවා ‘උඹ බුදුවෙයන් දුවේ’ කියලා

## ගමටම වතුර දුන්නු ඇඟලුම් සේවිකාවකගේ කතාව

කෙනෙක් කන්න ටිකක් ඉල්ලනකොට අහක බැලුවත් බොන්න වතුර ටිකක් ඉල්ලද්දී අහක බලන්න එපා කියනවනේ. ඒ නිකමට නෙවෙයි. කුසගින්න ඉවසුවත් පිපාසය ඉවසගන්න අමාරු නිසා. ඒත් අදටත් ඒ වතුර බිංදුව ඉදිරියේ පින්සෙණ්ඩු වෙන අහිංසක මිනිස්සු කීදෙනෙක් නම් අපි අතරේ ඉන්නවද? වතුර ටික වෙනුවෙන් කිලෝමීටර ගණන් කකුල් ගෙවෙනකන් ඇවිදින මිනිස්සු කොයිතරම් නම් අපිට හමුවෙලා තියෙනවද? මේ කියන්න යන්නෙත් මුළු ජීවිතෙන් හරි අඩක්ම වතුර ටිකකට දුක් විඳපු අන්න එහෙම මිනිසුන්ගේ කතාවක්.

හේනක් කුඹුරක් කොටාගෙන, කුලියක් මලියක් කරගෙන ජීවත් වුණු ඇම්බවිල ගමේ උදවියට තිබුණ ලොකුම ප්‍රශ්නේ එදිනෙද වැඩ කරගන්න වගේම බොන්නවත් වතුර ටිකක් නැතිකම. මුළු ගමේම පවුල් හැට හැත්තෑවක් පාවිච්චියට වතුර ගත්තේ හැතැක්ම ගාණක් දුරින් තිබුණ ළිඳකින්.

ඒකත් මනුස්සයෙකුට තියා සතෙකුටවත් පාවිච්චි කරන්න පුළුවන් මට්ටමක තිබුණෙ නෑ. මුළු ගමේම කුඹුරුවලින්, ගමේ ඉස්කෝලෙන්, ගෙවල්වලින් විතරක් නෙවෙයි ආපනශාලාවලිනුත් පිටකරපු රසායනික ද්‍රව්‍ය, මළමුත්‍රා සේරම ටික එකතු වුණේ මේ ළිඳට. ඒ විතරක් නෙවෙයි වැස්ස දවසට උල්දිය ටිකත් එකතු වුණාහම මුළු ළිඳම එහෙම පිටින් මඩ වගුරක්. ගමේ උදවිය නොයෙක් අවස්ථාවල වගකිව යුතු පිරිස්වලින් මේකට විසඳුමක් ඉල්ලුවත්, ඒ හැමෝගෙන්ම වගේ ලැබුණේ කඩවුණු පොරොන්දු විතරයි.

ඒ නිසාම ලබා උපන් හැටි කියලා හිත හදාගෙන, නහය වහගෙන, ඇස් පියාගෙන මේ ළිඳේ වතුර ටික බොනවා මිසක් කාටවත් ඒ වෙනුවෙන් කර කියාගන්න දෙයක් තිබුණෙ නෑ. ඒත් අන්තිමේට මේ ප්‍රශ්නෙට විසඳුමක් හොයලා දිලා මුළු ගමටම වතුර දුන්නේ ගමේ හිටපු ඇඟලුම් සේවිකාවක් වුණ අනෝමා. මේ ලියැවෙන්නේ ඒ කතාව.

**“මම පුංචි කාලේ ඉඳලම අපේ ගමට තිබුණ ලොකුම ප්‍රශ්නෙ බොන්න වතුර ටිකක් නැතිකම. අද මම දරුවො තුන්දෙනෙක්ගෙ අම්මා කෙනෙක්. ඒත් ඒ ප්‍රශ්නෙ ඒ විදියමයි. මේ ගමේ අහිංසක මිනිස්සු හැමදාමත කළගෙඩි, බාල්දි, කරේ තියාගෙන කිලෝමීටර ගණන් කකුල් ගෙවෙනකල් වතුර හොයන්න ඇවිද්දෙ හරියට කළුනික හොයන්න වගේ. ඒ වගේම මේ ප්‍රශ්නෙට විසඳුමක් ඉල්ලගෙන නොගිය තැනක් නෑ. ඒත් විසඳුමක් දෙනවා වෙනුවට වතුර මුදලාලිලා ඇවිත් අපිට සල්ලිවලට වතුර වික්කා. අන්තිමට එදවේල පිරිමහගන්න සොච්චමක් හොයාගත්තු අපි ඒක දීලා පොළොවෙන් උනන වතුර ටිකත් සල්ලිවලට ගත්තා.”**

අනතුරුව මුළු ගමටම වතුර ලබාගැනීමට හැකිවන පරිදි පොදු ළිඳක් කපන්නට ගම්මු තීරණය කළා.

**මේ ගමේ අහිංසක මිනිස්සු හැමදාමත කළගෙඩි, බාල්දි, කරේ තියාගෙන කිලෝමීටර ගණන් කකුල් ගෙවෙනකල් වතුර හොයන්න ඇවිද්දෙ හරියට කළුනික හොයන්න වගේ**

**“අන්තිමට මුළු ගමම එකතු වෙලා ළිඳක් කපාගත්තා. ඒත් අපේ අවාසනාව කොච්චරද කියනවා නම් ඒ ළිඳේ වතුර ටික පාවිච්චි කරන්නත් අපිට පින නැතුව ගියා. කුඹුරුවල රසායනික සේරම වතුරත් එක්ක එකතු වුණා. ගමේ ඉස්කෝලේ මළමුත්‍රා විතරක් නෙවෙයි, කුණු කාණුවලින් ගහගෙන එන අපද්‍රව්‍යත් සේරම එකතු වුණේ ළිඳට. අන්තිමට ගමේ මිනිස්සුන්ට බලාගෙන ඉන්නකොට වකුගඩු රෝග හැදෙන්න පටන්ගත්තා. සමහරුන්ට වතුරෙන් විෂබීජ හැදිලා හොයාගන්න බැරි ලෙඩ හැදිලා මැරෙන්න වුණා. ඊටපස්සෙ පී.එච්අයි. මහත්තරු ගෙවල්වලට ඇවිල්ලා ළිඳේ වතුර පාවිච්චි කරන්න එපා කියලා කිව්වා.”**



මුළු ගමකට වතුර ලබාදෙන නළ ළිඳ

කාට කොහොම කියන්න ලේසි වුණත්, අනෝමලාගේ ගමේ අයට නම් ඒ ළිඳෙන් වතුර බොනවා ඇරෙන්න වෙන විකල්පයක් තිබුණෙ නෑ.

**“ඇත්තම කිව්වොත් අන්තිමට අපිට වතුර ටික වහ වුණා කිව්වොත් හරි. මොකද නොදැන වහ කැවෙන මිනිස්සු හිටියත් දැනගෙන වහ කන මිනිස්සු හරි අඩුයිනේ. නමුත් අපි වහ කියලා දැන දැන ඒ වතුර ටික බීලා දරුවන්ටත් අපේ අත්වලින් ඒ වතුර ටික පෙව්වා. වතුරට අසූචි එකතුවෙලා කියලා දැනගෙනම අපි ඒ වතුර බිව්වා. අන්තිමේදී මගේ අම්මටයි, තාත්තටයිත් වකුගඩු රෝගය හැදුනා. තාත්තා මැරිල ගියා. අම්මා තාමත් විඳවනවා.”**

අනෝමා රැකියාව කළේ ඇම්බවිල බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කර්මාන්තශාලාවේ. ආයතනය මගින් අඩුආදායම්ලාභීන් දහදෙනෙකුට වතුර ලබලා දෙන ව්‍යාපෘතියක් අරඹන ආරංචිය අනෝමට දැනගන්න ලැබුණේ ඔය අතරේ. තමන්ගේ වාසනාව උරගා බලන්න හිතුව නිසා ඒ වෙලාවේ අයැදුම්පත්‍රයක් පුරවලා දුන්නත් ඒ වතුර ටික ලබන්න තරම් තමන් වාසනාවන්ත වෙයි කියලා අනෝමට හීනෙකින්වත් හිතුණෙ නෑ.

**“පස්සේ ඒ ජල ව්‍යාපෘතියට සම්බන්ධ නිලධාරී මහත්තුරු මට කිව්වා මගේ ගෙදරටත් නළ ළිඳක් ලැබෙනවා කියලා. තාක්ෂණයත් එක්ක ලෝකේ මේ තරම් ඉස්සරහට යන කාලෙක නළ ළිඳක් කෙනෙකුට ඒ තරම් ලොකු නොවෙන්න පුළුවන්. ඒත් බොන්න වතුර පොදක් නැතුව විඳවපු අපිට ඒක මහමෙරකටත් වඩා වටිනවා.”**

**ගමේ අසරණ අනිත් මිනිස්සු වස මිශ්‍රවුණු වතුර ටික බීලා මැරෙද්දි මට විතරක් තනියම නළ ළිඳක් කපාගන්න හිත දුන්නේ නෑ**

අනෝමාගේ නිවෙසට නළ ළිඳක් සවි කරන දිනය උදෑවිය. තමන්ට වතුර ටික ලැබෙන එක ගැන හිතේ කොණක සතුටක් තිබුණත්, ඒ දිහා බලමින් තවමත් අපිරිසිදු වතුර රැගෙන ඒමට ළිඳට යන ගමේ උදවිය ගැන ඇයට තිබුණේ කියාගන්න බැරි දුකක්. පසුව තමන්ගේ ගෙදර මිදුලට ඇස්තමේන්තු වුණ නළ ළිඳ හැකි නම් නිවස ඉදිරියේ පාරට සවිකර දෙන ලෙසයි ඇය නිලධාරීන්ගෙන් ඉල්ලා සිටියේ.

**“ගමේ අසරණ අනිත් මිනිස්සු වස මිශ්‍රවුණු වතුර ටික බීලා මැරෙද්දි මට විතරක් තනියම නළ ළිඳක් කපාගන්න හිත දුන්නේ නෑ. පස්සේ මම ඒ ආපු මහත්තරුන්ට කිව්වා නළ ළිඳ පාරෙන් හයි කරන්න අපහසු නම් මටත් ඒ නළ ළිඳ එපා කියලා. ඊටපස්සේ ඒ අය වතුර මෝටරේ මගේ වත්තෙ හයි කරලා නළ ළිඳ මුළු ගමටම පාවිච්චි කරන්න පුළුවන් විදියට පාරෙන් හයි කරා.”**

අද වෙනකොට ඇම්බවිල ගමේ පවුල් පහනක හැටක උදවිය තමන්ගේ එදිනෙද රාජකාරි සියල්ලකටම වතුර ගෙනියන්නේ අනෝමට පින් සිද්ධ වෙන්න ලැබුණු මේ නළ ළිඳෙන්.

ඒ වෙනුවෙන් වැයවෙන විදුලි බිල පවා ඇය තනිවම ගෙවන්නේ තමන්ට මාසිකව ලැබෙන පුංචි වැටුපෙන්. ඒ ගමේ අහිංසක මිනිස්සුන්ට ඒ බරවත් දරන්න අපහසුයි කියලා ඇය හොඳකාරවම දන්න නිසා.

**“දැන් මුළු ගමේම මිනිස්සු ගේ ඉස්සරහට ඇවිල්ලා ළිඳෙන් වතුර අරන් යනවා දකිනකොට මගේ හිත පුදුමාකාර සතුටක් දැනෙනවා. ඉගෙනගන්න යන පොඩි දරුවො පවා නළ ළිඳට කට තියලා අත් දෙක පුරවලා වතුර බොනකොට මගේ ඇස් දෙකට කඳුළු උනනවා.”**

ඒ ගැන කියද්දිත් ඇගේ ඇස් කොණක රැඳුණු කඳුළු වගේම මූණේ ඇඳුණු හිනාවකුත් නොනැසී තිබුණා.

**“ගොඩක් අම්මලා වතුර පුරවගෙන යනකොට ‘අනෝමා මේ පිනෙන් උඹ මතු බුදුවෙයන් මගේ දුවේ’ කියලා කෑ ගහලා කියලා යනවා. මොකද ඒ අය මහා ලොකු බලාපොරොත්තු කරපින්නගෙන ජීවත් වුණ අය නෙවෙයි.**

**දහඩිය මහන්සියෙන් කීයක් හරි හම්බකරලා දරුවන්ට අනාගතයක් හදලා, තියෙන විදියට බත් කටක් කන මිනිස්සු. ඉතින් අද මම නිසා මුළු ගමකටම පිරිසිදු වතුර ටිකක් ලැබෙනවා. මට වෙන මොකුත් ඕනෙ නෑ. ඒක දකින වාරයන් පාසාම මගේ හිත පිරෙනවා.”**

ලිහිණි මධුෂිකා

පාඩම් අංක 18

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා. ඉතින් අද අපි සබන් හදමු.**

ස්වයං රැකියා






# ගණන් උස්සපු සබන් විකුණමුද ගෙදරම හදන්?

ඔන්න බොහොම ඉස්සර (ක්‍රි.පූ.100) රෝමයේ සපෝ (Sapo) කියලා කන්දක් තිබුණලු. මියගිය සතුන්ගේ මේදය, ගස්වල අලු, වර්ෂා ජලය එහෙම එකට සංයෝජනය වෙලාලු ඔය කන්ද හැදුනේ. මේ කන්දෙන් මැටි පිඩක් අරන් ඇඳුම්වල ගාලා සේදුවම කුණු, දූවිලි සේරම යන බව ඔය පළාතේ ජීවත් වුණ රෝම ජාතිකයින්ට තේරිලා. ඉතින් ඔවුන් දිගටම කන්දෙන් මැටි කෑලි කඩාගෙන ඔවුන්ගේ ඇඳුම් සෝදගත්තලු. ඔය Sapo කියන නම තමයි පස්සේ Soap (සබන්) වුණා කියලා කියන්නේ.

දැන් සබන්වල ගණන් හිලව් මතක් වෙනකොට අනේ අපිටත් ඔහොම සබන් කන්දක් තිබුණා නම් කියලා හිතෙනවා නේද?

මුලින්ම සබන් හදන හැටි හොයාගෙන තියෙන්නේ බැබිලෝනියන්වරුලු. පස්සේ ඉතින් ලෝකයේ බොහෝ රටවල් සබන් නිෂ්පාදනය කරන්න පටන් අරන්. හත්වැනි සියවසේදී යුරෝපය පුරාවට කළු මරණ වසංගතය පැතිරිලා. ඉතින් ඒ කාලේ අයත් ශරීරයේ වගේම ඇඳුම්වල පිරිසිදුකම ගැන හරියට හිතුවලු. හැබැයි ඉතින් සබන් පාවිච්චි කරලා පිරිසිදු වෙලා තියෙන්නේ එහෙ හිටි ධනවතුන් සහ වංශාධිපතිවරුන් විතරලු.

සමහර විට තව ටික දවසකින් අපිටත් ඔය සෙතේම උදාවෙයි. සබන්වල ගණන් වැඩි වුණා කිව් හැටියේ කට්ටිය ගෙවල්වල සබන් පොදිගහ ගත්තනේ. ඒ නිසා ඉතින් ටික දවසකින් සබන් කියන්නේ ඇහැට පේන්න නැති වෙළද භාණ්ඩයක් බවට පත්වෙයිද දන්නෙත් නැහැ.

හැබැයි රටේ ලොකු ප්‍රශ්නයක් තියෙන මේ වෙලාවෙවත් හැමදේම පිටරටින් එනකල් දත නියවන් ඉන්නේ නැතිව දේශීය නිෂ්පාදන නගාසිටුවන්න උත්සාහ කරනවා නම් ඔය ගැටලුවලට විසඳුම් ලබාගන්න අපිට පුළුවන්. සබන් නෑ... සබන් නෑ... කියන කිය ඉන්නේ නැතුව ගෙදරම සබන් ටිකක් හදලා සබන් නෑ... කිය කිය ඉන්න අයට අලෙවි කරගන්න පුළුවන්නේ.

ගෙදර හදන සබන් ඔය පිටරටින් ගෙන්වන සබන්වලට වඩා අඩු මිලට අලෙවි කරන්න පුළුවන්. ඒ නිසා මේ සබන්වලට හොඳ ඉල්ලුමක් හදාගන්න අමාරු නැති බව නම් සහතිකයි.

අපි අද ස්වයං රැකියා පාඩමෙන් සබන් හදන හැටි උගන්වන්න කල්පනා කළෙත් ඒකමයි.

සබන් හදාගන්න හරිම ලේසියි. අමාරුම වඩේ අමුද්‍රව්‍ය ටික හරියටම කිරාගන්න එක. ඒකට නම් තරාදියක් භාවිතා කරන්නම වෙනවා.

**සබන් කෑලි 120ක් හදාගන්න අවශ්‍ය අමුද්‍රව්‍ය තමයි මේ.**

**පොල්තෙල් 9kg 400g (පොල්තෙල් ලීටර වශයෙන් නොව බර අනුව කිලෝග්‍රෑම්වලින් ලබාගන්න.) ජලය 3kg 400g (බර අනුව), කෝස්ටික් සෝඩා 1kg 650g, සෝඩියම් සිලිකේට් 100g, සුවඳ ද්‍රව්‍ය 120g, අවශ්‍ය ප්‍රමාණයට වර්ණක.**








පිටකොටුවේ බංගසාල වීදියෙන් බොහොම අඩු මිල ගණන්වලට මේ අමුද්‍රව්‍ය මිලදී ගන්න පුළුවන්. තව දෙයක්, කෝස්ටික් සෝඩා කියන්නේ ප්‍රබල භාෂ්මික ද්‍රවයක්. ඒ නිසා කෝස්ටික් සෝඩා වැඩිපුර අතේ ගෑවුණොත් අත පිච්චෙන්න ඉඩ තියෙනවා. අනික මේවගෙන් ටිකක් සැර ගන්ධයක් එහෙමත් එනවා. ඒ නිසා සබන් හදනකොට අත් දෙකට රබර් ග්ලවුස් දෙකකුත්, මුව ආවරණයකුත් පැළඳගන්න අමතක කරන්න එපා.









## පියවර 1

**මුලින්ම කෝස්ටික් සෝඩා ටික වතුර එකේ දිය කරගන්න. කෝස්ටික් සෝඩා ඇලුමිනියම් භාජන එක්කත් ප්‍රතික්‍රියා කරනවා. ඒ නිසා කෝස්ටික් සෝඩා ප්ලාස්ටික් භාජනවල විතරක් දිය කරන්න. දියකරගත්තු කෝස්ටික් සෝඩා එක පැත්තකින් තියලා තෙල් ටික රත් කරගන්න. තෙල් ටික සෙන්ටිග්‍රේඩ් අංශක 80ක් දක්වා රත් කරගන්න. උෂ්ණත්වය මැනගන්න පුංචි උෂ්ණත්වමානයකුත් ඕනේ. ඒ උපකරණයත් බොහොම අඩු මුදලකට මිලදී ගන්න පුළුවන් එකක්.**

## පියවර 2

**තෙල් ටික 80C⁰ කට රත් වුණාට පස්සේ නැවතත් තෙල්වල රස්නය 60C දක්වා අඩු කරගන්න. ඊටපස්සේ තෙල් ටික ඒ උෂ්ණත්වයෙන්ම ප්ලාස්ටික් භාජනයකට දාගන්න. දැන් අර හදාගත්තු කොස්ටික් සෝඩා මිශ්‍රණයෙන් ටිකෙන් ටික මේ තෙල් එකට එකතු කර කර ලී හැන්දක් ආධාරයෙන් හොඳට මිශ්‍රණය මිශ්‍ර කරන්න. මිශ්‍රණය උකු වේගෙන එනකොට සෝඩියම් සිලිකේට්, සුවඳ ද්‍රව්‍ය වගේම වර්ණක එකතු කරගන්න.**

## පියවර 3

**මේ ටික දාලා විනාඩි 30ක් විතර මිශ්‍ර කරනකොට අතට හොඳ උකු ගතියක් දැනෙනවා. ඊටපස්සේ මේ මිශ්‍රණය සබන් අච්චුවට දාගන්න ඕනේ. ලී වලින් කොටුවට රාමුවක් හදාගන්න. ඒක කටට ලොකු ටයිල් කෑල්ලක් තියලා මැදට ඝනකම් පොලිතින් කෑල්ලක් දාලා සබන් අච්චුවක් හදාගන්න පුළුවන්.**

## පියවර 4

**දැන් සබන් ටික එක ගාණට මට්ටම් කරන්න. සුදු පාට කොළයකින් වහලා මේක කාමර උෂ්ණත්වයේ පැය තුනක් විතර තියන්න. සබන් ටික හොඳටම ඝන වුණාට පස්සේ එක ගාණට කෑලි කපාගන්න. දවස් හයක් විතර ගියාට පස්සේ මේවා අලෙවි කරන්න පුළුවන්.**

මෙහෙම හදාගන්න සබන් කැටයකට රුපියල් 90 විතර ඉඳලා මිල නියම කරන්න පුළුවන්. තව විස්තර මොනවාහරි දැනගන්න අවශ්‍ය නම් 0777162925 කියන අංකයට ඇමතුමක් දෙන්න පුළුවන්.




K.D.N.දයාරත්න
ඩේලිලයිට් සබන් නිෂ්පාදන අධිපති


සෙව්වන්දි හෙට්ටිආරච්චි

# ඔසරියක් මසාගන්නා ආකාරය







1 රූපසටහන




2 රූපසටහන




3 රූපසටහන



ප්‍රවීණ ඇඳුම් මෝස්තර නිර්මාණ පුහුණු දේශක සහ බතික් කලාව පිළිබඳව පුහුණු දේශක

**චමින්ද කුමාර**

*You tube - Smart Fashion Lanka*

පාඩම් අංක 32

### ඔසරිය සඳහා අවශ්‍ය මිම්

### ඔසරි පොට සඳහා අවශ්‍ය මිම්

**i.** වම් උරහිසේ ඉහළ ස්ථානයේ සිට දකුණු පැත්තෙන් ඉණ දක්වා ඉදිරිපසින් ඇති මිම්ම ගෙන එයට තවත් අඟල් 5ක් එකතු කර එන අගය.

**ii.** පිටුපස පැත්තෙන් වම් උරහිසේ ඉහළ ස්ථානයේ සිට බිමට ඇති දුර (අඩි උස සෙරෙප්පු භාවිතා කරන්නේ නම් ඒවා පැළඳගෙන උස මිම්ම අරගන්න)

### ඔසරි රෙද්ද සඳහා අවශ්‍ය මිම්

**i.** ඉන

**ii.** උකුල

**iii.** උස (අඩි උස සෙරෙප්පු භාවිතා කරන්නේ නම් ඒවා පැළඳගෙන උස මිම්ම අරගන්න)

### නෙරිය සඳහා අවශ්‍ය මිම්

**i.** ඉන

**ii.** උස (මෙම මිම්ම කෙනාගේ උස අනුව අඟල් 6-9ත් අතර ප්‍රමාණයක් අරගන්න)

### ඔසරි පොට කපන ආකාරය

ඉහත ඔසරි පොට සඳහා ලබාගත් මිම් දෙක එකතු කර එන සම්පූර්ණ අගයට සාරි රෙද්දෙන් කොටසක් කපා ඉවත් කරගන්න.

### ඔසරි රෙද්ද කපාගන්නා ආකාරය

**1 රූප සටහන බලන්න**

උදාහරණයක් ලෙස පහත මිම්වලට රෙද්ද කපන ආකාරය

**i.** ඉන = 30/2=15

**ii.** උකුල = 36/2=18

**iii.** උස = 40

✦ උස ගැනීමේදී බෝඩරයක් තිබෙන අවස්ථාවලදී යට සිට ඉහළට උස මිම්ම අරගන්න.

එක පලුවකට ඉහත උදාහරණයට අනුව තිබිය යුතු Darts ප්‍රමාණය

**2 රූප සටහන බලන්න**

තබන darts ප්‍රමාණය = 6 (ඊට වඩා වැඩියෙන් හෝ අඩුවෙන් තැබිය හැක)

එක පලුවක ඉනට වඩා වැඩිපුර ඇති ප්‍රමාණය = 18-15=3

පලු තුනේම වැඩිපුර ඇති ප්‍රමාණය = 3x3=9


එක dart එකකට තැබිය හැකි ප්‍රමාණය = 9/6-1 1/2

**3 රූප සටහන බලන්න**


බෝඩරය තිබෙන අවස්ථාවක උඩින් හැඩ කර කපාගන්න.

### නෙරිය කපන ආකාරය

නෙරිය කපන ක්‍රම 2කි.




4 රූපසටහන




5 රූපසටහන

**1.** රැලි කරන අවස්ථාව

**2.** ප්ලීට් කරන අවස්ථාව

### රැලි කරන අවස්ථාව

**දිග =** ඉන වට මෙන් 2 ගුණයක් අරගන්න.

**උස =** 6-9ත් අතර ගන්න.

### ප්ලීට් කරන අවස්ථාව

**දිග =** ඉන වට මෙන් 3 ගුණයක් අරගන්න.

**උස =** 6-9ත් අතර ප්‍රමාණය අරගන්න.

**4 රූප සටහන බලන්න**

බෝඩරයක් නැති අවස්ථාවක යටින් හැඩ කර සකසාගන්න.

**5 රූප සටහන බලන්න**

ප්ලීට් කරන අවස්ථාවක අඟල් 1 1/2න් 1 1/2ට ලකුණු කර ප්ලීට් කරන්න.

සමීර ගජකේෂරි කරල්
තාරුණ්‍යයේ චමත්කාරය
ලිංගික ශක්තිය වර්ධනයට සහ ස්නායු දුබලතාවයට ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම සුදුසුයි

කරල් 40 රු.500
ලිංගික රෝග පිළිබඳ සායන
බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා
(පෙ.ව. 9.00 - ප.ව. 3.00)
නොමිලේ පැවැත්වේ.
දින වෙන්කරගෙන පැමිණෙන්න.
සුගත රසායනාගාරය (පුද්) සමාගම
E-Mail: suensuherbals@gmail.com
138/6, අඟුරුවාතොට පාර, හොරණ
034-22 61 306

# ආදරය නිසා කඳුළු සැලූ මට පිහිටවූ එකම තැන

- පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා/පෙම්වතිය ලඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2022 / 2023 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රැකියා ලබාගැනීමට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට

**ක්ෂණික ඇමතුම් -0777 444908**

**බිංගිරියේ ගුරු හාමුදුරුවෝ සමග සේන මහතා 037 22 48 828**
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

**හමුවීම**
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස - 3.00 දක්වා

ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වෑවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැඟ හොරොම්බා හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

careteker
— Guru Dewa Shanthi Services —
Post Code No ' 60181
Gurugalagoda "Molawatta"
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව"
තැ. ස අංකය 60181
ගුරුගල්ගොඩ
මෝලවත්ත
හොරොම්බාව

විදේශගත අයගේ රැකියා, ගේ දොර ඕනෑම ප්‍රශ්නයක් සඳහා මුහුදෙන් එතරට බලපාන පරිදි සකසා DHL මගින් ඔබ අතට ඉක්මනින් විසඳුම්
0094 37 22 48828



ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට නොමිලේම සේවාවක් ඔබට ලබාදෙන රජයේ ලියාපදිංචි එකම ආයතනය



# ජයසිංහ මංගල සේවය
නො. 130 CD, නුවරපාර, මිරිස්වත්ත, ගම්පහ.

ශ්‍රී ලාංකික ඔබ කුමන තරාතිරමක වුවද සහකරුවෙක් හෝ සහකාරියක් බලාපොරොත්තුවෙන් දිවයිනේ කොතනක හෝ දිවයිනෙන් බැහැරව විදේශගතව සිටියද ඔබට ගැලපෙන සහකරු හෝ සහකාරියගේ තොරතුරු ඡායාරූප සහිතව ඒ මොහොතේම ඔබ අතට ලබාදීමට අපි සූදානම් !!!

දැන්ම අමතා ලියාපදිංචි වන්න
070 506 6555
076 336 33 96
033 221 57 61
රජයේ ලියාපදිංචි අංකය WK16905

ලියාපදිංචිය නොමිලේ
ඔබගේ විවාහ සිහිනය සැබෑවෙනු දකින්න අපගේ එකම ඇතුමයි.



කර්තෘ, 'ධරණී' ප්‍රවෘත්තිපත
ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත,
කොළඹ 07.

දුරකතන: 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් :
dharanee.editor@liberty.lk

දැන්වීම් :
0112 672601, 0112 672603
ෆැක්ස් : 0112 672648

බෙදාහැරීම් :
0112 127204, 0112 127210
ෆැක්ස් : 0112 455134



# ගෘහ සේවිකා ඇබෑර්තු

විදේශගතව සිට පැමිණි වෛද්‍ය යුවලකගේ කුඩා දරුවා බලාගැනීමට පමණක් වයස අවුරුදු 30-45 අතර කාන්තාවක් අවශ්‍යයි.
සිත්ගන්නා ඉහළ වැටුපක්
විදේශගත සේවය කළ අය විශේෂයි.
**076 37 61 607**



# උකස් රන් භාණ්ඩ

බේරාදී වැඩිම මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 24 - 190,000/-
කැරට් 22 - 170,000/-
කැරට් 21 - 150,000/-
කැරට් 20, 18,14, 09. රජයේ ලියාපදිංචි ආයතනයකි.
SL PROMO
**074 281 93 70**



# උකස් රත්තරං

ඔබ උකස් කළ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ
රන් පවුමකට 175000/=
**0773109112**



# මූල්‍ය බැංකු සහයක

★ දිවයිනම ආවරණය වන පරිදි බැංකු කිහිපයක පවතින පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.

වැටුප 35,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)

0702 231 694 | 0702 725 731
0718 853 997 | 0774 024 155
0712 564 715 | 0742 916 140



# බජාජ් / TVS යමහා ස්කූටර්

ඇතුළු යතුරුපැදි ලීසිං ඇති/ නැති මිලදී ගනු ලැබේ.
**0772 357 347**



# මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්

**විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.**
නැතහොත් ලිපියක් මගින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

## ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
## ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
## අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?

# මෙන්න!
එයින් මිදෙන්න නිසි මඟක්...

- අයුතු සම්බන්ධතා නැවතීම
- * නිවාස ආරක්ෂා
- * නඩුහබ දිනීමට
- * දරුඵල ලබීමට
- මත්කුඩු සහ සුරාව
- * රැකියා ලබා ගැනීමට
- * සියලු විභාග සඳහා
- * නොවිකිණෙන ඉඩම් විකිණීමට
- *විවාහ පමා අයට
- *හැරගිය අය ගෙන්වීම
- *අසාර්ථක ව්‍යාපාර දියුණුවට

# මාතර වෙද හාමුදුරුවෝ

ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යයකට
**ඇබ්බැහි වූ අයෙක් ද?**
එසේ නම් ඉන් මිදීමට අමතන්න.
වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
**අමතන්න 077 362 77 14**

**හමුවීම**
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන්
පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත **මාතර වෙද හාමුදුරුවෝ**
භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

## සොඳුරු දියණිය 'ධරණී'

අලුත් එක කොහොමද බලන්නයි මුලින් ගන්නට සිත් වුණේ
'දේවි' දුවණිය දුටුව පසුවයි නොගෙන ඉන්නට බැරි වුණේ
'වසන්තිය' එය නැවතුවත් ඔබ ගන්නමයි මට සිත් වුණේ
ලබන සඳුදා එනතුරුයි දැන් මගේ නෙතු මඟ බලන්නේ

අපේ දේ හා සමඟ මුසු කර අලුත් දේවල් එක් කරන්
මවට හා දියණියන් වටකොට දැනුම දෙයි ඔබ ඇති තරන්
සති පුරා රට තොටේ තොරතුරු එක මිටට ගෙන ගුලි කරන්
ගෙදර සිටිනා අපව දැනුවත් කරයි ධරණිය රත්තරන්

අයුක්තිය දැක නැගී ඉන්නට කියා දෙන්නේ ටෙලියේ ධරණී
සියලු දේ ගැන දැනුම ගෙන එන සොඳුරු දියණිය ඔබයි ධරණී
නව ලොවේ තතු එක් කරන් ඔබ දිනෙන් දින හැඩවෙන්න ධරණී
ඉදිරි පරපුර හා බැඳෙන්නට දිගු කලක් වැජඹෙන්න ධරණී

- **ප්‍රින්සි ඔල්ගා එස්.ද සිල්වා**
  **කන්තලේ**

## හිංසනය පිටුදකිමු

නිල් කඳු වැටිය මිහිදුම් සළුවෙන් වැසුණා
හිරිගඬු නැගෙන සුළඟින් මුළු ගත දැවුණා
සෙනෙහස පපා මවු තුරුලේ ගුලි ගැසුණා
විඳිනා දුකට පිළිසරණක් මට ලැබුණා

ලැබගෙන සැපය කුස පුරවන රජ බොජුනේ
මවු පිය එය අසා හිත සතුටින් පිරුණේ
පවුලේ සැප සතුට වෙනුවෙනි හිත නැමුණේ
මෙහෙකාරියක් වෙන්නට මගෙ පිය නැගුණේ

කියනා දෙය නොවේ කරනා විට වන්නේ
සිරමැදිරියකි මට නිවසේ හිමි වන්නේ
මැදියම සලෙලුන්ගේ සතුටට මා පිදුණේ
මේ දුක කියන්නට පිහිටක් නැත ලැබුණේ

ඇස් කන් වසා ඇත මිනිසුන් මෙහි ඉන්නේ
ලොකු මිනිසුන්ගෙ බහටයි අවනත වන්නේ
මගේ ජීවිතය සඟවා ජය පැන් බොන්නේ
මිය ගිය මා සමඟ රහසක් සැඟවෙන්නේ

- **ඉන්ද්‍රානි මාපා**
  **කහල්ල**

## සුදු දියණිය කොළඹ ගිහින්

නොඉඳුල් කිරි සුවඳ හදවත අතර තියා
දියණිය මව්පියන් සමඟින් කොළඹ ගියා
යළි එනතුරා සීයගෙ නිල් ගෙදර හොයා
ඉන්නෙමි බලාගෙන දෙරකඩ දෙනෙත අයා

දියණිය ගමේ ආ දිනවල දවස පුරා
සිතුවම් බිත්තිවල අඳිමින් අපට හොරා
ගිය පසු ඒ ලකුණු දැවටී දෙනෙත කරා
මම සැනසුනෙමි දුක මැද රැඳි සතුට දරා

දරු සෙනෙහසේ පිබිදෙන මල් කැකුලු දැක
ලොකු සම්පතකි සැනසීමක් විඳින එක
නිවසේ දමාගිය ඔබෙ පොඩි වළලු දෙක
තවමත් තිබේ ළඟ ඇස් දෙක පරිදි ක

සෙල්ලම් කරන්නට ගත් බඩු හතර වටේ
විසි කර තියෙන තැන්වල මගෙ දෙනෙත ගැටේ
ඔබ ළඟ නැතත් ඔබගේ කිරි සුවඳ කටේ
පැතිරෙන නිසා මගෙ ගේ දොර එළිය වැටේ

ජීවිතවලට ලැබුණත් කොයිතරම් සුවේ
හඳුනා මිනිස්කම යහගුණ උපන් ලොවේ
පිණි මුතු පැළඳ ගත්තොත් ඉස්තරම් බවේ
සීයට දුකක් නැහැ මගෙ රත්තරන් දුවේ

- **සේන ලියනගේ**
  **ගිනිගත්හේන**

## හන්තානේ සිහිනේ

සරසවිය රඟහලේ
රැඟුම් දී ගයන්නට
රොබොරෝසියා මලක
සුවඳ හද විඳින්නට
හන්තානේ කන්ද මැද
ලගින සඳු බලන්නට
සිහිනේ දුර ගිහිල්ලා
ආයේ නොඑනා ලෙසට

කසාවත පොරවාන
සිටින ඇහැළේ මලට
ගීතිකා ලියන්නට
වරම් නොලැබී ගොසින
හන්තාගේ කඳු මුදුන
සිඹින හිරු දකින්නට
මගේ නෙතු පින් මදිව
වැටුණි සිහිනේ බොඳව

සරසවි භූමියේ සුවඳ
අරන් එන මඳ පවන
මටත් සරසවි සුවඳ
නැවතිලා කියනවද
සරසවිය අහස යට
තටු සලන කුරුල්ලනි
හන්තාන සිහිනය තාම
මට දුරයි කියනවද

- **තාරකා මධුරංගී**
  **බණ්ඩාරවෙල**

## දස්කොන්-ප්‍රේමිලා

කන්ද උඩරට ගිනි ගොඩක මැදිවී
දේවි ප්‍රේමිලා ලසෝ තැවුලකිනී
මිතුරු දස්කොන් කවිය හද සිරවී
සුසුම් උල්පත හදවතේ උපදී

හමා එන මඳ පවනේ සිහිලැල්ලෙන්
නිවී නෙයනා හදවතේ ගිනිදැල්
වැවේ බෝගම්බර නෙලුම් මැලවී
දේවි ප්‍රේමිලා දෙසට ඇත නැමිලා

කැලේ උඩවත් සියොත් ගී මිහිරී
නොමැත දෙසවන් යුග පිනා යන්නේ
තෙපුල් බිඳකින් සවන සනසවනා
කවිය මනරම් හදවතම නිවෙනා

සරා සඳවත ගුවන් ගැබ පායා
පුරා තුන්යම දෑස නිදි නොලබා
නුරා හැඟුමින් සියොළඟම කැළඹී
පෙරා දස්කොන් දෙන්න පෙම් මදිරා

- **පුණ්‍ය ආර්.නානායක්කාර**
  **කටුගස්තොට**

## කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.

"කවි යාය"
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

සංස්කරණය - මනෝරා ප්‍රේමතිලක

## යන්නට යන්නම්

කිරියෙන් දියර වෙන් කළ හස මෙන් පවර
පිරියෙන් ගෙවූ දිවියෙන් නික්ම යන වර
උපතින් ගෙනා උරුමය මෙය නම් කවර
දුකකින් හිඳිනු කිම යම් සුතන පති හැර

- **රත්නා කොඩිකාර**
  **මහරගම**

## බැරි කල

අවතැන් නිසා යන විට තැන හොයාගෙන
මගෙ දරුවන්ගෙ තැන දුන්නට අගේ ගෙන
කිරි මව අසන පැනයකි දුක දරාගෙන
කන එක හරිද බැරි කල මා මරාගෙන

- **ආනන්ද කල්දේරා**
  **හාල්දඹුවන**

## කවි

තවම
ඉතිරිව
මගේ ළඟ

දුක්
නොලිව්
කව්වල

- **චමින්ද රොෂාන්**



## විජායී වෙත ලියමි

අඳුරු රෑ මැද නපුරු හීනෙක එදා කපු හුය පැටලුණා
විජායී තව දන්නෙ නෑ ඔබ රන් පුලින තල වැලපුණා
ජීවහත්තට දසයක් දැන් ළමිස්සියකියි දිසාලා
ඉරක් නැති ලොව ඉපදුණා වුව හඳක් යට උන් සුපිපුණා

කොහු ඇඳුණ දිරූ ඇඟ දකුණු පස පාළුවට ඇති තැන් බලා
දිසාලගෙ ඉස්කෝලෙ හාමුත් තෑගි ගෙන ගෙට ගොඩ වුණා
හදේ මලකඩ කාපු දෙරගුළු ඔහේ තිබුමට ඉඩ තියා
පොඩි උන්ට වේලක් කවන්නට කපු කටින්නට මම ගියා

විජායී මම ලිව්වේ මේකයි හිත පතුල ඉරි තැලෙනවා
රන් පුලින තල ඉවත හැරිලම ලේ කඳුළු යළි හලනවා
ක්ෂීර සයුරම කළඹගෙන ලොකු නැවක් වෙරළට ඇදෙනවා
එදා මං වගෙ දිසාලත් දැන් රතු වෙරළෙ කපු කටිනවා

- **ජයමිණී උපේක්ෂා ඩයස්**
  **බදුල්ල**

## පොඩ්ඩියේ

වරක්වත් නුඹට මව් පදවි නොදී
සැත්කම් කළ දම
හැර ගියේ
තරහින්ද පොඩ්ඩියේ

කිසිදු සමාවක් නැති
පසුතැවෙන හදවතේ
හිඳී ඔබ කොනිත්තමින්
හැමදම කොණට වී

සසර සැරිසර සරා
ඉපිද මැරි මැරි ගෙවන
සංසාරයේ
අපේ දරුවෙකු ලෙසින් ඉපිද
වරෙන් මගෙ කුස පුරා
මගෙ පුංචි පූසියේ

- **ධම්මිකා රාජගුරු**
  **කැකිරාව**




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.